# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 පෙබරවාරි 05 වන අඟහරුවාදා**
2013 பெப்ரவரி 05 செவ்வாய்க்கிழமை
Tuesday 05th February 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.49 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.49 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.49 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள் ] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2013.01.23 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, 2013.01.30 වන දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේස මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, බාඳුරාගොඩ, අංක 89 හි පදිංචි ඒ.ආර්. තිලක් අශෝක, මීරිගම, අමරතුංග මාවත, අංක 42/1 හි පදිංචි ඒ.එම්. ධම්මික අත්තනායක හා පල්ලෙවෙල, වේරගොඩ හි පදිංචි ටී.ඒ. ගාමිණී රවීන්ද්‍ර තෙන්නකෝන් යන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petition Presented, ordered to refer to the Petitions committee*

# අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, බත්තරමුල්ල නව සභා ගොඩනැගිලි සංකීර්ණයේ සැලසුම් පිළිබඳව අදාළ සැලසුම් ශිල්පීන් විසින් කරන ලද පැහැදිලි කිරීමක් අද පෙරවරු 10.30 ට ආපන ශාලාවේදී යොදාගෙන තිබෙනවා. ඒ සඳහා ගරු මන්ත්‍රීවරුන්ට සහභාගී වීම සඳහා දැනුවත් කරන බව කාරුණිකව දැනුම් දෙනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු ඒ.එම්. යූසුප්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඊයේ අපි 65 වැනි ජාතික නිදහස සමරලා අද ප්‍රථම දවසේදීම මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කරන්නට සිදුවීම ගැන මම එක පැත්තකින් කනගාටු වෙනවා. විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ ගරු සභාපතිතුමනි. එදා මේ රටේ බ්‍රිතාන්‍ය ආණ්ඩුවෙන් නිදහස ලබා ගැනීමේ අවස්ථාවේදී මේ රටේ මුස්ලිම් නායකයින්, ටී.බී. ජයා මැතිතුමන්ලා. රාජ්‍ය මන්ත්‍රණ සභාව තිබුණු අවස්ථාවේදී විමසීමක් කළා, මේ රටේ මුස්ලිම් ජනතාව වෙනුවෙන් නිදහස පිළිබඳව තමන් යම් ඉල්ලීමක් කරනවාද කියලා. ඒ අවස්ථාවේදී ජාතික හැඟීමෙන්, එතුමා පරම්පරාවෙන් ශ්‍රී ලාංකිකයෙක් නොවුණත් ලාංකිකයෙක් හැටියට එතුමා කිව්වේ, අපට කිසිම දෙයක් අවශ්‍ය නැහැ. අපට ඕනෑ වෙන්නේ, පූර්ණ නිදහස. අපේ ලාංකික ජනතාවත් එක්ක ඒ නිදහස භුක්ති විඳලා, අපේ ප්‍රශ්නවලට මැදිහත් වෙලා ඒවා විසඳගන්න පුළුවන් කියන එතුමන්ලාගේ ඒ ප්‍රකාශය මතක් කරමින් ඔබතුමාගේ මාර්ගයෙන් මතක් කරන්න ඕනෑ.

පසුගිය දිනක ජනවාරි මාසයේදී මීලාදුන් නබි උත්සවය සමයේදී නබි නායකතුමාගේ උපන් දිනය සැමරීම, අවුරුදු ගණනක් තිස්සේ අළුත්ගම විද්‍යාලයේ මුස්ලිම් ශිෂ්‍යයන් සහ සිංහල ශිෂ්‍යයෝ සහභාගී වෙලා මේ උත්සවය කරගෙන ආවා. ඒ වාගේම කළුතර විද්‍යාලය ගත්තත් එහෙමයි. පානදුර ප්‍රදේශයේ පවා මේක සමරනවා. ඉතින් මේකෙන් කාටවත් හානියක් නැහැ. උත්සවයට සූදානම් වන අවස්ථාවේදී යම්කිසි පිරිසක් ගිහිල්ලා ඒ උත්සවයේ සාමාජිකයන්ට යම් යම් ප්‍රකාශ කිරීමෙන් ඒක වළක්වන්න කටයුතු කළා. මම මතක් කරන්න ඕනෑ විශේෂයෙන්ම පාසල් තුළ මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගියොත් - ගරු ප්‍රධාන ඇමැතිතුමා අධ්‍යාපන ඇමැතිතුමා පමණක් නොවෙයි. ප්‍රදේශයේ නීතිය හා සාමය ගරු කරන ඒ වාගේම සියලුම ජාතීන්ගේ විශ්වාසය දිනා ගත්තු මහ ඇමැති කෙනෙක් හැටියට මම විශේෂයෙන් කියන්න ඕනෑ. එතුමා තුළ ජාතිවාදී හැඟීමක් නැහැ. ඒ වාගේම මම කැබිනට් මණ්ඩලය ගැනත් මතක් කරන්න ඕනෑ. ඒ වාගේම අද රටේ පැතිරී යන මේ ප්‍රශ්නය නිසා මේ තුළින් යම් යම් උදවියට පටු අදහස් ඇතිව විවිධ සංවිධාන නමින් විවිධ ප්‍රයෝජන ගන්න පුළුවන් වෙනවා. ඉන් රටේ සාමය, ගමේ සමගිය බිඳීමට හේතු වෙනවා. බේරුවල ජනතාව, බේරුවල ඉතිහාසයේ සිංහල හා මුස්ලිම් වංශයේ වංශකථා කියැවෙනවා. මුස්ලිම්වරුන්ගේ පැවැත්ම පිළිබඳව බේරුවල ඉතිහාසයේ කියැවනකොට පිංහේනෙන් තමයි පටන් ගත්තේ. එතැනින් තමයි සිංහල කාන්තාවන් එක්ක විවාහ වෙලා මේ බේරුවල තුළදී බිහි වුණු මුස්ලිම් වර්ගයා අදත් සිංහල සහෝදරයෝත් එක්ක එකට ජීවත් වෙන්නේ. මට මතකයි සිංහල ප්‍රශ්නය මතු වුණු අවස්ථාවේදී එදා බේරුවල නගරාධිපතිව හිටපු ගරු දේශමාන්‍ය අල්හාජ් බාකීර් මාකර් මැතිතුමා කිව්වේ, මේ රටේ මුස්ලිම් ජනතාවගේ භාෂාව සිංහල මව් භාෂාව කියලයි. එතුමාට බය නැතුව ප්‍රකාශ කරලා පොත් පිංචක් පවා පිළියෙල කරන්න පුළුවන් වුණා. ඒ වාගේ දීර්ඝ ඉතිහාසයක් තිබෙන රටක කිසිම ප්‍රශ්නයක් නැතුව ආපු මේ ගමන් මාර්ගය තුළදී අද අපේ සමගියට යම් යම් බාධාවල් ඇති කරන අවස්ථාවන් තිබෙනවා, කොහේදෝ අනවශ්‍ය ප්‍රශ්න මතු කරගෙන.

මම කියන්නේ නැහැ, මූලධර්මවාදීන් කොහේවත් නැතෙයි කියලා. ඉන්න පුළුවන්. නමුත් අපි ජීවත් වුණු ප්‍රදේශයේ, එදා කළුතර දිස්ත්‍රික්කයේ පළමුවැනි වතාවට ඒ වාගේම බේරුවල මුල්ම මහ මැතිවරණයේදී බාකීර් මාකර් මැතිතුමාට පුළුවන් වුණා 7% ක, 8% ක, 17% ක විතර මුස්ලිම් ජනතාව ඉන්න අවස්ථාවේදීත් එතුමාට බේරුවල අසනයේ පළමුවැනි මන්ත්‍රීවරයා වෙන්න ලැබුණේ, බෞද්ධ සිංහල ජනතාවගේ ඒ ඡන්ද ටික ලැබුණු නිසා. ඒ වාගේම මතක් කරන්න ඕනෑ. දිස්ත්‍රික් ක්‍රමයට පරිවර්තනය වුණාට පස්සේ කළුතර දිස්ත්‍රික්කයේ පළමුවැනි මන්ත්‍රීවරයා හැටියට වැඩි ඡන්ද සංඛ්‍යාවකින් ඉම්තියාස් බාකීර් මාකර් මැතිතුමාට තේරී පත් වෙන්න පුළුවන් වුණා. ඒ වාගේම පළාත් සභා ක්‍රමය තුළ බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කය නියෝජනය වනකොට මට බහුතර ජනතාවගේ ඡන්ද ප්‍රතිශතය ලබා ගෙන මන්ත්‍රීවරයෙක් හැටියට මුල් අවස්ථාවේ සිට අඛණ්ඩව පස් වැනි පළාත් සභාව දක්වා නියෝජනය කරන්න පුළුවන්කම ලැබුණා.

එහෙම නම් මේ රටේ තිබුණු සමගිය. ජාතීන් අතර තිබුණු මිත්‍රත්වය. මේ රටේ පැවැති යුද්ධයෙන් පස්සේ අපි කොහොමද ජීවත් වෙන්න ඕනෑ කියලා සාකච්ඡා කරන මොහොතක අපේ අසමගිතාවය තුළ වෙන්නේ, විශාල වෙනසක්. අපට යම් යම් අවස්ථාවලදී ඇහෙනවා. විද්‍යුත් මාධ්‍ය මගින්, රූපවාහිනිය මගින්, පත්තර මගින් අපට ඇසෙන්න ලැබෙනවා. ජාතික සමගියට බාධා වන ප්‍රකාශ. විශේෂයෙන්ම ඔබතුමාගේ මාර්ගයෙන් මෙන්න මේ ප්‍රකාශය මතක් කරන්න ඕනෑ. අපි විවිධ වැඩ සටහන් පිළිබඳව තහංචි පනවන්න පුළුවන් නම් මෙන්න මේවාට යම් තහංචියක් පනවලා සමගිය පිළිබඳව කථා කරන්න. ජනතාවගේ මිත්‍රත්වය පිළිබඳව කථා කරන්න. එවැනි වැඩ පිළිවෙළක් ගැන අපේ අවධානය යොමු වෙන්න ඕනෑ කාලය ඇවිල්ලා තිබෙනවා. අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා නීතිය හා සාමය ආරක්ෂා කරන්න. අමාත්‍යවරයෙක් හැටියට දිවුරුම් දීලා තිබෙනවා. ජනාධිපතිතුමාගේ නියෝජිතයා හැටියට ආණ්ඩුකාරතුමා ඒ සඳහා ඉන්නවා. මේ ප්‍රදේශ පාලනය වෙන්න අපේ කැබිනට් මණ්ඩලය තිබෙනවා. එහෙම නම් අපි මේ සභාව තුළ පමණක් නොව. මුළු බස්නාහිර පළාතේම එක ජාතිකයක් හැටියට ජීවත් වෙන්න, සමස්ත ලංකාවේම ආදර්ශයක් හැටියට ජීවත් වෙන්න පුළුවන් රට තුළ මෙවැනි ප්‍රශ්නයක් මතු වෙලා එක එක පුද්ගලයින්ගේ අවශ්‍යතාවයන් ඉටු කර ගන්න ගියාම මට මතක් වෙනවා 88 - 89 භීෂණය. අන්න ඒ වාගේ යුගයකට අපි යයිදෝ කියන බය තිබෙන නිසා තමයි මේ ප්‍රදේශයේ ඉපදිලා, මේ ප්‍රදේශයේ ජීවත් වෙලා, මේ ප්‍රදේශයේ මහජන නියෝජිතයෙක් හැටියට මම මේ ප්‍රශ්නය ඉතාම කනගාටුවෙන් මතක් කරන්නේ. එහෙම නම් අපේ ප්‍රදේශයේ සාමය ආරක්ෂා කර ගන්න, අපේ ප්‍රදේශයේ සමගිය තහවුරු කරන්න අපි සියලු දෙනාම එකතු වෙලා කටයුතු කරගෙන යමු. 99% ක්ම මගේ ප්‍රදේශයේ බේරුවල ගත්තාම පන්සල් 57 ක් තිබෙනවා. එක ස්වාමීන් වහන්සේ කෙනෙක්වත් මේ වැඩ පිළිවෙළට එකඟතාවයක් නැහැ. එක ස්වාමීන් වහන්සේ කෙනෙක්වත් විරුද්ධව වචනයක්වත් කථා කරන්නේ නැහැ. එවැනි තත්ත්වයක් තුළ යම් යම් විෂබීජ ඇවිල්ලා ඒ තිබුණු සමගිය බිඳින්න උත්සාහ කරනවා නම්, ඒකට ඉඩ දෙන්න කටයුතු කරන්න එපැයි කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව මම ස්තූතිවන්ත වෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ මහර මැතිවරණ කොට්ඨාශය කියන්නේ, පේරු තුනකින් සමන්විත විශාල භූමි ප්‍රමාණයක් තිබෙන විශාල ආසනයක්. මහර පේරුව, නාරංවල පේරුව, උරුවල් පේරුව කියලා. ගරු සභාපතිතුමනි, ඔබතුමාත් දන්නවා, ඒ ප්‍රදේශයේ ඓතිහාසික පැරණි තත්ත්වයෙන් යුත්

ගොඩනැගිලි, විහාරස්ථාන විශාල වශයෙන් තිබෙන බව. ලක්වාසී සියලුම ජනතාව දන්නවා. මේ ස්ථානයේ අපේ මහර ආසනය නියෝජනය කරන සන්ධානයේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු වන ප්‍රදීප් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත්, දිලිප් කුමාර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාත් ඉන්නවා. එතුමන්ලාත් මේ සිද්ධිය නොදන්නවා කියන එක නොවෙයි. මම හිතන්නේ දන්නවා. මේ මෑතක, දවස් දෙක තුනක සිද්ධියක්. 65 වැනි නිදහස් උත්සවය සමරන අවස්ථාවේ ඊට ප්‍රථම දිනයේදී ඇති වුණු සිද්ධියක්. කවුරුත් දන්නවා. මහර ආසනයේ මාළිගාතැන්න කියලා ඓතිහාසික විහාරස්ථානයක් තිබෙනවා. ඒ වාගේම පිළිකුත්තුව කියලා විහාරස්ථානයක් තිබෙනවා. ඉසිගිලිකන්ද කියලා ඒ වාගේ විහාරස්ථාන ගණනාවක් තියෙනවා. මේවා ඓතිහාසික වශයෙන් වළගම්බා රජ්ජුරුවන්ගේ සමයේ ඉදි කරපු විහාරස්ථාන බව කවුරුත් දන්නවා. එහෙත් මේ ඊයේ පෙරේදා පිළිකුත්තුව රජමහ විහාරස්ථානයට ස්වාමීන් වහන්සේලා අට නමක් පැමිණිලා රාත්‍රියේ නිධන් - විවෘතව මම ප්‍රකාශ කරන්නේ. නිධන් හැරුවා කියන මතය තුළ ජනතාව පිළිකුත්තුව රජමහ විහාරස්ථානයේ සණ්ඨාරේ ගහලා දහස් ගණනක් එකතු වුණා. පොලීසිය ගෙනැල්ලා තමයි මේ ස්වාමීන් වහන්සේලාව පල්ලෙහාට ගෙනාවේ. අපට දුක ඒ ස්වාමීන් වහන්සේලා අතර ගම්පහ දිස්ත්‍රික්කයෙන්ම මහජන ඡන්දයෙන් පත් වුණු ස්වාමීන් වහන්සේ නමකුත් ඉන්නවා. මේක කවුරුත් දන්න දෙයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හෙළ උරුමයේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කවුරුත් දන්න දෙයක්. මේක පුවත්පත්වල යන්න බැහැ. මේ සම්බන්ධව කටයුතු කරපු පොලිස් නිලධාරීන් අද උතුරු - නැගෙනහිර ප්‍රදේශයට මාරු කරලා තිබෙනවා. අපේ බස්නාහිර පළාතේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයක් තිබෙනවා. අමාත්‍යතුමෙක් ඉන්නවා. ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉන්නවා. මේ සම්බන්ධව ඇහිල්ල දික් කරන්නේ, හෙළ උරුමයට බව කවුරුත් දන්නවා. එම නිසා මේ සම්බන්ධව පූර්ණ පරීක්ෂණයක් කරන්න කියන ඉල්ලීම තමයි අපි කරන්නේ. ඒ අවස්ථාවේ වාහන තුනක්, ඒ වාගේම සණ්ඨාරය නාද කරන අවස්ථාවේ ආයුධ සමග කට්ටඩියෙකුත් පැමිණිලා ඉඳලා තිබෙනවා. මේක මහර ආසනයේම ජනතාව දන්නවා. මේක නොදන්න දෙයක් නොවෙයි. එහෙම නම් මෙවැනි දේවල් මහජන ඡන්දයෙන් පත් වුණු උදවියම, ස්වාමීන් වහන්සේලාම කරනවා නම් මේක නිග්‍රහයක්. මහර මැතිවරණ කොට්ඨාශයේ අපට මේක නිග්‍රහයක්. එම නිසා මම ඉල්ලීමක් කරනවා උරුවල් පේරුවේ පිළිකුත්තුව රජමහ විහාරස්ථානයේ විහාරාධිපති මේකේ ඇත්ත නැත්ත කියනවා. ඇත්ත නැත්ත විවෘතව ප්‍රකාශ කරනවා. මේ සම්බන්ධව පූර්ණ පරීක්ෂණයක් කරලා රජයට වන අපකීර්තිය -

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා)

Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs.)

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපකීර්තියක් වෙනවා නම්, මේ සම්බන්ධව පරීක්ෂණයක් කරන්න කියලා අවංක ඉල්ලීමක් කරනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ නම සඳහන් කරමින් -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

නැහැ, නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නම කිව්වේ නැහැ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

නම සඳහන් කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නම කිව්වේ නැහැ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

විශේෂයෙන්ම -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඇමැතිතුමා අහගෙන ඉඳලා නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

වාඩි වෙන්න, වාඩි වෙන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මේ රටේ ආගමික ගැටුම් ඇති කරන්න -

[සභාවේ ඝෝෂා]

තමුන්නාන්සේලා ක්‍රිස්තියානි ආගමේ ඒවා බලා ගන්න. හාමුදුරුවන්ගේ ප්‍රශ්න අපි බලා ගන්නම්. තමුන්නාන්සේලා බුද්ධාගමේ ප්‍රශ්නවලට ඇඟිලි ගහන්න ඇවිල්ලා මේ රටේ නැති ප්‍රශ්න ඇති කරන්න එපාය කියලා තමුන්නාන්සේට කියන්න කැමැතියි. බෞද්ධයෝ -

[සභාවේ ඝෝෂා]

බලාගන්නම්. තමුන්නාන්සේලා ඒවාට ඇඟිලි ගහන්න එන්න එපා. පියතුමන්ලා වැරැදි කරනවා නම් තමුන්නාන්සේලා බලා ගන්න. හාමුදුරුවරු -

[සභාවේ ඝෝෂා]

මේ රටේ බෞද්ධයෝ 70% ක් ඉන්නවා කියන එක තමුන්නාන්සේට මතක් කරන්න ඕනෑ.

**ගරු යූ. ජෝර් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

ස්වාමීන් වහන්සේලාට චෝදනා කළේ නැහැ. අපට ආරක්ෂක අංශයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම විවාද කරන්න දෙන්න බැහැ.

**ගරු යූ. ජෝර් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ආරක්ෂක අංශයෙන් මට කථා කළාම කිච්චේ භාවනාවලට ගියා කියලා. හැබැයි ජනතාව කියන්නේ. මම කියන්නේ නැහැ. ඔබතුමන්ලා වැරැදියට ගන්න එපා. මමත් ආරක්ෂක අංශයේ - මේ අවලාදයට උත්තරයක් දෙන්න. මම චෝදනාවක් කළේ නැහැ.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ගරු සභාපතිතුමනි, මම නියෝජනය කරන්නේ මහර ආසනය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ඒ ගැන කථා කරන්න අයිතියක් නැහැ.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

මෙතුමාට උත්තර දෙන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම උත්තර දෙන්න බැහැ. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

මෙතුමාට උත්තර දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උත්තර දෙන්න බැහැ. සුගත් මතුගමගේ ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරීම සඳහා විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

***[නැඟී සිටියේය.]***
*[Stood.]*

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම නියෝජනය කරන්නේ මහර ආසනය. දිලිප් කුමාර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාත් මේ අවස්ථාවේ මෙතැන නැහැ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාත් එක කාල වකවානුවක අපේ ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා වෙලා හිටියා. මට කියන්න තියෙන්නේ මෙපමණයි. ඒ සිද්ධිය සම්බන්ධයෙන් මේ වනකොට නීත්‍යානුකූලව පරීක්ෂණ සිද්ධ වෙනවා. මෙතැනදී (බාධා කිරීම්) දේශපාලන පක්ෂ අවශ්‍ය නැහැ. මොන තත්ත්වයේ වුණත් ඒකට අවසානයේ නීතියෙන් උත්තර දෙනකල් ඔබතුමන්ලා ඉවසගෙන ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කළේ නැහැ. වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***

*[Expunged on the order of the chair]*

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් මේ සම්බන්ධව ප්‍රකාශයක් කරනවා කියලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. ඒවා ඔක්කෝම හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා. මේ සභාව විහිළුවක් නොවෙයි.

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මේ සිද්ධිය හෙලා දකිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාද කරන්න දෙන්න බැහැ. කරුණාකරලා වාඩි වෙන්න. ඔබතුමා කථා කරන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය දික් ගස්සන්න දෙන්න එපා. අනවශ්‍ය ප්‍රකාශ කරන්නත් එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුගත් මතුගමගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

ගරු සභාපතිතුමනි, 2012 වර්ෂයේ අගෝස්තු මාසයේ පවත්වනු ලැබූ උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල මීට දින කිහිපයකට පෙර නිකුත් කරනු ලැබුවා. මෙවර උසස් පෙළ විභාගයට පෙනී සිටි මුළු සිසුන් සංඛ්‍යාව 232,876 ක් වුණා. ඉන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන්ගේ සංඛ්‍යාව 144,745 ක්. මෙවර විශ්ව විද්‍යාල සඳහා බඳවා ගන්නේ, ඉන් 21,000 ක් පමණයි. 232,876 ක් විභාගයට පෙනී සිට 144,745 ක් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබද්දී විශ්ව විද්‍යාල සඳහා බඳවා ගනු ලබන්නේ 21,000 ක් පමණයි. ඒ අනුව මෙවර සරසවි වරම් අහිමි වන සංඛ්‍යාව 123,745 ක් වෙනවා. මේක අවාසනාවන්ත තත්ත්වයක්. විශේෂයෙන් ගරු සභාපතිතුමනි, විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන සියලු දරුවන්ට විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කිරීම මම හිතන්නේ, අපේ රජය හැටියට ලොකු වගකීමක්. ඒ වාගේම විශේෂයෙන් මෙවර උසස් පෙළ විභාගයේදී විෂයන් තුනටම A සාමාර්ථයන් ලබාගෙන සිටින සිසුන් සංඛ්‍යාව 8544 ක්. ඉන් 6471 ක් වාණිජ විෂයය ධාරාව යටතේ සමත් වෙලා තිබෙනවා. A සාමාර්ථයන් තුනක් ලබාගෙන තිබෙනවා. නමුත් විශ්ව විද්‍යාලය සඳහා ඇතුළත් කර ගනු ලබන්නේ, 5000 ක් පමණ වූ සිසුන් සංඛ්‍යාවක් පමණයි. වාණිජ විද්‍යා විෂයය ධාරාව යටතේ. ඒ අනුව වාණිජ විද්‍යා විෂයය ධාරාව යටතේ උසස් පෙළ විෂයයන් තුනටම A සාමාර්ථයන් ලැබූ ශිෂ්‍යයන්ගෙන් අවම වශයෙන් 1471 කට මෙවර සරසවි වරම් අහිමි වෙනවා. මේක ඉතාම බරපතළ තත්ත්වයක්. A සාමාර්ථයන් තුනක් තමයි ශිෂ්‍යයන්ට ලබන්න පුළුවන් ඉහළම ප්‍රතිඵලය. ඒ ඉහළම ප්‍රතිඵලය ලබාගෙනත් ශිෂ්‍යයන් 1471 කට සරසවි වරම් අහිමි වෙනවා කියන්නේ බරපතළ කාරණාවක්. කළුතර දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් ගත්තොත් ගරු සභාපතිතුමනි, කළුතර දිස්ත්‍රික්කයේ මෙවර වාණිජ අංශයෙන් උසස් පෙළ විෂයයන් තුනටම A සාමාර්ථයන් ලබා ගත්තු සිසුන් සංඛ්‍යාව 600 ක් පමණ වෙද්දී කළුතර දිස්ත්‍රික්කයෙන් වාණිජ විද්‍යා අංශය සඳහා බඳවා ගැනෙන්නේ 300 ක් පමණ වූ සංඛ්‍යාවක්. විෂයයන් තුනටම A සාමාර්ථයන් ලබා ගත්තු අයගෙන් 50% කට පමණ විශ්ව විද්‍යාල අවස්ථා නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා මගින් උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. මෙවර උසස් පෙළ විභාගයෙන් A සාමාර්ථයන් තුනක් ලැබූ සියලුම ශිෂ්‍යයන් සඳහා සරසවි වරම් ලබා දීම පිණිස ක්‍රියා මාර්ග ගන්නය කියලා. මොකද, උසස් පෙළ විෂයයන් තුනටම A සාමාර්ථයන් ගන්න මහ විශාල කැප කිරීමක් මේ දරුවෝ කරන්න ඕනෑ. පුද්ගලික ජීවිතයේ බොහෝ දේවල් කැප කරලා, සියලු විනෝදාංශ නතර කරලා, මාපිය ඥාතීන් සමග තිබෙන සම්බන්ධතා අත හැරලා, අඩුම ගණනේ පන්සලකටවත් යන්න අවස්ථාවක් නැහැ. කලා නිර්මාණයක් රස විඳින්න, ගීතයක් අහලා රස විඳින්න අවස්ථාවක් නැහැ. තමන්ට උසස් පෙළ හදාරන දරුවෝ ඉන්නවා නම්, මේ ගරු මන්ත්‍රීතුමන්ලා දන්නවා උසස් පෙළ විභාගය සමත් වෙන්න ඒ දරුවෝ මොන තරම් කැප කිරීමක් කරනවාද කියලා. විෂයයන් තුනටම A සාමාර්ථ තුනක් ලබා ගන්න නම් මහ විශාල කැප කිරීමක් ඒ දරුවෝ කරන්න ඕනෑ. නමුත් A සාමාර්ථයන් තුනක් ලබාගෙනත් විශ්ව විද්‍යාලයට යන්න අවස්ථාවක් නැත්නම් ඒක ඉතාම බරපතළ අභාග්‍යයක්. ඒ නිසා උසස් පෙළ විෂයයන් තුනටම A සාමාර්ථයන් ලබා ගන්නා වූ සියලුම දරුවන්ට විශ්ව විද්‍යාල වරම් ලබා දීම පිණිස අවධානය යොමු කරවන්නය කියන කාරණාව පිළිබඳව ඔබතුමා මගින් ගරු උසස් අධ්‍යාපන ඇමැතිතුමා වෙත යොමු කරමින් මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

# පළාත් සභාවේ කටයුතු
## PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු ජගත් අංගගේ -** අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, *"අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ අංක 02 හි සඳහන් වැඩ කටයුතු සඳහා රීති අංක 17, රීති අංක 57(1), 57(3) හා 57(5) හි විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# බස්නාහිර පළාත් සභාවේ 2013 අංක .... දරණ පෙර පාසල් ප්‍රඥප්තිය : දෙවන වර කියැවීම

WESTERN PROVINCE PROVINCIAL COUNCIL PRE-SCHOOL STATUTE , NO. ... OF 2013: SECOND READING

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාත් සභාවේ 2013 අංක ....... දරණ පෙර පාසල් ප්‍රඥප්තිය දෙවන වර කියැවීම සඳහා යළිත් සභාවට ඉදිරිපත් කරනවා."*

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*Question was tabled again.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පසුගිය පළාත් සභා රැස්වීම් දිනයේදී වැඩ කටයුතු නිම නොකළ කාර්යයක් වූ බස්නාහිර පළාත් සභාවේ 2013 අංක ........ දරණ පෙර පාසල් ප්‍රඥප්තිය පිළිබඳ වැඩ කටයුතු ආරම්භ කිරීමට දැන් අවස්ථාව ලැබී තිබෙනවා. ඒ අනුව බස්නාහිර පළාත් සභාවේ 2013 අංක ........ දරණ පෙර පාසල් ප්‍රඥප්ති කෙටුම්පතේ V වන කොටස, පෙර පාසල් සඳහා ප්‍රමිතීන් යන කොටසේ සිට ඉදිරියට සාකච්ඡා කිරීමටයි අවස්ථාව එළැඹ තිබෙන්නේ. බස්නාහිර පළාත් සභාවේ 2013 අංක ........ දරණ පෙර පාසල් ප්‍රඥප්තිය දෙවනවර කියැවීම සඳහා 2013.01.22 වැනි දින සභා රැස්වීමේ වැඩ කටයුතු සම්බන්ධවයි. ඒ අනුව මේ අවස්ථාවේ පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් වෙනවා.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***
*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

# පූර්ණ කාරක සභාව :

(ප්‍රගතිය 2013.01.22)

COMMITTEE OF THE WHOLE COUNCIL :
(PROGRESS 22.01.2013)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 12 (1) (අ) වගන්තිය,**

*"එක් දරුවකු සඳහා අවම වශයෙන් වර්ග අඩි දහයක ගොඩනැගිලි ඉඩකඩ වෙන් කර තිබීම ;"*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, පසුගිය පළාත් සභා රැස්වීමේදී සාකච්ඡා වුණු පරිදි මේ ප්‍රමිතීන් ගැන, වර්ග අඩි දහයේ සීමාව පිළිබඳව. ඒ ගැන අපි කිසිම තීරණයකට ආවේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි අපි නැවත ගත්තේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කට්ටියම බලාගෙන ඉන්නවා. ඒකයි මම මතක් කරලා දුන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, පෙර පාසල් ප්‍රමිතීන් ගැන තිබෙනවා *දරුවන් සඳහා 20 : 1 අනුපාතයට ලියාපදිංචි ගුරුවරුන් යොදා ගත යුතුයි* කියලා 12 (1) (ඌ) වගන්තියේ තියෙනවා. එතකොට ඒකේ ප්‍රශ්නයක් තිබෙනවා. එක පැත්තකින් පෙර පාසල් ගුරුවරයෙක් -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අපි 12 (1) (අ) වගන්තියේ ඉඳලා ගනිමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

12 (1) (අ) වගන්තිය සඳහා සභාවේ එකඟතාවය.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 12 (1) (අ) වගන්තියේ ප්‍රශ්නයක් තිබෙනවා. ප්‍රමිතිය ගත්තොත් ගරු සභාපතිතුමනි, කාල්ටන් එක ඇරෙන්න 90% ක් විතර, සියලුම පෙර පාසල් වහලා දාන්න වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාල්ටන් ප්‍රශ්නයක් නැහැ ගරු මන්ත්‍රීතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

උදාහරණයක් කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතැන කාල්ටන් ප්‍රශ්නයක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම උදාහරණයකට ගත්තේ.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, 2003 අංක 04 දරණ බස්නාහිර පළාත් පෙර පාසල් ප්‍රඥප්තියේ 14 (ආ) වගන්තියේ පැහැදිලිව –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, 2003 අංක 04 දරණ බස්නාහිර පළාත් පෙර පාසල් ප්‍රඥප්තියේ එක දරුවෙකුට සීමා කර තිබෙන ප්‍රමාණය වර්ග අඩි දහය. මේක ජාත්‍යන්තර ප්‍රමිතියටත්, ඒ වාගේම අනෙක් පළාත් සභා සමග කථා කරද්දිත් අපට වඩා සම්පත් අඩු ඌව වාගේ පළාත් සභාවලත් මේ ප්‍රමාණය අරගෙන තිබෙනවා. නමුත් මම විශ්වාස කරනවා ගරු සභාපතිතුමනි, අපට අධ්‍යාපනයේ වෙලා තිබෙන්නෙත් මේ වාගේ ගැටළුවක්. අපි ඉස්කෝලේ යන කාලේ Register එකේ හිටියේ දරුවෝ 30 දෙනයි. ඒක 35 වුණා. අද 41 වෙලා තිබෙනවා. පසුගිය කාලේ අපේ පෙළක් පාසල්වල එක පන්ති කාමරයක දරුවෝ 58 දෙනෙක් හිටියා. කොරිඩෝවේ දාලා ළමයින්ට ඉගැන්නුවේ. අන්තිමට පන්ති ටිකක් වැඩි කරලා ළමුන් සීමාව අඩු කළත් ඒත් 43 දක්වා අඩු වුණේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අදටත් අපට ප්‍රායෝගිකව කරන්න මොන අපහසුතා තිබුණත්, අනාගතයේදී මේ රටේ අධ්‍යාපනය යම් තැනකට ගෙන එන්න නම්, ඒ දරුවන්ට අවශ්‍ය කරන පසුබිම අපි නිර්මාණය කරන්න ඕනෑ. ඒක තමයි අපි මේ හදන්නේ. පෞද්ගලික දේවල් හිතලා මේවා කරන්න ගියොත් අසාර්ථක වෙනවා. මෙහිදී ඔබතුමන්ලා ඔය කියන සංශෝධන අපට වාසියි. අපි ආණ්ඩු පක්ෂයේ ඉන්නේ. අපට මේවා ඔක්කෝම කරන්න පුළුවන්. නමුත් අද අපි මේක කරන්නේ අපි ගැන හිතලා නොවෙයි. අනාගත දරු පරපුර ගැන හිතලා. අපි යම් කෙනෙක් මේකට ඉදිරිපත් වෙනවා නම් ඒ අවශ්‍ය සුදුසුකම් ටික මේකට දාලා කටයුතු කිරීම වඩාත් යෝග්‍යයි කියන විශ්වාසය මගේ තිබෙනවා ගරු සභාපතිතුමනි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, වර්ග අඩි දහයේ සීමාවට ඉන්න ඕනෑ ළමුන් ප්‍රමාණය පිළිබඳ තීරණයක් තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එක ළමයයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

වර්ග අඩි දහයේ ප්‍රමාණයට ඉන්න ඕනෑ –

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

වර්ග අඩි දහයට එක ළමයි. මුළු පිට්ටනියයි –

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

නැහැ, නැහැ. පිට්ටනිය නොවෙයි. Construction Area. පන්ති කාමරය.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

වර්ග අඩි දහයක් කියන්නේ සාමාන්‍යයෙන් 3 1/2 x 3 1/2 කැල්ලක්.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

පන්ති කාමරය විතරක් –

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

වර්ග අඩි දහයක් කියන්නේ ලොකු කැල්ලක් නොවෙයි ගරු මන්ත්‍රීතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මම ඔබතුමා මාර්ගයෙන් යෝජනා කරනවා. එහෙම නම්, ඒ නීතිය ක්‍රියාත්මක කරන්න පෙර පාසල්වලට කාල සීමාවක් ලබා දෙන්න කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක හරි. ඒක අපට කරන්න පුළුවන්.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. විෂයය භාර ඇමැතිතුමා කථා කරන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, අලුතෙන් ලියාපදිංචි වන පෙර පාසල්වලට මෙය අලුතින් ක්‍රියාත්මක වන පරිදිත් වර්තමානයේ අඩුපාඩුකම් තිබෙන පෙර පාසල් මේ ප්‍රමිතීන්වලට ගන්න - දැනට ක්‍රියාත්මක වන පෙර පාසල් සඳහා අපට කාල සීමාවක් දෙන්න පුළුවන්. ඒ පිළිබඳව ගැටළුවක් නැහැ ගරු සභාපතිතුමනි. මොකද, මම පෞද්ගලිකව විශ්වාස කරනවා. මේක අපි බරක් කර ගත යුතු දෙයක් නොවෙයි. රජයක් හැටියට හෝ පළාත් සභාවක් හැටියට. දැනටත් මේක ස්වයං රැකියාවක් හැටියට ඒ අය කරගෙන යනවා. අපට ඒකෙන් ලොකු සහනයක් තිබෙනවා. අපි කළ යුත්තේ, මේකේ ප්‍රමිතීන් හදලා ඒ අයට ඒ මට්ටමට එන්න උදව් කිරීම පමණයි. පඩි නඩි ගෙවන්නයි, පාලනය කරන්නයි තවත් බරක් අපි දැරිය යුතු නැහැ. නමුත් මේකේ ප්‍රමිතියක් ඇති කර ගැනීම සඳහා මේවා ගෙනැල්ලා ඒ සඳහා අවශ්‍ය කරන සහයෝගය අපි විසින් ලබා දිය යුතුයි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

පළාත් පාලන ආයතන සතු ඒවාත් තිබෙනවා. ඒකත් මතක තියා ගන්න ඕනෑ.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔව්, ඔව්. ඒවාටත් එහෙම තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එකී වගන්තිය සඳහා සභාවේ එකඟතාවය?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**12 (1) (ආ) වගන්තිය,**

*"ළමුන් විසි පහකට එක් වැසිකිළියක් බැගින් වැසිකිළි පද්ධතියක් සකස් කර තිබීම ; "*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**12 (1) (ඇ) වගන්තිය,**

*"ගොඩනැගිල්ලේ කාමර වර්ග ප්‍රමාණයෙන් 1/7 ක් වන පරිදි වාතාශ්‍රය සැපයෙන ආකාරයට සකස් කර තිබීම ; "*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**12 (1) (ඈ) වගන්තිය,**

*"ආරක්ෂිත තාප්පයකින් හෝ ආරක්ෂිත වැටකින් පෙර පාසල් භූමිය මැනවින් ආරක්ෂා කර තිබීම ; "*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**12 (1) (ඉ) වගන්තිය,**

*"අවශ්‍ය උපකරණ සහ බෙහෙත් සහිත ප්‍රථමාධාර පෙට්ටියක් පවත්වා ගෙන යාම ; "*

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

අවශ්‍ය උපකරණ යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද? අවශ්‍ය උපකරණ කියන එක තුළ මොනවා හරි Specify කරලා තිබෙනවාද?

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

එතකොට ඕනෑ, ඕනෑ දේවල් කියන්න පුළුවන් වෙනවා නේ?

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සාමාන්‍යයෙන් ප්‍රථමාධාර පෙට්ටියකට අවශ්‍ය කරන උපකරණ කියලා නේ මේකේ කියන්නේ. මේකේ තියෙන්නේ ප්‍රථමාධාර පෙට්ටියක් කියලා නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

එහෙම නම් ප්‍රථමාධාර පෙට්ටියට අවශ්‍ය උපකරණ. අවශ්‍ය උපකරණ කිව්වාම ඔන්චිල්ලාවක් කියන්න පුළුවන්. එක එක දේවල් කියන්න පුළුවන්.

***අනතුරුව, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Consequently, question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**12 (1) (ඊ) වගන්තිය,**

*"ක්‍රීඩා කිරීම සඳහා පහසුකම් තිබීම ;"*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**12 (1) (උ) වගන්තිය,**

*"පෙර පාසල් භූමිය ප්‍රසන්න පරිසරයකින් සකස් කර තිබීම හා මූලික ක්‍රීඩා උපකරණ වලින් සමන්විත වී තිබීම ;"*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**12 (1) (ඌ) වගන්තිය,**

*"දරුවන් සඳහා 20 : 1 අනුපාතයට ලියාපදිංචි ගුරුවරියන් යොදා ගෙන තිබීම ;"*

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, 20 : 1 අනුපාතයට ලියාපදිංචි ගුරුවරුන් යොදා ගැනීම කියලා තිබෙනවා. එතකොට පොඩි ප්‍රශ්නයක් එනවා. ගොඩක් කාලයක ඉඳලා තිබෙන පෙර පාසලක් ගත්තොත් සමහර වෙලාවට ඔය තිබෙන ලියාපදිංචි වීමේ සුදුසුකම් මේ ප්‍රඥප්තියෙන්ම අහුරලා තිබෙනවා. අපි හිතමු ගණන් පාස් නැති ගුරුවරයෙක් ඉන්නවා.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා අපි එතැනට යමු. මේක ගැන ඔබතුමා –

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

නැහැ එතැන්දී මේක හිර වෙනවා. ඒ කියන්නේ මේ 20 : 1 කිව්වාම ලියාපදිංචි ගුරුවරුන් නේ? සහාය ගුරුවරු නොවෙයි නේ? එතකොට ලියාපදිංචි ගුරුවරයෙක් කියලා කිව්වාම මේකේ තියෙන විධියට එයා A/L වැඩ තුනක් අරගෙන පෙර පාසල් පිළිබඳව පිළිගන්නා ලද Course එකක් කරලා ආපු පුද්ගලයෙක් වෙන්න ඕනෑ. එතකොට ළමුන් 25 දෙනෙක් ඉන්න එකකට ඒවාගේ ගුරුවරු දෙදෙනෙක් යොදවන්න ඕනෑ. මෙතැන පොඩි අඩුපාඩුවක් තිබෙනවා. අවුරුදු 15 ක් තිස්සේ පෙර පාසලක් කරගෙන එන ගුරුවරයෙක් දිහා බැලුවොත් සමහර වෙලාවට ගණන් පාස් නැහැ. හොඳට පෙර පාසල කරගෙන ඇවිල්ලා තිබෙනවා අවුරුදු 15 ක 20 ක ඉඳලා. එතකොට එයාට තව අලුත් ගුරුවරු දෙදෙනෙක් මේකට බඳවා ගන්න වෙනවා. එතකොට මේ බර පැන යන්නේ කාටද? ඒ ගුරුවරු දෙදෙනාට පඩි ගෙවන්න වෙන්නේ පෙර පාසලට. අන්තිමට දරුවාට උගන්වන්න තමයි මේ ප්‍රශ්නය එන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ගුරුවරු ලියාපදිංචි කිරීමට ඇති සුදුසුකම් පිළිබඳව මීට පසුව තිබෙනවා. එතැනදී මේක පැහැදිලි කිරීමක් කරන්න පුළුවන් අපි බලාපොරොත්තු වන කාරණාව මොකක්ද කියන එක. නමුත් මම විශ්වාස කරනවා. සාමාන්‍යයෙන් පන්ති කාමරයක කුඩා දරුවෙක් කියන්නේ, පෙර පාසල් දරුවෙක් කියන්නේ අවුරුදු 3 ත් 5 ත් අතර දරුවෙකුට. ඇඟේ මුත්‍රා කර ගන්නවා. ජරා කර ගන්නවා. මම හිතන්නේ ළමයින් 20 කට එක ගුරුවරයෙක් වාගේම එක සහායක ගුරුවරයෙකුත් මෙතැන ඉන්න ඕනෑ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු ප්‍රධාන ඇමැතිතුමනි, සහායක කථාවක් නොවෙයි. ලියාපදිංචි ගුරුවරු නේ?

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සමාවෙන්න. සාමාන්‍යයෙන් පෙර පාසලක පන්ති කාමරයක තියන්න පුළුවන් ළමුන් 20 යි. ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව. ඒ තියනකොට ළමුන් 20 ක් ඉන්නවා නම් ගුරුවරයා සහ සහායක ගුරුවරියක් ඉන්න ඕනෑ. සහායක ගුරුවරියක් කියලා කියන්නේ, කුඩා දරුවෝ පැන පැන්සල ගත්තාම අනික් දරුවාට අනින්න පුළුවන්. එතකොට ගුරුවරයා ඒකට එතැනට එනකොට දුරදිග ගිහිල්ලා තියෙන්න පුළුවන්. ඒ නිසා සහායක කෙනෙක් ඉන්න ඕනෑ. බැරි වෙලා හරි ළමුන් 21 වුණත් සුදුසුකම් තිබෙන ගුරුවරයෙක් ගන්න වෙනවා. එහෙම නැත්නම් ඒ පන්තියේ 20 සීමාව තියාගෙන යන්න ඕනෑ. බැරි වෙලාවත් 25 ක් 30 ක් වුණොත් ගුරුවරු දෙදෙනෙකුයි සහායක දෙදෙනෙකුයි ඕනෑ වෙනවා. මේ තියෙන ගැටළු ඔබතුමන්ලාට පෙන්නන්නත් මම ගෙනැල්ලා තියෙනවා. ළමයින් 20 ක් කියන්නේ මොන්ටිසෝරියකට ලොකු ගාණක්. එක ගුරුවරයෙකුට ළමයි 20 ක් බලා ගන්න හරි අමාරුයි. ළමයි චූ කර ගන්නවා. ඇගේ

කක්කි කර ගන්නවා. ඊළඟට ළමයි ගහ ගන්නවා. ළමයි කථා කරනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, මට තියෙන ප්‍රශ්නය 20 : 1 තියෙන එක නොවෙයි. මේ ලියාපදිංචි ගුරුවරියන් කියන කථාව දාපු එක. මොකද, මේ ප්‍රඥප්තිය තුළ ගුරුවරු ලොකු Standard එකකට ගෙනැල්ලා තිබෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම ඔබතුමාට කියන්නම්. ගරු මන්ත්‍රීතුමා මේක සාකච්ඡා කරද්දී මම කරන්න කිව්වේ, දැනටත් මේ මොන්ටිසෝරි තිබෙනවා. සමහර අයට අපි මේ ඉල්ලන උසස් පෙළ – ඔබතුමන්ලා සාමාන්‍ය පෙළින් ගන්න කියනවා. නමුත් අද රෝහල් කම්කරුවෙක් ගන්න සාමාන්‍ය පෙළ සමත් වෙලා තියෙන්න ඕනෑ. ඊළඟට රියැදුරෙක් ගන්න ගියත් රජයේ පහළම මට්ටමේ තනතුරකටත් සාමාන්‍ය පෙළ ඉල්ලනවා. මම නම් විශ්වාස කරන්නේ, ළමයෙකුට අධ්‍යාපනයේ මූලික අවදිය වන මොන්ටිසෝරි මට්ටම යනකොට O/L කියලා ගන්න බැහැ. මා ළඟ තිබෙනවා ඊයේ පෙරේදා මොන්ටිසෝරියක විභාගයක් තියලා, ලකුණුත් දීලා. ඒ ගුරුවරයාගේ නොදැනුවත්කම. මම කියන්නේ, අපි ඉන්න ගුරුවරුන්ට හානියක් නොවෙන්න තියෙන සුදුසුකම් බලලා ඉන්න අයට ඒ පත්වීම් දෙන්නත්, ඒ සුදුසුකම් සපුරා නැති අයට දැනට අපිත් එක්ක ලියාපදිංචි වෙලා ඉන්න අයට – අලුතින් ලියාපදිංචි වෙන්න බැහැ. දැනට ලියාපදිංචි වන අයට පුහුණුවක් දීලා, අපි ඒ අයව දැනුවත් කිරීමක් කරලා, ඒ මට්ටමෙන් විභාගයක් තියලා ඒ අයට මේ අවස්ථාව දෙන වැඩ පිළිවෙළකට අපි යනවා. දැනට ඉන්න අයගෙන් සුදුසුකම් නැති අයට. හැබැයි, සුදුසුකම් සපුරා තිබෙන අයට අපි ඒ Standard එක දෙනවා. මම හිතන්නේ, ලියාපදිංචි ගුරුවරයෙක් කියන එකට උසස් පෙළ තියෙන්න ඕනෑ. නැත්නම් ඒ ගුරුවරයාත් අපේ Time Keeper කෙනෙක් එහෙම නැත්නම් සෞඛ්‍ය කම්කරුවෙක්, පාසල් කම්කරුවෙක් මට්ටමට වැටෙනවා. ඔබතුමා O/L කියන එක හොඳයි. මොකද, එහෙම එකක් කරනවා නම් අපි පාලක පක්ෂය හැටියට කැමැතියි. අපට වැඩි දෙනෙකුට මේක Encourage කරන්න පුළුවන්. රස්සාවල් ඉල්ලගෙන එන අය මේකට දාලා දෙන්න පුළුවන්. නමුත් ඊට වඩා මේකේ Standard එක රකින්න නම්, මේ මට්ටම සුදුසුයි කියලා මම විශ්වාස කරනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

නමුත් ගරු සභාපතිතුමනි, මේකේ ප්‍රශ්නය තියෙන්නේ, ලියාපදිංචි ගුරුවරු කියන එක Standard කරන්න ගියාම – දැන් ඔබතුමා Driver කෙනෙක් කියන කථාවත් කිව්වා. මම දකින විදියට Driver කෙනෙක් කියන්නේ, ජීවිත ගණනාවක් ආරක්ෂා කරගෙන යන පුද්ගලයෙක්. ලොකු වටිනාකමක්. ඔබතුමාව පවා ආරක්ෂා කරන්නේ Driver. ඒක ලොකු වගකීමක් තිබෙන රස්සාවක්. මහ ඇමැතිතුමාව පවා ආරක්ෂා කරන්නේ Driver කෙනෙක්. එයා හප්ප ගත්තොත් එහෙම ඔක්කෝම ඉවරයි. O/L එක්ක, ඊට පස්සේ එයාට ලොකු පුහුණුවක් දෙනවා. ඒකයි වගකිව යුතු රැකියාව එයා ඒ කරන්නේ. ඒ වාගේම පෙර පාසල් ගුරුවරයෙකුගේ -

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සෞඛ්‍ය කම්කරුවෙකුගේ දෙනේනේ ඇයි?

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

එතැන පුහුණුව එන්නේ නැහැ නේ?

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සෞඛ්‍ය කම්කරුවාටත් O/L ඉල්ලන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඒ O/L + පුහුණු. සෞඛ්‍ය කම්කරුවාගේ එකයි Driver ගේ එකයි දෙකක්. එයා O/L වුණාට ලොකු පුහුණුවක් එනවා. මෝටර් රථ එලවන්න, මාර්ග නීති පිළිබඳව ලොකු පුහුණුවක් දෙනවා. මම කියන්නේ පෙර පාසල් ගුරුවරයාට පුහුණුවක් තියෙන්න ඕනෑ. අපි දැකලා තිබෙනවා – ඔබතුමා අධ්‍යාපන ඇමැතිවරයා වශයෙන් කටයුතු කරනවා. අද අධ්‍යාපනය වැටිලා තිබෙන එක ප්‍රශ්නයක් තමයි, කොපමණ විභාග පාස් වුණත් දරුවාව තේරුම් ගැනීමේ හැකියාව නැහැ. ගණන් පුළුවන්. විද්‍යාව පුළුවන්. හැබැයි දරුවාව තේරුම් ගන්න බැහැ. A/L කළා කියලා, විශ්ව විද්‍යාලේ ගියා කියලා මේක එන්නේ නැහැ. නමුත් එදා අධ්‍යාපන තත්ත්වය මීට වඩා හොඳින් තිබුණා. ඇයි? Training College තිබුණා. සියලු ගුරුවරු Training College හරහා ඇවිල්ලා පාසල් අධ්‍යාපනයට බහින්නේ. මේකට වෙනම පුහුණුවක් ඕනෑ. මම මෙතැනදී අදහස් කරන මට්ටම A/L නොවෙයි. අර පුහුණුව. ඒ කියන්නේ O/L කරන පුද්ගලයා O/L කරලා ඉවර වෙලා එයා – ගණිතය පාස් ඇතුළු විෂයයන් ගණනක් දුන්නාට කමක් නැහැ. හැබැයි මනෝ විද්‍යාව ඇතුළු දරුවාව තේරුම් ගැනීමේ හැකියාව තිබෙන පුහුණුවක් දෙන්න ඕනෑ.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, ඒ වාගේ පුහුණුවක් දෙන්නත් සාමාන්‍ය පෙළ වැඩ තුන හතරක් සමත් වුණු කෙනෙකුට ඒ වාගේ එකක් කරන්න බැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**

Hon. Ajith Mannaperuma

එතැන අපි හිර කරමු.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම කියන්නේ ඒකයි. අඩු ගණනේ උසස් පෙළ පන්තියට - ඔබතුමා කියන දේමයි. දැන් උපාධිධාරීන් ඉන්නවා, පන්ති කාමරයට ගිහිල්ලා උගන්වන්න බැරි අය අපි දැකලා තියෙනවා. ඒක කාරණාවක් විතරයි. නමුත් බහුතරය එහෙම නැහැ. මම මෙතැනදී කියන්නේ, අපි ගුරුවරයාගේ Standard එක වැඩි කළේ නැත්නම් මේ මොන්ටිසෝරි ටික - එහෙම නම් අපට O/L ඕනෑත් නැහැ. හැකියාව තියෙනවා නම් පුහුණු වීමක් දීලා ඕනෑම කෙනෙකුට දෙන්න කියලා යෝජනාවක් ගේන්න පුළුවන්. අපේ පියන්ලා ඉන්නවා අට සමත් අය. සාමාන්‍යයෙන් තැනකට ගිහිල්ලා උපාධිධාරියෙකුට වඩා යමක් කර ගන්න පුළුවන්. ඒක නිර්ණායකයක් හැටියට හඳුනා ගන්න බැහැ. ඒක නිසා මම කිව්වේ හැම තිස්සේම A/L Simple පාස් තුනක් තිබුණත් ඇති. O/L වැඩ හයක් සමත් වෙලා A/L, S තුනක් ගන්නවා කියන්නේ, ඒ පුද්ගලයාගේ ඉගෙන ගන්න තිබෙන හැකියාව ඉහළ මට්ටමක තිබෙනවා. ඒ වාගේ කෙනෙක් පුහුණුවක් දීලා ගන්නකොට ඒ අයගේ කාලය දීර්ඝ වෙනවා. අද ඕනෑ තරම් උසස් පෙළ කරපු දරුවෝ ඉන්නවා, මේ වාගේ දේවල්වලට යන්න. එතකොට ඒ දරුවෝ බලනවා O/L අය ගන්න තනතුරකටද අපි මේ යන්නේ කියලා. ඊට වඩා Standard එකෙන් කරන්න, මොකද ජාත්‍යන්තර වුණත් අපේ O/L සමත් අයගෙන් ගත්තා කිව්වොත් ඒක පිළි ගැනීමක් වෙන්නේ නැහැ. මේ අය S තුනක් එක්ක උසස් පෙළ සමත් වෙලා - කොහොමටත් පුහුණුවීම් වැඩ සටහන් තියනවා. ඉස්සරහාට යනකොට පුහුණුවීම් පාඨමාලා අපි කරනවා. A/L ළමයෙකුට වුණත් අපි ඒ පුහුණුව දෙන්න ඕනෑ. ඔබතුමා කියනවා වාගේ Counceling, Child Psychology. ඒ වාගේ දේවල් පිළිබඳව යම් අවබෝධයක් දෙන්න ඕනෑ. ඒකට යන්න අඩු ගාණේ ආරම්භය මේකෙන් පටන් ගන්න ඕනෑ. ඔබතුමන්ලා අපි හිතුවාට අද මේක ගෙනාවා කියලා හෙට ඉඳලා මේක පටන් ගන්න බැහැ. අපි අද කරන දෙයි ප්‍රතිඵල එන්නේ තව අවුරුදු හතර පහකින්. ඒක නිසා අද ගැන හිතලා, මේ ඉන්න අය ගැන හිතලා තීන්දු ගන්න එපා කියන එක මම ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, අපි ඉස්සෙල්ලාම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි මේ පිළිබඳව දීර්ඝව සාකච්ඡා කළා. VII වැනි කාරණාවට අයිති විෂයයක් අපි මේ දැන් කථා කරන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඉස්සෙල්ලා අපි තේරුම් ගත යුතුයි පෙර පාසල කියන්නේ මොකක්ද කියන එක. පෙර පාසල කියන්නේ, මාරියා මොන්ටිසෝරි කියන වෛද්‍යවරිය සමාජයේ කොන් වුණු පුද්ගලයන් සමාජගත කරන්න ආරම්භ කරපු ක්‍රමය. නැතුව බෙහෙත් දීලාවත් වෙන මොනවාත් නොවෙයි. සමාජගත කරන්න ආරම්භ කරපු ක්‍රමය තමයි පෙර පාසල. මාරියා මොන්ටිසෝරි කියන වෛද්‍යවරිය. එතකොට ඒකේ ඕනෑ වෙලා තිබුණේ කොන් වුණු, මුළු වුණු කට්ටිය සමාජගත කරන්න. නැතුව ඒ අයට උගන්වන්න නොවෙයි. ඒ අයට දැනුම දෙන්න නොවෙයි ඕනෑ වෙලා තිබුණේ. ඒ අයව සමාජගත කරන්න. සමාජයේ මට පුළුවන් කියන හැඟීම තුළ පාසලට යන්න පුළුවන් පුද්ගලයෙක් නිර්මාණය කරන්නයි අවශ්‍යතාවය තිබුණේ. එතකොට ඔබතුමා දන්නවා. පෙර පාසලක ගුරුවරයෙකුට ගෙවන පඩිය රුපියල් 5000/- යි. එතකොට A/L පාස් වුණු අය කවදාවත් පෙර පාසල් ගුරුවරයෙක් වෙන්නේ නැහැ. පෙර පාසල් ගුරුවරයාගේ පඩිය රුපියල් 5000/- ට වඩා නැතුණොත් පෙර පාසල් අසාර්ථක වෙනවා. මොකද, දෙමව්පියන්ට තමයි මේක ගෙවන්න වෙන්නේ. පෙර පාසල කියන එක අනිවාර්ය දෙයක් වෙලා නැහැ. ළමයෙකුට පෙර පාසල් නොගියා කියලා පාසලට ඇතුළත් කිරීමේ හැකියාව තිබෙනවා. එහෙම නම් පෙර පාසල කියලා කියන්නේ, ළමයාගේ ආකල්ප සංවර්ධනය කරන භූමියක්. එහිදී ගුරුවරයාට අපි ඕනෑවට වඩා නිර්ණායක දාලා බොහොම ඉහළ තත්ත්වයේ ගුරුවරයෙක් හදන්න ගියොත් වෙන්නේ මේ පෙර පාසල් ක්‍රමය කඩාගෙන වැටීමයි. අපි මතක තියා ගන්න ඕනෑ මේක තවත් ඉස්කෝලයක් නොවෙයි. මේක විශ්ව විද්‍යාලයක් නොවෙයි. මේක ළමයාගේ ආකල්ප සංවර්ධනය කරන මධ්‍යස්ථානයක්. ඒ නිසා A/L පාස් වෙලා කියලා ලොකු ගුරුවරයෙක් ගන්න ගියොත් වෙන්නේ ගරු ප්‍රධාන ඇමැතිතුමනි, මේ පෙර පාසල් ක්‍රමය කඩාගෙන වැටීමයි.

අපි දකිනවා ගම්වල සාර්ථකව පෙර පාසල් තිබෙනවා. සමහර වෙලාවට ගණිතය සමත් නැහැ. ඔබතුමා කියනවා වාගේ අවුරුදු 10 ක් 15 ක් පැරණි පෙර පාසල් සඳහා - O/L ගණිතය පාස් නැති අය පවා අවුරුදු 15 ක් කරගෙන ආවා නම් එයාට ඉඩ දෙන්න වෙනවා. එහෙම නම් අලුතෙන් ගන්න කෙනා අපි A/L වලටම හිර කරන්න ගියොත් - O/L කියන්නේ සාමාන්‍ය විභාගයක්. තරග විභාගයක් නොවෙයි. ඕනෑම කෙනෙක් විභාගය පාස් වුණාට තරගයක් නැහැ. පාස් වෙන විභාගයක්. මේකේ අපි ගණිතයත් එක්ක වැඩ පහක් හයක් ඕනෑ තරම් දැම්මාට කමක් නැහැ. අපි A/L වලට යන්නේ විෂයය නිර්දේශයක් නම් කරගෙන. අපි ජීව විද්‍යාව කරනවාද? වෛද්‍යවරයෙක් වෙන්න යනවාද? එහෙම නැත්නම් ඉංජිනේරුවෙක් වෙන්න යනවාද? එහෙම නැත්නම් Accountant කෙනෙක් වෙන්න යනවාද? එහෙම නැත්නම්

ප්‍රාදේශීය ලේකම්වරයෙක් වෙන්න යනවාද? O/L වලින් පස්සේ ඒ වාගේ අපි විෂයය පථයක් තිර්ණය කර ගන්නවා. Bio ද, Maths ද, Commerce ද, Arts ද කියලා අපි විෂයය පථයක් නිර්ණය කර ගන්නවා. එතකොට ඒ විෂයය නිර්ණය කරනවා නම්, A/L හා කියනවා නම් නිර්ණය කරන විෂයය පථයට මොන්ටිසෝරි කියන එකත් තියන්න වෙනවා. නමුත් ඉංජිනේරුවෙක් වෙන්න යන පුද්ගලයාට, නැත්නම් වෛද්‍යවරයෙක් වෙන්න යන පුද්ගලයාට ඒක කර ගන්න බැරි වුණා, ලකුණු මදී වුණා කියලා එතැන එය සුදුසුකමක් කරන්න හොඳ නැහැ. ඒ නිසා මම විශේෂයෙන්ම කියන්නේ ගරු සභාපතිතුමනි, සභාවේ අවධානයට ලක් කරන්න ඕනෑ පෙර පාසල කියන එක ළමයාගේ ආකල්ප සංවර්ධනය කරන මධ්‍යස්ථානයක්. O/L වලින් පස්සේ ඒ ළමයාට යන්න දෙන්න පෙර පාසලේ ඉගෙන ගැනීමේ අවස්ථාවක් වෙන්න. පිළිගත යුතු ඩිප්ලෝමා පාඨමාලාවක් හොඳයි. වෛද්‍යවරයෙක් වෙන්න යන්නේ O/L වලින් පස්සේ. ඉංජිනේරුවෙක් වෙන්න යන්නේ ඒ පාරෙන් පස්සේ. හැබැයි, පෙර පාසල් සඳහාත් O/L වලින් පස්සේ College එකකට යන්න අවස්ථාව දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ ප්‍රකාශය පැහැදිලියි.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඒ නිසා පෙර පාසල ගුරුවරයා ලියාපදිංචි ගුරුවරයා කියලා නම් කළාම පවතින පෙර පාසල ලොකු අපහසුතාවයකට පත් වෙනවා. ඒ විතරක් නොවෙයි. මේ නිසා දෙමව්පියෝ ලොකු අපහසුතාවයකට පත් වෙනවා. ලියාපදිංචි ගුරුවරයෙක් කියන එක පොඩ්ඩක් -

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, අවාසනාවට අජිත් මාන්නප්පෙරුම ගරු මන්ත්‍රීතුමාගේ අදහසට මට එකඟ වෙන්න බැහැ. එතුමාත් එකඟ වෙයි මේ කරුණු පැහැදිලි කළාම. ගරු සභාපතිතුමනි, උසස් පෙළ විෂයය නිර්දේශයේ වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, නීතිඥයන්, ගණකාධිකාරීවරුන් බිහි කරන ආකාරයේ විෂයය නිර්දේශයක් බව ඇත්ත. එය සිද්ධ වෙන්නේ විෂයය නිර්දේශයේ ඉහළින් සමත් වන අයට. ජීව විද්‍යා විෂයය නිර්දේශය ඉගෙන ගන්නට උසස් පෙළට යන හැම කෙනාම වෛද්‍යවරු වෙලා අවසන් වෙන්නේ නැහැ. ගණකාධිකාරී විෂයය මාලාව කරන හැමෝම ගණකාධිකාරීවරුන් වෙන්නේ නැහැ. ඒ නිසා රජය තල තුනකින් රජයට නිලධාරීන් බඳවා ගන්නවා. සාමාන්‍ය පෙළ සමත් අය කම්කරු මට්ටමෙන් බඳවා ගන්නවා. ඊළඟට උසස් පෙළ S තුනක් ගත්තු අය ලිපිකරු මට්ටමින් බඳවා ගන්නවා. අද ලිපිකරු ශ්‍රේණිය හඳුන්වන්නේ, කළමනාකරණ සහකාර විධියට. ඔබතුමා මතු කරපු තර්කය කළමනාකරණ සහකරුවන්ට යෙදුවොත් වෛද්‍යවරු වෙන්න හදපු අය කළමනාකරණ සහකාර වෙලා ඉන්නවා. ඉංජිනේරුවෝ වෙන්න හදපු කට්ටිය කළමනාකරණ සහකාර වෙලා ඉන්නවා. නීතිඥයන්, ගණකාධිකාරීවරුන් වෙන්න හදපු අය අද කළමනාකරණ සහකරුවන් වෙලා ඉන්නවා. මෙතැනදී අපි කරලා තිබෙන්නේ උපාධියක් තිබෙන අය මාණ්ඩලික නිලධාරීන් විධියට රජයට බඳවා ගන්නවා. උසස් පෙළ සමත් අය ලිපිකරු ශ්‍රේණියට බඳවා ගන්නවා. සාමාන්‍ය පෙළ සමත් අය කම්කරු ශ්‍රේණියට බඳවා ගන්නවා. ඊළඟට මතු වන ප්‍රශ්නය තමයි ගරු සභාපතිතුමනි, පෙර පාසල් ගුරුවරිය තබන්නේ මාණ්ඩලික නිලධාරී මට්ටමේද, ලිපිකරු මට්ටමේද, කම්කරු මට්ටමේද? අජිත් මාන්නප්පෙරුම ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන්නේ කම්කරු මට්ටමේ තැබිය යුතුයි කියලා. පුංචි දරුවාගේ අධ්‍යාපනය නිවසක් නම් ගරු සභාපතිතුමනි, එහි පදනම, නැත්නම් Foundation එක තමයි ළදරු පාසල. ළමයෙක් හැදනෙවාද නැද්ද? උගතෙක් වෙනවාද නැද්ද කියලා තීරණය වෙන්නේ, අධ්‍යාපනයේ රසය දෙන්නේ, නිර්මාණශීලී හැකියාව මුවහත් තබන්නේ මේ පෙර පාසලේදී. මා නම් විශ්වාස කරන්නේ, පෙර පාසල් ගුරුවරයා තමයි දක්ෂම ගුරුවරයා විය යුත්තේ. උසස් පෙළට ඉගැන්නුවේ නැති වුණොත් තනියෙන් ඉගෙන ගත හැකියි. මේ මල හරියට පරිණතව හදා ගන්න නම් මටසිළුටු මලක් සංයමයෙන් හසුරුවන්න පුළුවන් කෙනෙක් ඉන්න ඕනෑ. ඒ නිසා පළාත් සභාව විධියට තීරණය කරලා තිබෙනවා, මම හිතන්නේ ආචර්ය උපාධිය තිබෙන අයට පුංචි දරුවෝ භාර දෙන්න පුළුවන් නම් වඩා හොඳයි. නමුත් අපි තීරණය කරලා තිබෙනවා, පෙර පාසල් ගුරුවරයා කම්කරුවාගේ මට්ටමමේ නොවෙයි. ලිපිකරුවාගේ මට්ටමේ සිටින කෙනෙක් විය යුතුයි කියලා. මොකද, කුඩා දරුවා බලා ගන්නවා කියන එක මහ ඇමැතිතුමාගේ වාහනය එළවනවාටත් වඩා අමාරු වැඩක්. මොකද, ඒ දරුවාගේ අනාගතය තීරණය කරන්නේ - ගරු මහ ඇමැතිතුමාගේ රියැදුරා වාහනය ගෙනියන්නේ, මහ ඇමැතිතුමාගේ උපදෙස් මත. නමුත් අර කුඩා දරුවන්ගේ උපදෙස් මත නොවෙයි ළදරු පාසලේ ගුරුවරිය පන්තිය කරන්නේ. ඒ නිසා ළදරු පාසල් ගුරුවරයාගේ යම් අධ්‍යාපන මට්ටමක් තිබිය යුතුයි. එය කම්කරු මට්ටමට ඇද දැමීම ළදරු පාසල් ක්‍රමය පිළිබඳව අපි වැඩිහිටියන් විධියට අවතක්සේරු කිරීමක් විධියටයි මා දකින්නේ. ඒ නිසා මේ යෝජනාව ඇත්තෙන්ම දරුවන්ගේ නාමයෙක් කළ යුතු දෙයක් විධියටයි මා දකින්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා දිගින් දිගටම -

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, උත්තර දෙන්න එපැයි. අවස්ථාවක් තිබෙන්න ඕනෑ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නතර කරන්න උත්සාහ කිරීම නොවෙයි. සාකච්ඡා කරලා මේවායේ යම්කිසි ප්‍රතිඵල දෙන තීරණයකට එන එක තමයි වඩා වැදගත් වෙන්නේ. මෙතුමාගේ අදහසට පොඩි ඌණ පූරණයක් කරන්න කැමැතියි. මොකද, එතුමා කියපු විධියට ඉස්සර අට පාස් අය තමයි කම්කරු ශ්‍රේණියට බඳවා ගත්තේ. දැන් තමයි ඒ තලය ටිකක් උසස් කරලා තියෙන්නේ. හැබැයි, අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ කරන කෙනෙක් මෙවැනි අවම වැටුපකට සීමා වෙනවාද කියන එක පිළිබඳව ප්‍රශ්නයක් අපට තිබෙනවා. මොකද, එතැනින් එහාට උසස් පෙළ කරපු කෙනෙකුට ලැබෙන වැටුපයි, සාමාන්‍ය පෙර පාසල් ගුරුවරයෙකුට හෝ ගුරුවරියකට ලැබෙන වැටුපයි අතර විශාල පරස්පරයක් තිබෙනවා. ඒ නිසා එතැනදී විශාල ගැටළුවකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මේ නීතිය ක්‍රියාත්මක වෙලා කාලාන්තරයක් යද්දී පෙර පාසල් නැති වෙලා යන තත්ත්වයකට පත් වෙන්න පුළුවන්.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා එතරම් පල්ලෙහායින් හිතනවා කියලා මම හිතුවේ නැහැ. නමුත් ඇත්තට අපි දකිනවා. පළමුවැනි දේ එතුමා කියනවා, කම්කරුවන්ද පෙර පාසල් ගුරුවරු හදන්න යන්නේ කියලා. එහෙම නම් අපේ Technical College තියෙන්නේ මොනවාටද? O/L Results අනුව තමයි Quantity Surveyors තෝරන්නේ. එහෙම නම් Technical College එකේ හදන්නේ කම්කරුවෝද? ගරු ඇමැතිතුමාගෙන් අහනවා Technical College එකේ හදන්නේ කම්කරුවෝද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න අවශ්‍ය නැහැ. ඔබතුමා අදහස් ප්‍රකාශ කරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

අපි කියන්නේ O/L විභාගෙන් පස්සේ එයා විෂයය ක්ෂේත්‍රයක් තුළ දුවනවා. ඒ වාගේම O/L විභාගය කියන්නේ, ඊට පස්සේ යම් විෂය පථයක් තෝරා ගන්න ශිෂ්‍යයා යන්නේ. එහෙම නම් O/L විභාගයෙන් පස්සේ - මම කියන්නේ නැහැ O/L පාස් වුණු ගමන් පෙර පාසල් ගුරුවරයෙක් කරන්න කියලා. නමුත් O/L පාස් වුණාට පස්සේ එයාට විධිමත් පුහුණුවක් ලබා දීලා පිළිගන්නා ලද -

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඒකට එකඟයි ගරු සභාපතිතුමනි.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

අන්න ඒක තමයි අපි මෙච්චර වෙලා කිව්වේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඒ කියන්නේ සාමාන්‍ය පෙළ ප්‍රතිඵල මත නොවෙයි. සාමාන්‍ය පෙළ සමත් වෙලා,

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

විධිමත් පුහුණුවක්.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

මොන්ටිසෝරි ගුරු විභාගය ලියලා පිළිගත් වෘත්තීය පාඨමාලාවක් සම්පූර්ණ කළාම ඒක වෙනස්. අපි ඒකට එකඟයි.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඒක තමයි මම කියන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අද ඉන්න පෙර පාසල් ගුරුවරියෝ - කලින් අම්මා පෙර පාසලක ගුරුවරියෙක් වෙලා ඉඳලා පස්සේ දරුවන්ව ඒකට අනුයුක්ත කරලා තියෙන්නේ. බොහෝ වෙලාවට සමීක්ෂණයක් කළොත් අපට හොඳ දත්තයන් සොයා ගන්න පුළුවන්. අම්මාගෙන් පස්සේ දුව තමයි පෙර පාසල පවත්වාගෙන යන්නේ. මොකද, ඒක පළපුරුද්ද.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මෙතුමාගේ කාරණාවේදී මම එකඟ වෙන්නේ, අපි සාමාන්‍ය පෙළ ප්‍රතිඵල යම් List එකක් ගන්නවා වැඩ හයක් සමත් වෙලා, ඊළඟට මේ විෂයයට අදාළ ඩිප්ලෝමා එකක් හරි මොකක් හරි පුහුණුවක් ගත්තු කෙනෙක් කියන එක. මම දන්නේ නැහැ සභාව එකඟ නම් –

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

විද්‍යා පීඨ තුනක් ඇති කරලා ඒ පුහුණුව, ඩිප්ලෝමාව ලබා දෙන්න –

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඒකට අපි එකඟයි.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා

Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ එතැනට අපි යනවා. දැනට අපි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හත්වැනි කාරණාව.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මෙතුමා කියපු 20 : 1 අනුපාතයට ලියාපදිංචි ගුරුවරුන් කියපු එකේ ගැටළුවක් නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

එතකොට අතන ලිහිල් කරන්න වෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අපි එතැනට යනකොට හදමු.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නයක් තිබෙනවා. අපේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා කිව්වා පළාත් සභාවේ විද්‍යා පීඨයක් ඇති කරලා ඒකෙන් සමත් වන කියලා. නමුත් City & Guild වාගේ, NVQ වාගේ ගොඩක් තැන්වල පුද්ගලිකව කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, ගරු සභාපතිතුමනි, මේක හදන්නේ මූලික -

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

පිළිගන්නා ලද.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පෞද්ගලික අංශයේ -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ප්‍රමිතියෙන් යුක්ත සහතික තිබෙන ඒවා පිළිගන්නවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අපි මෙතැන අද කථා කරන්නේ, ප්‍රඥප්තියේ මූලික හරය විතරයි. නමුත් රීති සකස් වනකොට අප මොකක්ද ගන්න ඕනෑ සීමාව කියලා කථා කරගන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

12 (1) (ඌ) වගන්තිය පිළිබඳව සභාවේ එකඟතාව?

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් වචනයක් කියන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, පෙර පාසල් ගුරුවරයාත් ගුරුවරයෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එතැනට එමු ගරු මන්ත්‍රීතුමා. මේ වගන්තිය සම්මත කරලා එතැනට එමු. ඒක VII කොටසේ තිබෙනවා. එතකොට අවස්ථාව ලබා දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

12 (1) (ඌ) වගන්තිය පිළිබඳව සභාවේ එකඟතාව?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**12 (1) (එ) වගන්තිය,**

*"ප්‍රමාණවත් ලී බඩු උපකරණ තිබීම සහ ඒවා දරුවන්ගේ මානසික ප්‍රබෝධයට ඉවහල් වන ආකාරයට ප්‍රසන්න පෙනුමකින් පවත්වාගෙන යාම ;"*

**12 (1) (ඒ) වගන්තිය,**

*"ආගමික වතාවත් කිරීමට සුදුසු ස්ථානයක් සකස් කර තිබීම ;"*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**12 (2) වගන්තිය,**

*"හානිකර හෝ අන්තරාදායක පරිසරයක් තුළ හෝ එවන් ස්ථානයක සිට මීටර් 100 ක් ඇතුළත ප්‍රදේශය තුළ හෝ පෙර පාසලක් ස්ථාපනය නොකළ යුතුය. "*

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, එතකොට මේක අනික් පැත්තට යන්නේ නැද්ද? අපි දැන් පෙර පාසලක් දැම්මාට පස්සේ මේ වාගේ එකක් දැම්මොත් එහෙම. අපි හිතමු කුකුල් මස් කඩයක් දාන්න අනුමැතියක් ගන්න ඕනෑ නැහැ නේ? මේකේ -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඒකටත් අනුමැතියක් ගන්න ඕනෑ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

අනුමැතිය ගන්න ඕනෑ. නමුත් ඒකට පෙර පාසලක් තිබෙනවා කියන එක බලපානවාද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

එහෙම ප්‍රශ්නයක් තිබෙනවා. මේ අහන්නේ පෙර පාසල දැම්මාට පස්සේ -

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

අපි හිතමු Cargills Food City එක දැම්මා කියලා. ඒක මස් විකුණන තැනක්. මේකේ අන්තරාදායක කියන එක හඳුන්වලා තිබෙනවා මස් විකිණීම කියන එකත්.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, ඒකේ ප්‍රමාණයක් තිබෙනවා. මීටර් 100 ක් කියලා.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒක වළවක්වන්න අපි මොකක් හරි ප්‍රමිතියක් දාන්න ඕනෑ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

එහෙම නැත්නම් පළාත් පාලන ආයතන දැනුවත් කරන්න ඕනෑ පෙර පාසලක් අවට මේ වාගේ කර්මාන්ත දාන්න බැහැයි කියලා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මේක නීතියක් බවට පත් වුණාට පස්සේ පළාත් පාලන ආයතනයේ වගකීමක් වෙනවා මේක ආරක්ෂා කිරීම.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

අපි දැනුම් දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එකී වගන්තියට සභාවේ එකඟතාවය?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී මෙම සභාව පෙරවරු තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.41 ට යළිත් රැස්විය.***
*Sitting, accordingly suspened untill 11.41 a.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**VI කොටස, පෙර පාසල් ලියාපදිංචි කිරීම : ප්‍රඥප්ති කෙටුම්පතේ 13 වගන්තිය,**

*"මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට පළාත තුළ ලියාපදිංචි කරනු නොලැබූ පෙර පාසලක් පවත්වා ගෙන යාම නොකළ යුතුය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 14 (1) වගන්තිය,**

*"2003 අංක 4 දරණ පෙර පාසල් ප්‍රඥප්තිය යටතේ දැනටමත් ලියාපදිංචි කර ඇති පෙර පාසලක් නැවත ලියාපදිංචි කිරීම අවශ්‍ය නොවන අතර ලියාපදිංචි නොකළ පෙර පාසලක් මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා මාස හතරක සහන කාලයක් ලබා දෙනු ලැබේ."*

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමා එම වගන්තියේ ප්‍රශ්නයක් තිබෙනවා. කලින් 2003 අංක 04 ප්‍රඥප්තියට අනුව සමහර පෙර පාසල් තිබෙනවා, දීර්ඝ කාලයක සිට කරගෙන ආපු ඒවා. නමුත් ලියාපදිංචි කරන්න බැරි වෙලා තිබෙනවා. 2013 ට අවුරුදු 10 කට පෙර සිට කරගෙන ආපු පෙර පාසලක් තිබෙනවා නම් අර ගුරුවරු ලියාපදිංචි කිරීම නැතුව එයාට යන්න පුළුවන්. සමහර වෙලාවට ගණිතය පාස් නැති ගුරුවරු ඉන්නවා අවුරුදු 10 ක් 15 ක් තිස්සේ ඉඳලා. පන්සල්වල එහෙම හොඳට පෙර පාසල කරගෙන ආපු ඒවා තිබෙනවා. අන්න ඒ අය අපහසුතාවයට පත් වෙන්නේ නැති විධියට එතැන පොඩ්ඩක් වෙනස් කරන්න පුළුවන් නම් හොඳයි.

ඒ ප්‍රඥප්තියෙන් ලියාපදිංචි වුණා නොවෙයි. 2003 සිට අවුරුදු 10 ට එහා හරි කරගෙන එන පෙර පාසලක් ලියාපදිංචි කිරීමේ හැකියාව දෙන්න පුළුවන් නම් හොඳයි.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

2003 කියන්නේ අවුරුදු 10 ක්.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

2003 අංක 4 ප්‍රඥප්තිය තියෙනවා නේ? අපි හිතමු අවුරුදු –

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක ලියාපදිංචි කරලා තිබෙනවා නම් නැවත ලියාපදිංචි කරන්න ඕනෑ නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගණිතය පාස්ද, අරවාද මේවා කියලා ප්‍රශ්නයක් නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. ඒක තව පස්සට එන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

අපට ගම්වල එන ප්‍රශ්නයක් තමයි මේ ප්‍රඥප්තිය නිසා අනාදිමත් කාලයක සිට කරගෙන ආපු පෙර පාසල් ලියාපදිංචි කිරීම –

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, ගරු මන්ත්‍රීතුමා ලියාපදිංචි වෙලා තිබෙන එකත් ආයිත් කරන්න ඕනෑ නැහැයි කියන එකයි මේ කියන්නේ. එතකොට 2003 ඉඳලා මේ වනකොට 99% ක්ම ලියාපදිංචි කරලා. එතකොට ආයිත් කළ යුතු නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගිය ප්‍රඥප්තිය තුළ හිර වුණා. ආදි කාලේ පෙර පාසල් ලියාපදිංචි කර ගන්න බැරි තත්ත්වයට පත් වුණා. දැන් මම දන්න පෙර පාසල් තිබෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අර ගුරුවරයා සම්බන්ධව නේ?

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඔව්. ප්‍රශ්නය නිසා –

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක තව පල්ලෙහාට එනකොට නිවැරැදි වෙනවා නේ? මේකට අදාළ වෙන්නේ –

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

Release කරන්න ඕනෑ නැද්ද?

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, අවශ්‍ය නැහැ. ලියාපදිංචි කිරීමට මාස හතරක සහන කාලයක් දෙනවා කියලා දෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

එතකොට අවුරුදු 10 කට පෙර ඉන්න අයත් Release කරන විධියක් අපි හදන්න ඕනෑ.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අපි එතැනට එනකොට කථා කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

14 (1) වගන්තියට සභාවේ එකඟතාවය?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 14 (2) වගන්තිය,**

*"මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව අළුතින් ආරම්භ කරන පෙර පාසලක් පිහිටුවා මාස හතරක් ඇතුළත ලියාපදිංචි කිරීම කළ යුතුය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 15 වගන්තිය,**

*"ඉහත 14 (1), (2) උප වගන්ති යටතේ ලියාපදිංචි කිරීමට අපොහොසත් වූ කිසියම් පෙර පාසලක් මාස හය (6) ක් ඇතුළත යුක්ති සහගත හා සාධාරණ හේතු සහිතව ලියාපදිංචිය සඳහා ඉල්ලීමක් කළහොත් ඉකුත් වූ කාලයට අමතර ගාස්තුවක් ලෙස ලියාපදිංචි ගාස්තුවට අමතරව 50% ක දඩ මුදලක් ද සහිතව ලියාපදිංචි කිරීමට අධ්‍යක්‍ෂවරයාට බලය ඇත්තේය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 16 වගන්තිය,**

*"ලියාපදිංචි වීම සඳහා අයදුම්කරු විසින් නියමිත ලියාදිංචි ගාස්තුව ගෙවිය යුතුය."*

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. කසාද බඳිනවා වාගේ ගාණ වැඩි කළොත් එහෙම. ඒකට සීමා නිර්ණයක් දෙන්න බැරිද?

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, රීති හදනකොට ඒවා කථා කරන්න පුළුවන්. තාම මූලික ගෙවීම ගැන කථා කරන්නේ. රීති සහ නීති සකස් කිරීමේදී ඒක කරන්න පුළුවන්.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 17 වගන්තිය,**

*"මෙම ප්‍රඥප්තියේ විධිවිධාන කඩ කරමින් පෙර පාසලක් ආරම්භ කරන්න හෝ පෙර පාසලක් පවත්වා ගෙන යනු ලබන තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 18 වගන්තිය,**

*"මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විට පෙර පාසල් නමින් හෝ වෙනත් නමකින් පවත්වා ගෙන යනු ලබන කිසියම් ආයතනයක් ප්‍රඥප්තියේ විධිවිධාන පරිදි ලියාපදිංචි කිරීම සඳහා ව්‍යවසායකයා විසින් අධ්‍යක්‍ෂවරයා වෙත ලිඛිත ඉල්ලීමක් කරනු ලැබූ විට එම ඉල්ලීම මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූල නොවේ නම්, අධ්‍යක්‍ෂවරයා විසින් ඒ පිළිබඳ හේතු දක්වා ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ හැකිය."*

**18 (1) වගන්තිය,**

*"එවැනි ඉල්ලීමක් කරනු ලබන සෑම අවස්ථාවකදීම එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතුව ඉල්ලීම කරනු ලැබූ දින සිට ලිත් මාසයක් ඇතුළත එම ඉල්ලීම කරනු ලැබූ ව්‍යවසායකයාට දැන්විය යුතුය."*

**18 (2) වගන්තිය,**

*"එවැනි ප්‍රතික්ෂේප කිරීමක් සිදු වූ අවස්ථාවකදී එකී ව්‍යවසායකයා විසින් ඒ සම්බන්ධයෙන් ලිත් මාසයක් ඇතුළත විෂයභාර අමාත්‍යවරයා වෙත අභියාචනයක් කළ හැකිය."*

**18 (3) වගන්තිය,**

*"එවැනි අභියාචනයක් ලද විට අමාත්‍යවරයා එය උපදේශක කමිටුවට යොමු කර නිරීක්ෂණ හා නිර්දේශ ලබා ගෙන ලිත් මාස තුනක් ඇතුළත තම තීරණය අභියාචක වෙත ලබා දිය යුතුය."*

**18 (4) වගන්තිය,**

*"මේ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ගනු ලබන තීරණ අවසානාත්මක හා තීරණාත්මක වන්නේය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 19 (1) වගන්තිය,**

*"මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින වන විට පෙර පාසලක් වශයෙන් පවත්වා ගෙන ගොස් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනෙන් පසු ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුව ලියාපදිංචි කරන ලද්දා වූ ද ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනෙන් පසු ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුව අලුතින් පිහිටුවා ලියාපදිංචි කරන ලද්දා වූ ද පෙර පාසල් සම්බන්ධ ලේඛනයක් පෙර පාසල් අධ්‍යක්‍ෂ විසින් පවත්වා ගෙන යා යුතුය."*

**19 (2) වගන්තිය,**

*"ලියාපදිංචි සෑම පෙර පාසලකටම අධ්‍යක්‍ෂවරයා විසින් අංකයක් සහ සහතිකයක් ලබා දිය යුතුය."*

**19 (3) වගන්තිය,**

*"ලියාපදිංචි කරන ලද පෙර පාසලක් ප්‍රඥප්තියේ විධිවිධාන අනුව පවත්වා ගෙන නොයන්නේ නම්, එවැනි පෙර පාසලක ලියාපදිංචිය අවලංගු කිරීමට අධ්‍යක්ෂවරයාට බලය ඇත්තේය."*

**19 (4) වගන්තිය,**

*"ලියාපදිංචි කරන ලද පෙර පාසලක ව්‍යවසායකයා පෙර පාසල් සම්බන්ධ කටයුත්තකදී අධිකරණයක් විසින් දෙන ලද තීන්දුවක් මත වරදකට වරදකරු කර තිබේ නම්, එවැනි පෙර පාසලක ලියාපදිංචිය අවලංගු කිරීමට අධ්‍යක්ෂවරයාට බලය ඇත්තේය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**VII කොටස, පෙර පාසල් ගුරුවරියන් ලියාපදිංචි කිරීම : ප්‍රඥප්ති කෙටුම්පතේ 20 වගන්තිය,**

*"2003 අංක 04 දරණ පෙර පාසල් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමට පෙර සිට සේවය කරනු ලැබ දැනට ලියාපදිංචි වී ඇති පෙර පාසල් ගුරුවරියන් හැර මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක දින වන විට පෙර පාසල් ගුරුවරියන් ලෙස කටයුතු කරන තැනැත්තන් සහ පෙර පාසල් ගුරුවරියන් ලෙස කටයුතු කිරීමට අපේක්ෂා කරන තැනැත්තන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් මව් භාෂාවට සම්මාන සහිතව ගණිතය ඇතුළු විෂයන් හයකින් සමත් වීම සහ අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් එකවර විෂයයන් තුනකින් සමත් විය යුතු අතර උපදේශක කමිටුව විසින් පිළිගනු ලබන පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ එක් අවුරුද්දකට නොඅඩු පුහුණු පාඨමාලාවක් හදාරා තිබිය යුතුය. "*

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

එතකොට අරක ඉවත් කරන්න වෙනවා. සමත් වීම සහ පිළිගත් පාඨමාලා සහතිකයක් කියලා සංශෝධනය කරන්න වෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ විධියට සංශෝධනය කරන්න පුළුවන්. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් මව් භාෂාවට සම්මාන සහිතව ගණිතය ඇතුළු විෂයන් හයකින් සමත් වීම හා පිළිගත් පෙර පාසල් පුහුණුවක් හෝ ඩිප්ලෝමාවක් –

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

කමිටුව පිළිගත් කියලා දැම්මත් කමක් නැහැ. දැන් කමිටුවක් පත් කරනවා නේ? පිළිගන්නේ කවුද කියන එක පිළිබඳව ප්‍රශ්නයක් තියෙනවා නේද?

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

පිළිගත්තු එක මොකක්ද කියලා තීන්දු කරන්න ඕනෑ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

කවුද පිළිගන්නේ කියන එක.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

පිළිගත්තු එක මොකක්ද කියලා. අපි තීන්දු කරන්න ඕනෑ අපි පිළිගත්තු එක මොකක්ද කියලා. අපි ඒක කමිටුවට දෙමු තීන්දු කර ගන්න. කමිටුව පිළිගත් ආයතනයකින් ඩිප්ලෝමාවක් හෝ පුහුණුවක් ලබා ගත් පසු කියලා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

කමිටුව පිළිගත් කියලා දැම්මාම හරි.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ඒකේ එක. ඒක උසස් පෙළ විෂයයන් තුන සමත් එක්කෙනාට අර පුහුණුව හා ඩිප්ලෝමාව ඕනෑ වෙන්නේ නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඒක වැඩක් වෙන්නේ නැහැ. ගරු මහ ඇමැතිතුමා, පුහුණුව හා ඩිප්ලෝමාව ඕනෑ.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. නැහැ. ඒක register කරන්න ඕනෑ නැහැ. එයාට A/L වැඩ තුනක් තිබෙනවා නම් –

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

අද අපි දැකලා තිබෙනවා,

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා

Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, පුහුණුව ගැන පස්සේ කියැවෙනවා. ලියාපදිංචි කිරීම සඳහායි අපි මේ කථා කරන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

එතකොට එයා Qualified වෙලා නැහැ නේ? A/L විභාගයෙන් විෂයයන් තුන සමත් වුණා කියලා එයා පෙර පාසලක් කරන්න Qualified වෙලා නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පුහුණු කරලා -

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

කළාට කමක් නැහැ. නමුත් වර්තමානයේ Qualified නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, අපි මෙතැන කියන්නේ සුදුසුකම A/L තිබෙනවා නම්, ඒ ළමයා ඉහළ මට්ටමක එක්කෙනෙක්. ඊට වඩා පහළ මට්ටමක කෙනෙකුයි, A/L තිබෙන කෙනෙකුයි සම්බන්ධ කරද්දී අර අතිරේක පුහුණුව එයාගේ සහතික බලලා කරන්න පුළුවන්. අපේ ඊළඟට පල්ලෙහාට යනවා. පුහුණුවීම් වැඩ සටහන් කරනවා. ඒවාට සම්බන්ධ වෙන්න ඕනැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු මහ ඇමැතිතුමා, ඒක වැරැදියි. මම දකින විධියට ඔබතුමා ඒ හිතන විධිය. අපි කියන්නේ A/L කරපු එක්කෙනා ඉහළ මට්ටමේ පුද්ගලයෙක් කියන්නේ මොන විෂයයටද කියන එක ප්‍රශ්නයක් වෙනවා. දැන් එයා Driver කෙනෙකුට සුදුසු නැහැ නේ, Driver ලයිසන් එක නැත්නම්. දැන් A/L පාස් වුණා, විශ්ව විද්‍යාලයේ ගියා කියලා එයාට Driver කෙනෙක් වෙන්න බැහැ. Driving ලයිසන් එක තිබෙන්න ඕනැ. මම කියන්නේ අරයට, එයා වෙන විෂයය පථයක නේ යන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ලියාපදිංචි ගුරවරයෙක් හැටියට ලියාපදිංචි කරන්න. පල්ලෙහාට යන කොට ඔබතුමාට මෙය තේරෙනවා. දැන් මූලික අධ්‍යාපන සුදුසුකම තමයි නේ මේ බලන්නේ. මූලික අධ්‍යාපන සුදුසුකම උසස් පෙළින් හෝ සාමාන්‍ය පෙළ වැඩ හයකුයි, ඩිප්ලෝමාවක් හෝ පිළිගත් පුහුණුවීමක් තිබෙන කෙනෙක්. එතකොට අර දෙක සම කරන්න තමයි අරක ගන්න වෙන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු මහ ඇමැතිමනි, දැන් අපි හිතමුකෝ A/L එස් තුන තිබෙන ළමයෙක් කෙළින්ම පෙර පාසලක උගන්වන්න පුළුවන් ගුරුවරයෙක් විධියට ලියාපදිංචි වෙනවා. ඒක ප්‍රමාණවත් නැහැයි කියලා මම කියන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මෙහි පිටුපස තිබෙනවා. දැන් අපේ ආයතනයෙන් කරන විභාගවලට නොවෙයි, අපි අතන දාන්නේ. අපි කියමුකෝ ඩිප්ලෝමා එකක්. මොන්ටිසෝරියක්. Psychology කරපු කෙනෙකුට O/L තිබෙනවා නම්, එයාට අපි දෙනවා ලියාපදිංචි කරන්න අවස්ථාවක්.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගුරුවරයෙක් වශයෙන් උගන්වන්න පුළුවන්.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

පුළුවන්. ඒ වාගේම A/L සමත් වෙලා තිබෙනවා නම්, එයාට දෙනවා. මේ එක්කෙනෙක්වත් ඉන්න අයට සුදුසුකමක්වත්, A/L වත් නොවෙයි නේ. ඒ කෙනෙකුටත් ඒ අවස්ථාව දෙනවා. හැබැයි,

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

නැහැ. එයාට ගුරුවරයෙක් වෙන්න බැහැ නේ?

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ දෙන්නාම අපේ ආයතන මට්ටමෙන් පුහුණුවීම්වල යෙදෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු මහ ඇමැතිතුමා, අපි කියන්නේ -

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මට ඔබතුමා කියන දේ තේරෙනවා. අරයා A/L කළාට එයා පුහුණු වීමක් ලබලා නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

එයාට ගුරුවරයෙක් වෙන්න බැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔව්. දැනටත් මෙහෙම එකක් නැහැ. එහෙමනම් අපට අතට ගන්නත් බැහැ. අපි දැන් O/L යි, A/L යි සම කරන්න හදන්නේ -

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

මම කියන්නේ මෙතැනදී A/L අවශ්‍ය - A/L කියන කථාවක් නැහැ. මේකට ඕනෑ පුහුණුව. දරුවෙක්ව -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

A/L කරපු අයටත් පුහුණුවක් දෙමු.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නවය වසර කරපු අයටත් කරන්න පුළුවන් -

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

නැහැ. නැහැ. පුහුණුව අවශ්‍යයි. ගණිතය, විද්‍යාව, සිංහල තිබෙන්න ඕනෑ. නැත්නම් තමන්ගේ මව් භාෂාව දන්නේ නැත්නම් -

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමන්ලාම කියපු විධියට තමන්ගේ අම්මා මොන්ටිසෝරියක් කරනවා. උසස් පෙළ වැඩ තුනක් සමත් ළමයෙක් ඉන්නවා. ඒ ළමයා අර මොන්ටිසෝරියේ වැඩ කරනවා. ඒ කෙනෙකුට මේකට එන්න අවස්ථාව -

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

එතකොට ඔබතුමා ඒ කරන මොන්ටිසෝරිය, පුහුණුව ලැබිය යුතු ආයතනයක් ලෙස නම් කරන්න වෙනවා. එතකොට කමිටුව පිළිගන්න ඕනෑ. ඒ පෙර පාසලේ පුහුණුවීම පිළිගන්නවා කියන එක. දැන් අපි කිව්වා නේ පුහුණුවක් පිළිගන්න පුළුවන් කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. නැහැ. ඒ O/L තිබෙන අයට තමයි, O/L වැඩ හය සමත් කෙනෙකුට - දැන් අර ගරු ඇමැතිතුමා කිව්වේ, අපි මෙයාව තියන්නේ උපාධිධාරී මට්ටමේද? එහෙම නැත්නම් කළමනාකරණ, ලිපිකරු මට්ටමේද? කම්කරු මට්ටමේද? කම්කරුවන්ට ගන්නේ O/L. එතකොට අපි ඒකේ පොඩ්ඩක් එයාව එතැනින් උඩට ගන්න තමයි අර පුහුණුවීම හෝ ඩිප්ලෝමාව කියලා අරගෙන එයාව උඩින් තියන්නේ. උසස් පෙළ එක්කෙනා ලිපිකරු ශ්‍රේණියට එනවා. එතකොට එයාව කෙලින්ම එතැන තියන්න පුළුවන්.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

මම කියන්නේ ගරු මහ ඇමැතිතුමා, දැන් එතකොට මේ සභාව ලැහැස්ති වෙනවා O/L කරලා, පෙර පාසල් ඩිප්ලෝමාවක් කරපු එක සමානයි A/L විෂයයන් තුනක් පාස් වීම කියන එකට.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, ඒ ළමයාට අපි දෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

අපි හිතන්නේ ඒක. ඒක වෙන්න බැහැ නේ? ඒක වෙන්න බැහැ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, එහෙමනම් A/L ලියාපදිංචි කරලා එයාට කාලසීමාවක් දෙන්න ඕනෑ වසර තුනක් ඇතුළත හෝ වසර දෙකක් ඇතුළත මේ ඩිප්ලෝමාව හදාරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

අන්න එහෙම ආවාට කමක් නැහැ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

එතකොට තමයි එයා මූලික සුදුසුකම් සපුරන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

එයාට Register වෙන්න පුළුවන්. වසරක් තුළ ඩිප්ලෝමාව සම්පූර්ණ කළ යුතුයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඒ සංශෝධනය හරියටම පැහැදිලි කරලා කිව්වා නම් හරි.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි,මේකේ තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා.

*“ .....................ගණිතය ඇතුළු විෂයයන් හයකින් සමත්වීම සහ අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් එකවර විෂයන් තුනකින් සමත් විය යුතු අතර උපදේශක කමිටුව විසින් පිළිගනු ලබන පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ එක් අවුරුද්දකට නොඅඩු පුහුණු පාඨමාලාවක් හදාරා තිබිය යුතුය.”*

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඒක දෙකටම අයිතියි නේ. මේකේ තිබෙන්නේ දැන් -

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මේකේ තිබෙන්නේ A/L අයට විතරයි. O/L වැඩ හයක් සමත් වෙලා, A/L සමත් වෙලා මේ පුහුණුවත් ඕනෑය කියන එකයි මේකේ කියන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඔව්.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

දැන් අපි කියන්නේ, A/L අයටත් මේක යන විධියටයි. අරගොල්ලනුත් ඒක ගන්නවාය කියන -

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඒ කියන්නේ, O/L එක්කෙනාටත්. මේක O/L Plus අර පුහුණුව.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

දැන් එහෙම වුණොත් O/L එක්කෙනාවයි, A/L එක්කෙනාවයි අපි එකතැන තියනවා. එහෙමනම් මේ අධ්‍යාපන සුදුසුකම O/L කරන්න ඕනෑ. එහෙම කරන්න බැහැ. එහෙම කරන්න ගියොත් ගැටලුවක් වෙනවා. අපි එහෙමනම් A/L කරපු අයට අපේ ආයතනයේ පුහුණුවක් දෙන විධියට අපි මෙතැන හදාගන්න ඕනෑ. ඒක අපි රීතිවලින් හදන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, සංශෝධනය පොඩ්ඩක් පැහැදිලිව කිව්වා නම් හොඳයි. මොකද හැන්සාඩ් වාර්තාව සඳහා.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

*"............... ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් මව් භාෂාවට සම්මාන සහිතව ගණිතය ඇතුළු විෂයන් හයකින් සමත්වීම හා කමිටුව පිළිගත් ආයතනයක ඩිප්ලෝමාවක් තිබිය යුතුයි."*

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

මූලිකව ලියාපදිංචි වන අවස්ථාවේදී එයාට ඒක තිබෙන්න ඕනෑ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඩිප්ලෝමාවක්ද? පාඨමාලාවක්ද?

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

පාඨමාලාවක් වෙන්නේ නැහැ. පාඨමාලාව අතනට නේ යන්නේ. ඩිප්ලෝමාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඩිප්ලෝමාව.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ඊළඟට දෙවැනි එක. අර විෂයයන්ම දාලා ඒකේ අනික් එකට මේ ටික හරි ගරු සභාපතිතුමනි. අනික් ටිකට මව් භාෂාවට සම්මාන සහිතව, ඒක දාලා උසස් පෙළ කරලා අර පුහුණුව ලබා දෙන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඒ වාගේම ගරු මහ ඇමැතිතුමා, අවුරුදු 15 කට ඉස්සෙල්ලා මොන්ටිසෝරිය පටන් ගත්තු කෙනෙක් ඉන්නවා. ගණිතයත් නැහැ. අර කියන සුදුසුකම් නැති කෙනාව Release කරන විධියකුත් එන්න ඕනෑ. අවුරුදු 15 ක් තිස්සේ එයා කරගෙන ආපු. දැන් අලුතෙන් දෙන්න බැහැ. අන්න එතැනට මොකක් හරි එන්න වෙනවා.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

යම් කාලසීමාවක්.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

මේ ප්‍රඥප්තිය අනුමත කිරීමට අවුරුදු 15 කට පෙර එයා පිළිගත් මොන්ටිසෝරියක ගුරුවරයෙක් ලෙස කටයුතු කර ඇත්නම්, ලියාපදිංචි පෙර පාසලක ගුරුවරයෙක් ලෙස කටයුතු කර ඇත්නම් -

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

ආපහු ලියාපදිංචි වෙන්නේ නැහැ නේ ?

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

එතැන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මම දන්නවා. පන්සල්වල පවත්වන පෙර පාසල් තිබෙනවා. අවුරුදු 15 ක්, 20 ක්, 30 ක්

විතර තිස්සේ ඉඳන් ගුරුවරයා කරගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ කාලයේ එයා ගණන් පාස් නැහැ. ඒ කියන්නේ, මේ ප්‍රඥප්තිය නිසා එයාට පෙර පාසල කරගන්න බැරි තත්ත්වයක් පත්වෙලා තිබෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේක අලුත් අයට. මෙතැන එහෙමනම් තව ඡේදයක් එන්න ඕනෑ ලියපදිංචි නොවී – අපි කියමු අවුරුදු 05 ක් හෝ –

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

15 කට –

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අවුරුදු 10 කට ඉහත දී ආරම්භ කරලා මේ වන විට ලියාපදිංචි වෙලා නැත්නම් අවශ්‍ය සුදුසුකම් මේ අනුව සපිරෙන්නේ නැත්නම් ඒ අය සඳහා කමිටුව විසින් පිළිගත් ක්‍රමවේදයක් ලබා දීමට කටයුතු කරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ලබා දීලා ලියාපදිංචි කළ යුතුයි.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

එතකොට කමිටුව තමයි තීන්දු කරන්නේ. ඒ අය ගෙන්නලා අපේ පුහුණුව මොකක්ද? එහෙම කියලා කමිටුවට ඒ වගකීම භාර දෙනවා. අවුරුදු 10 කට ප්‍රථම ආරම්භ කරලා මේ වනතුරුත් පවත්වාගෙන යන ගුරුවරයෙක් වේ නම් ඒ අය මේකට ඇතුළත් කරලා – මූලික සුදුසුකම් සපුරලා නොමැති නම් ඒ අය සඳහා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

පාසල නොවෙයි. ගුරුවරයා.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගුරුවරයා. ඒ ගුරුවරයාට කමිටුව මඟින් විභාගයක් තියලා –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට පැහැදිලියි නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

හරි. ඒක හරි. එතකොට ඔක්කෝමලා ආවරණය වෙනවා නේ.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒකත් කරන්න බැරි කෙනා අයින් වෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ එකඟතාවය.

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***
*Question, as amended was put and adopted*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 21 (1) වගන්තිය**

*"ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන තැනැත්තන් ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව සුදුසුකම් සපුරා ඇත්නම් ලියාපදිංචි කළ යුතු අතර හැඳුනුම්පතක් ද නිකුත් කළ යුතුය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 21 (2) වගන්තිය**

*"පෙර පාසල් ගුරුවරියක ලෙස ලියාපදිංචි වී ඇති තැනැත්තෙකු ප්‍රඥප්තියේ විධිවිධාන අනුව සුදුසුකම් සපුරා නොමැති නම් හෝ අධිකරණයක් විසින් දෙන ලද තීන්දුවක් මත අපරාධ වරදකට වරදකරු කර තිබේ නම් එම පෙර පාසල් ගුරුවරියගේ ලියාපදිංචිය අවලංගු කිරීමට අධ්‍යක්ෂවරයාට බලය ඇත්තේය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 21 (3) වගන්තිය**

*"ලියාපදිංචි වීම සඳහා පෙර පාසල් ගුරුවරියන් විසින් නියමිත ගාස්තුවක් ගෙවිය යුතුය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**VIII කොටස. වැරදි හා දණ්ඩන. ප්‍රඥප්ති කෙටුම්පතේ 22 (1) (අ) වගන්තිය**

*"මෙම ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ප්‍රඥප්තිය යටතේ සම්පාදනය කළ රීති හෝ උල්ලංඝණය කිරීම, කඩ කිරීම සිදු කරන යම් තැනැත්තෙකු; "*

**22 (1) (ආ) වගන්තිය**

*"මෙම ප්‍රඥප්තියයටතේ රාජකාරී ඉටු කරනු ලබන නිලධාරියෙකුගේ රාජකාරියට බාධා කිරීම, අවහිර කිරීම සිදු කරන යම් තැනැත්තෙකු; "*

**22 (1) (ඇ) වගන්තිය**

*"ඉහත (අ) (ආ) සඳහන් වැරදි සඳහා පෙළඹවීම, අනුබල දීම සිදු කරන තැනැත්තෙකු;*
*මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේය. "*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 22 (2) වගන්තිය**

*"ඉහත (1) උපවගන්තියට අනුව යම් වරදකට වරදකරු වන තැනැත්තෙකු මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දහදාහ (රු.10,000) කට නොඅඩු හා රුපියල් පනස්දාහ (රු.50,000) කට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය. "*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 22 (3) වගන්තිය**

*"ඉහත (2) උපවගන්තියේ සඳහන් දණ්ඩන වලට අතිරේකව මෙම ප්‍රඥප්තියේ 19 (3), (4) උපවගන්ති යටතේ ලියාපදිංචිය අවලංගු කරන ලද පෙර පාසලක් වසා දැමීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කරනු ලැබිය හැක්කේය. "*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 22 (4) වගන්තිය**

*"ඉහත (2) උප වගන්තියේ සඳහන් දණ්ඩන වලට අතිරේකව මෙම ප්‍රඥප්තියේ 14 (1), (2) උපවගන්ති යටතේ ලියාපදිංචි නොකර පවත්වාගෙන යනු ලබන පෙර පාසලක් වසා දැමීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කරනු ලැබිය හැක්කේය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 23 (1) වගන්තිය**

*"මෙම ප්‍රඥප්තියට බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබූ දින සිට බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2003 අංක 04 දරණ පෙර පාසල් ප්‍රඥප්තිය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රඥප්ති කෙටුම්පතේ 23 (2) වගන්තිය.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, මේක බලන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

මට මෙහෙම ගැටලුවක් තිබෙනවා. අධ්‍යක්‍ෂවරයෙකු පත් කිරීම කියන එක තුළ ඒ අධ්‍යක්‍ෂවරයා පරිපාලන සේවයේ I වැනි ශ්‍රේණියේ වෙන්න ඕනෑය කියලා තිබෙනවා. නමුත් එයාට පෙර පාසල් ගැන දැන ගන්න ඕනෑය කියලා නැහැ. එයත් පෙර පාසල් ගැන දැන ගත්ත කෙනෙක් වෙනවා නම් තමයි අධ්‍යක්‍ෂවරයා හොඳ වෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

පරිපාලකයෙක් වෙන්න ඕනෑ. එයා ළමයින්ට උගන්වන්න යන්නේ නැහැ නේ ?

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, නමුත් එයා ගුරුවරුන්ගේ මානසිකත්වය තේරුම් ගන්න පුළුවන් කෙනෙක් වෙන්න ඕනෑ නේ? දැන් පරිපාලකයා, ඉන්න ගුරුවරුන්ගේ, ළමයින්ගේ මානසිකත්වය තේරුම් ගන්න ඕනෑ. නැත්නම් එයා වෙන පිස්සුවක් නටන්න ගන්නවා නේ? එයා නිකන් ලොකු අධ්‍යාපන කථාවක් කරන්න ගියොත් එහෙම.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක ඉතින් ඇමැතිවරයාගේ වගකීම. එතැනට පත් කරන කෙනා සුදුසු කෙනෙක් පත් කරන එක.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

එතැනට දැම්මොත් – ඔබතුමා වාගේ ඇමැති කෙනෙක් හිටියොත් හොඳයි. නැත්නම් කොයි වාගේ කෙනෙක් –

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මට ගැටලුවක් තිබෙන්නේ, ඒ ගොල්ලන්ට එහෙම කරන්න තැනක් නැහැ. තනතුරක් නැහැ. ඒකයි. එතකොට මොකක්ද අපි ගන්න තීර්ණායකය.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

මම සමහර තැන්වලදී අහලා තිබෙනවා, –

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔහොම ඉන්න. මේ ටික අපි කරගෙන යමු.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

අපි හිතමු දැන් ක්‍රිකට් බෝඩ් එකේ – ඔබතුමා අපේ ඉස්කෝලේ ක්‍රිකට් ගැහුවා නේ. ක්‍රිකට් බෝඩ් එකේ ඉන්න ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපතිවරයා ක්‍රිකට් ගැන මෙලෝ දෙයක් දන්නේ නැති කෙනෙක් එහෙම වුණොත්. එයාට වෙන සුදුසුකම් ඇති.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, ඒක හොඳයි. ක්‍රිකට් බෝඩ් එකේ සභාපතිවරයා ක්‍රිකට් ගැසිය යුතුයි කියලා මම හිතන්නේ නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගැසිය යුතුයි කියලා නොවෙයි. ක්‍රිකට් ගැන දන්න කෙනෙක් වෙන්න ඕනෑ.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපතිවරයා වෙන්න ඕනෑ පරිපාලකයෙක්.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

නමුත් ඒ පිළිබඳව යම් අවබෝධයක් තිබෙන්න ඕනෑ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

Subject එක දැනගෙන ඉන්න ඕනෑ. එතකොට වෙන්නේ මේ කියන අධ්‍යක්ෂවරයා, මේ කියන ප්‍රධානියා පෙර පාසල් ගුරුවරුන්ගේ මානසිකත්වය හඳුනන්නේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. එච්චාට වෙන නිලධාරීන් එක්ක යන්න ඕනෑ. කමිටුවේ එක්කෙනා නොවෙයි. මම කියන්නේ පෙර පාසල් අධ්‍යක්ෂවරයා පරිපාලකයෙක් වෙන්න ඕනෑ. ඒ අය සම්බන්ධව කටයුතු කරන්න වෙන නිලධාරීන් ඉන්න ඕනෑ ඒකට. මේක විධිමත් ලෙස පවත්වාගෙන යන්න පරිපාලන දැනුමක් තිබෙන කෙනෙක් ඉන්න ඕනෑ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

නැත්නම් ඔබතුමාට සොයන එක අමාරු නම් එහෙම අපි අවුරුද්දක් තුළ මේ පිළිබඳව අධ්‍යයනයක්, මොකක් හරි ඒකට විභාගයක් කරන්න ඕනෑය කියලා දාන්න ඕනෑ. අවුරුද්දක Training එකක්.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

I වන පන්තියේ රාජ්‍ය නිලධාරීන්ගේ එහෙම කරන්න අමාරුයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු මහ ඇමැතිතුමා, මෙහෙම තියෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

පෙර පාසල් කියලා වෙනම දෙයක් නැහැ නේ?

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

වෛද්‍යවරයෙක් ගත්තොත් යම් ක්ෂේත්‍රයකට දානකොට ඒක Qualified වෙන්න නම් ඒ ක්ෂේත්‍ර තුළ -

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. අධ්‍යාපන පරිපාලන සේවයේ කෙනෙක්ව දාන එක ගැටලුවක් නැහැ. එයාට යම් අවබෝධයක් තිබෙනවා නේ? අධ්‍යාපන පරිපාලනයේ එක්කෙනෙක්ව ගන්නවා නම් ගැටලුවක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 23 (2) වගන්තිය**

*"එසේ වුවද 2003 අංක 04 දරණ පෙර පාසල් ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරන ලද පෙර පාසල් හා පෙර පාසල් ගුරුවරියන් මෙම ප්‍රඥප්තිය යටතේ ද ලියාපදිංචි කරන ලද පෙර පාසල් හා පෙර පාසල් ගුරුවරියන් ලෙස සැලකිය යුත්තේය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 23 (3) වගන්තිය**

*"2003 අංක 04 දරණ පෙර පාසල් ප්‍රඥප්තිය යටතේ ඉටු කරනු ලැබූ කාර්යයන් මෙම ප්‍රඥප්තිය යටතේ ඉටු කරනු ලැබූ කාර්යයන් ලෙස සැලකිය යුත්තේය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

IX කොටස. පොදු විධිවිධාන. ප්‍රඥප්ති කෙටුම්පතේ 24 (1) වගන්තිය

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, මෙතැනදී තමයි අර රීති හැදෙන්නේ. අපි කථා කරපු ඒවායේ රීති හැදෙන්නේ මෙන්න මෙතැනදී. මෙතැනදී අර ප්‍රඥප්ති එකට සම්පූර්ණ විස්තර එන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

IX කොටස. පොදු විධිවිධාන. ප්‍රඥප්ති කෙටුම්පතේ 24 (1) වගන්තිය

*"මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රඥප්තියේ සඳහන් විධිවිධානයන්ට අදාළව ඉහත 02 (3) (4) (6) (10), 05, 11 (3) (4), 12 (1) (2), 16, 19 (2), 21(3) වගන්ති සම්බන්ධයෙන් රීති සෑදීමට අමාත්‍යවරයාට බලය ඇත්තේය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 24 (1) (අ) වගන්තිය**

*"එම සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එය පළ කළ දින සිට හෝ රීතියේ නියමිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට හෝ ක්‍රියාත්මක විය යුතුය. "*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 24 (1) (ආ) වගන්තිය**

*"එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු අතර පළාත් සභාව මඟින් අනුමත නොකළ යම් රීතියක් අනුමැතිය නොලද දිනයේ සිට එකී රීතිය යටතේ කලින් කරන ලද ක්‍රියාවකට හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 24 (2) වගන්තිය**

*"මෙම වගන්තිය යටතේ සාදන ලද කිසිම රීතියක් පළාත් සභාව විසින් අනුමත කරන තුරු සහ ඒ අනුමැතිය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තුරු වලංගු නොවන්නේය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 25 වගන්තිය**

*" පළාත් සභාව" යන්නෙන් බස්නාහිර පළාත් සභාවද;*

*"අමාත්‍යවරයා" යන්නෙන් අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයා ද;*

*"ලේකම්" යන්නෙන් අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් ද;*

*"අධ්‍යක්ෂවරයා" යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ කටයුතු කිරීමට පත් කර ඇති නිසි බලධරයා ද;*

*"පෙර පාසල" යන්නෙන් පළාත තුළ අවුරුදු තුන සිට පහ අතර මුල් ළමාවිය දරුවන්ගේ සංවර්ධනය සඳහා නියමිත ක්‍රියාකාරකම් යොදා ගනිමින් කටයුතු කරන ඕනෑම ආයතනයක් ද;*

*"නියමිත ක්‍රියාකාරකම්" යන්නෙන් මුල් ළමාවිය දරුවාගේ සමස්ථ සංවර්ධනයට අදාළ කායික, මානසික, චිත්තවේග, සමාජයීය, භාෂා, පරිසර නිපුණතා හා සෞන්දර්යය, හසුරු කුසලතා සහ යහජීවන පුරුදු යන අංශවල සංවර්ධනයට උචිත ක්‍රියාකාරකම්වල යෙදවීම ද;*

*"උපදේශක කමිටුව" යන්නෙන් පෙර පාසල් උපදේශක කමිටුව ද;*

*"ව්‍යවසායකයා" යන්නෙන් පෙර පාසලක් ආරම්භ කර පවත්වාගෙන යනු ලබන ඕනෑම පුද්ගලයෙකු හෝ ආයතනයක් ද;*

*"පෙර පාසල් ගුරුවරිය" යන්නෙන් පෙර පාසල් ගුරුවරියක් ලෙස ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වී ඇති තැනැත්තියක් ද;*

*"විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්" යන්නෙන් පෙර පාසල් වයසේ සිටින වෛද්‍ය නිර්දේශයකින් සනාථ කරනු ලබන කායික හා/හෝ මානසික ආබාධිත තත්ත්වයේ පසුවන දරුවන් ද;*

*"තැනැත්තෙකු" යන්නෙන් පෙර පාසලක් පවත්වාගෙන යනු ලබන පුද්ගලයෙකු හෝ ව්‍යවසායකයෙකු හෝ ස්වේච්ඡා සංවිධානයක් හෝ සංස්ථාගත ආයතනයක් හෝ පෙර පාසලක සේවය කරනු ලබන ගුරුවරියක හෝ කාර්යය මණ්ඩලයේ යම් සේවකයෙකු හෝ බාහිර පුද්ගලයෙකු හෝ පුද්ගලයන් ද;*

*"මූලික ක්‍රීඩා උපකරණ" යන්නෙන් නැඟීම, එල්ලීම, ඉපිලීම, පැද්දීම, ලිස්සීම, රිංගීම සහ විසි කිරීම යන ක්‍රියාකාරකම් සඳහා යොදා ගනු ලබන උපකරණයන් ද;*

*"හානිකර හෝ අන්තරාදායක ස්ථාන" යන්නෙන් පෙර පාසලක් පිහිටි භූමියේ සිට ඉතා ආසන්නයෙන් මත්පැන් ශාලා හෝ අලෙවිසැල්, සිනමා ශාලා, වීඩියෝ දර්ශන ශාලා, අවංගල්‍ය ශාලා, මස් මාංශ වෙළඳ සැල්, අනාරක්ෂිත කර්මාන්ත ශාලා, අපද්‍රව්‍ය රැස් කරන ස්ථාන, අධික ශබ්ද හෝ වායු දූෂණයට ලක්වන ස්ථාන, විසකුරු සතුන් ගැවසිය හැකි ස්ථාන, විවෘත ළිං, පොකුණු, ඇළ දොළ, ගංගා, වැව් හෝ අනතුරුදායක බෑවුම් පිහිටි ස්ථානයන් ද;*

අදහස් වේ.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

**ප්‍රඥප්ති කෙටුම්පතේ 26 වන වගන්තිය**

*"මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට එකී සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*
***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෙර පාසල් ප්‍රඥප්තිය සම්බන්ධව දෙවැනි වර කියැවීමේ සාකච්ඡාව මෙයින් අවසන් වෙනවා. මෙම අවස්ථාවේදී පූර්ණ කාරක සභාව නැවත පළාත් සභාවක් බවට පත් කිරීමට උපදෙස් ලබා දෙනවා.

***ඊට අනුකූලව අ.භා. 12.04 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 12.04. p.m. the Provincial Council resolved it self in to a committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය]**
[Progress of the whole council]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2013 අංක..... දරණ පෙර පාසල් ප්‍රඥප්තිය මීට පෙර පළාත් සභා රැස්වීමේදී සභාවේ දෙවන වර කියැවීමේදී එකඟ වූ තැන් පටන් පසු වන එනම්, 12(1)(අ) වගන්තියේ සිට අද දින පූර්ණ

කාරක සභාවේදී එකී ප්‍රඥප්තිය සංශෝධන සහිතව සහා සම්මත වූ බව පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය වශයෙන් දක්වනවා.

# බස්නාහිර පළාත් සභාවේ 2013 අංක ..... දරණ පෙර පාසල් ප්‍රඥප්තිය : තෙවන වර කියැවීම

WESTERN PROVINCE PROVINCIAL COUNCIL PRE-SCHOOL STATUTE , NO. ... OF 2013: THIRD READING

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාත් සභාවේ 2013 අංක ....... දරණ පෙර පාසල් ප්‍රඥප්තිය" තෙවන වර කියැවීම සඳහා සංශෝධිතාකාරයෙන් සභාවට ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# 2012 අංක 03 දරණ මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ රීතීන්

RULES FOR PREVENTION OF PUBLIC NUISANCES NO. 03 OF 2012

**ගරු ජගත් අංගගේ –** අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, 2012 අංක 03 දරණ මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තිය. ඊට අදාළ රීති සභාවට මීන් පෙර ඉදිරිපත් කළා. එහිදී තුඩාව රෝහලේ පැවැති හදිසි ප්‍රශ්නයක් පිළිබඳව වෛද්‍යවරුන්ගේ වෘත්තීය සමිති සමහ සාකච්ඡාවක් යට මහලේ පැවැත් වුණා. ඊට සහභාගි වෙලා මම මේ ස්ථානයට අවශ්‍ය වේලාවට එන්න මට දැනුම් දෙන්න කියලා තිබෙනවා. කොහොම හරි ඒක ප්‍රමාද වුණා. උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් මෙම රීති සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගරු ඔබතුමා විසින් ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලෙස දැනුම් දී තිබුණා. පසුගිය සභා කටයුතු කාරක සභාවේදී ගරු ඔබතුමාගේ අනුමැතිය ඇතිව අද මෙම න්‍යාය පත්‍රයට මෙම කොටස ඇතුළත් කර තිබෙනවා. බස්නාහිර පළාත් සභාවේ පමණක් නොවෙයි. සමස්ත ශ්‍රී ලංකාවේ ඩෙංගු රෝගය මර්දනය කිරීමේ සතිය හෙට ආරම්භ වෙනවා. ඒ නිසා අපට මේ රීතීන් කඩිනමින් සම්මත කර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයක් පවතිනවා. මම යෝජනාව ඉදිරිපත් කරනවා.

*"බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන්,*

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 1771/23 දරණ හා 2012 අගෝස්තු මස 16 වැනි බ්‍රහස්පතින්දා දාතමින් යුතු ගැසට් පත්‍රය (අතිවිශේෂ - IV (අ) වැනි කොටස - පළාත් සභා) මඟින් ප්‍රකාශයට පත් කරන ලද්දා වූද,*

*2012 අංක 03 දරණ මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තියේ 21(3) වන උප වගන්තියට අනුකූලව, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ අනුමැතිය සඳහා 2012.10.23 වන දින ඉදිරිපත් කරන ලද්දා වූද,*

*"2012 අංක 03 දරණ මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ රීති" නම් වූ රීතීන්, පිළිබඳව විස්තරාත්මකව සලකා බැලීම සඳහා එදින එනම්, 2012.10.23 දින පළාත් සභා රැස්වීමේදී ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරනු ලදුව, ලද නිර්දේශයන්* [1] *සමඟද සසඳා බලා, යථෝක්ත රීතීන් අනුමත කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ තීරණයන් :**

01. රීති කෙටුම්පතේ 3 (4) වගන්තිය පහත සඳහන් ආකාරයට සංශෝධනය කරන ලදී.

*"එම කාඩ්පත අස්ථානගත කිරීම, විකෘති කිරීම හෝ විනාශ කිරීම නොකළ යුතු අතර, එසේ කටයුතු කරනු ලබන සෑම අයිතිකරුවෙකු/පදිංචිකරුවෙකු හෝ භාරකරුවෙකු හෝ සම්බන්ධයෙන්ම නීත්‍යානුකූලව කටයුතු කරනු ලැබේ. එවැනි අවස්ථාවක ලදු පතක් නිකුත් කරමින් රු.50/- ක ගාස්තුවක් අය කර එම අවස්ථාවේදීම නිසි බලධාරියා විසින් නව කාඩ්පතක් නිකුත් කළ යුතු අතර එම මුදල් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ගිනුමට බැර කළ යුතුය."*

02. රීති කෙටුම්පතේ 8(1) වගන්තිය පහත සඳහන් ආකාරයට සංශෝධනය කරන ලදී.

*"මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් වරදකරු කර අධිකරණයක් විසින් එම වරද සම්බන්ධයෙන් නියම කරනු ලබන යම් දඩයකට අදාළව අය කරනු ලබන දඩ මුදලෙන් 10% ක මුදල් ප්‍රමාණයක් එම වරදකරු කිරීමට උත්සුක වූ බලයලත් නිලධාරියාට ප්‍රදානය කළ හැකිය."*

03. රීති කෙටුම්පතේ 10 වන රීතියෙන් ඉක්බිතිව විස්තර කරන "මහජන සෞඛ්‍ය පීඩා" යටතේ සඳහන්

[1] යෝජනාව අවසානයේ පළ කර ඇත.

අංක 4, 7, 8, 11 හා 13 මහින් විස්තර කරන පීඩාවන් පිළිවෙළින් පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලදී. එසේම පහත සංශෝධන මහින් ඇතුළත් කර ඇති නව ප්‍රභවයන් ඇතුළත් කරමින් 5 වන උපලේඛනයද සංශෝධනය විය යුතු බවට කාරක සභාව විසින් තීරණය කරන ලදී.

*4. "ප්‍රවේශ මාර්ගයක හෝ ප්‍රසිද්ධ ස්ථානවල මළපහ කිරීම, කෙළ ගැසීම, මුත්‍රා කිරීම හෝ සතෙකු මළපහ කිරීමට සැලැස්වීම සහ සිතා මතා එම ප්‍රදේශය අප්‍රසන්නතාවයට පත් කිරීමට කටයුතු කිරීම."*

*7. "ගවයන්, එළුවන් හා ඌරන් හෝ වෙනත් සතෙකු මහජන පීඩා ඇති වන පරිදි තබා ගැනීම"*

*8. "ගොඩනැගිල්ලක්, තාප්පයක්, ගරා වැටුණු තත්ත්වයෙන් හෝ අවධානම් තත්ත්වයෙන් පවතින දිරා පත් වූ ගස් කොළන් හෝ යම් ද්‍රව්‍යයන් පවත්වාගෙන යාම"*

*11. "නීත්‍යානුකූලව බලපත්‍රයක් ලබා නොගෙන මහජනයාට පීඩාවන පරිදි ගුවන්විදුලි යන්ත්‍ර හෝ වෙනත් මාධ්‍යයක් මහින් ශබ්දය පිට කිරීම"*

*13. "නිවස තුළ හෝ පිටත මදුරුවන් බෝවීමට හිතකර ආකාරයට ටින්, බෝතල්, පොල් කටු, පොල් කෝම්බ, ටයර්, වැහි පීලි, වතුර ටැංකි, කෘතිම පොකුණු, කොන්ක්‍රීට් තට්ටු, කුඹි උගුල්, හට්ටි මුට්ටි, ශීතකරණ තැටි, මුදුරුවන් බෝ වීම සඳහා ජලය රඳා පවතින ගස් කොළන් හෝ නැම යම් ප්‍රභවයක් හෝ යම් පසුබිමක් පවත්වාගෙන යාම"*

04. රීති කෙටුම්පතේ "මහජන සෞඛ්‍ය පීඩා" යටතේ අංක 14 ලෙස පහත සඳහන් නව වගන්තිය ඇතුළත් කරන ලදී.

*14. "යම්කිසි ද්‍රව්‍යයක් මහජනයාට පීඩාවක් ඇති වන පරිදි ප්‍රවාහනය කිරීම."*

05. රීති කෙටුම්පතේ "මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ පරිශ්‍ර කාඩ්පත" හි ආකෘතිය බැ බැල්මට අපහැදිලි බැවින් එය පැහැදිලිව නැවත ඉදිරිපත් කළ යුතු බවට කාරක සභාව විසින් තීරණය කරන ලදී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට ඔබතුමා යනවාද?

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

අවශ්‍ය උපදෙස් දෙනවා නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අතිශය වැදගත් යෝජනාවක් නිසා දිගින් දිගටම අපි මීට පෙර සාකච්ඡා කළා. දිගින් දිගටම මේක සාකච්ඡා කරන්න ගියොත් නැවත -

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

විශේෂයෙන් මේ රීති සම්බන්ධව මමත් එකඟ වෙනවා. ඒ වුණාට මේ රීති සම්බන්ධයෙන් සමස්තයක් හැටියට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙමනම් අපි සභාව තීරණය කරන පරිදි, එහෙම නම් පූර්ණ කාරක සභා තත්ත්වයට යන්න වෙනවා. මේ ගැන අපි දීර්ඝව සාකච්ඡා කරනවා නම් එහෙම මට සිද්ධ වෙනවා, සභාව පූර්ණ කාරක සභා තත්ත්වයට පත් කරන්න.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, වචනවල පුංචි පුංචි මුද්‍රණ දෝෂ සහ විය යුතු කුඩා වෙනස්කම් තිබෙනවා. ඒ ඇතුළත් විය යුතු සංශෝධන මම ඉදිරිපත් කරනවා.[2] ඒ නිසා සංශෝධන කිහිපයකට යටත්ව -

***ගරු ඇමැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන ලේඛනය :***

*2012 අංක 03 දරන මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තියේ රීති*

*<u>අංක 1771/23 දරන 2012 අගෝස්තු මස 16 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2012 අංක 03 දරන මහජන පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තියේ රීති සංශෝධනය කිරීම</u>*

*2012 අංක 03 දරන මහජන පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තිය 2012.03.20 දින පැවැති බස්නාහිර පළාත් සභා රැස්වීමේදී ගරු පළාත් සභා මන්ත්‍රීතුමන්ලාගේ ඒකමතික ඡන්දයෙන් සම්මත කරන ලදී. අනතුරුව එම ප්‍රඥප්තියේ 21 වන වගන්තිය යටතේ විෂය භාර අමාත්‍යවරයා වශයෙන් මවිසින් පැනවිය යුතු රීති අංක 1764/14 දරන 2012 ජූනි මස 27 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. පසුව එම රීති, ප්‍රඥප්තියේ 21(3) වගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාත්*

[2] 28 සහ 29 පිටු බලන්න.

*සභාවේ අනුමැතිය සඳහා මවිසින් 2012.10.23 වන දින ඉදිරිපත් කරන ලදී. එම රීති එදින රැස්වීමේදී ප්‍රඥප්ති හා නීති කාරක සභාව වෙත යොමු කරන ලදුව එහිදී ලද නිර්දේශයන් අනුව 2013.02.05 වන දින පැවති පසුගිය සභාවේදී මවිසින් යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන ලදී. ඊට අමතරව එම අවස්ථාවේදී පහත සඳහන් වගන්තිද සංශෝධනය කිරීම පිණිස මවිසින් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.*

*8 වැනි වගන්තිය සංශෝධනය කිරීම.*

*රීති පැනවීමේදී එම රීති නිශ්චිත විය යුතු බැවින් උක්ත ගැසට් පත්‍රයේ 8(1) සහ 8(2) වගන්ති අවසානයේ **"හැකිය"** යනුවෙන් සඳහන් වී ඇති වගන්ති යුතුය යනුවෙන් සංශෝධනය කිරීම. ඒ අනුව එම වගන්ති පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.*

*8(1) මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් වරදකරු කර අධිකරණයක් විසින් එම වරද සම්බන්ධයෙන් නියම කරනු ලබන යම් දඬයකට අදාළව අයකරනු ලබන දඩ මුදලෙන් 25% ක් නොඉක්මවන මුදල් ප්‍රමාණයක් එම වරදකරු කිරීමට උත්සුක වූ බලයලත් නිලධාරියාට ප්‍රදානය කළ **<u>යුතුය.</u>***

*8(2) මෙම ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ 1 වන උපවගන්තියේ සඳහන් ස්ථානීය දඩ මුදලෙන් 10% ක මුදලක් එම වරදකරු කිරීමට උත්සුක වූ නිලධාරියාට ප්‍රදානය කළ **<u>යුතුය.</u>***

*6 වැනි වගන්තිය සංශෝධනය කිරීම.*
*යථෝක්ත ප්‍රඥප්තියේ 9 වන වගන්තිය යටතේ 4 හා 7 වන වගන්ති යටතේ ලිඛිත දැන්වීමක් නිකුත් කරනු ලැබ ඇති යම් පරිශ්‍රයක අයිතිකරුවෙකු, පදිංචිකරුවෙකු හෝ යම් තැනැත්තෙකු හෝ විසින් එම දැන්වීමේ සඳහන් කාලය ඇතුලත එහි නිශ්චිතව දැක්වෙන නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ එසේ ක්‍රියා නොකරන අවස්ථාවක හෝ අයිතිකරුවකු, භාරකරුවෙකු නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි වන හෝ අපහසු වන අවස්ථාවක වහාම මහජන සෞඛ්‍ය පීඩාව ඉවත් කළ යුතු යැයි නිසි බලධරයා හෝ නිසි බලධරයාගේ බලය ලත් නිලධාරියා හෝ තීරණය කරන අවස්ථාවකදී :-*

*නිසි බලධරයා විසින් තීරණය කර ඇති කාර්යයන් නිසි බලධරයා හෝ නිසි බලධරයාගේ බලය ලත් නිලධාරියාගේ අධීක්ෂණය යටතේ එකී මහජන සෞඛ්‍ය පීඩාව ඉවත් කිරීම හා එකී මහජන සෞඛ්‍ය පීඩාව ඉවත් කිරීමේදී හෝ අවශ්‍ය පියවර ගැනීමේදී දරන ලද වියදම වශයෙන් වැය වූ මුදල එකී පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු හෝ භාරකරු හෝ තමායැයි අයිතිවාසිකම් පාන අදාළ තැනැත්තා විසින් ගෙවිය යුතු අතර, එම මුදල සඳහන් කරන ලබා දෙන වවුචරයකට අනුව එකී මුදල වැඩ කරන දින 10 ක් තුළ නිසි බලධාරියා වෙත ගෙවිය යුතු බවත්, එසේ ගෙවා ලබා ගත් ලදුපත එම පරිශ්‍රය පිහිටි ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට භාර දිය යුතු බවත්, සඳහන් කර ඇත.*

*එහෙත් එම ප්‍රඥප්තියේ 9 ඡේදයට අදාළව ගැසට් පත්‍රයේ පළ කර ඇති රීතිවල 9 (4) වගන්තිය යටතේ සඳහන් වන 6 වන උපලේඛනයේ සඳහන් වන්නේ අදාළ 'වියදම් වශයෙන් වැය වූ මුදල' 'ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවන ලෙසත්' යනුවෙනි. ඒ අනුව 6 වන උපලේඛනය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.*

*<u>2012 අංක 3 දරන මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තිය යටතේ 9 වැනි වගන්තිය යටතේ නිසි බලධාරියා හෝ බලයලත් නිලධාරියා විසින් ඉටු කර ගන්නා ලද කාර්යයන් සඳහා නිකුත් කරනු ලබන වියදම් සහතිකයයි.</u>*

*2012 අංක 3 දරන මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තියේ 4 හෝ 7 වැනි වගන්තිය යටතේ කරන ලද නියෝගය ඔබ පැහැර හැර ඇති නිසා එම නිවේදනයේ සඳහන් නියමයන් හා පියවරයන් නිසි බලධාරියා විසින් පත් කර ගන්නා ලද ................................ (ආයතනයේ හෝ සමාගමේ නම) මගින් ඉටු කර ගන්නා ලද අතර එකී නියමයන් හා පියවරයන් ඉටු කිරීමේදී වියදම් වශයෙන් දරන ලද පහත සඳහන් මුදල දින 03 ක් ඇතුළත **<u>නිසි බලධාරියාට හෝ .............................. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ගෙවන ලෙසත්,</u>** එසේ ගෙවීමෙන් පසු **<u>නිසි බලධාරියා හෝ .................................. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ</u>** විසින් නිකුත් කරන ලදුපත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ................................ (සෞ.වෛ.නි. කොට්ඨාශය) වෙත ඉදිරිපත් කරන ලෙසත්, දන්වමි. තවද, එසේ එකී වියදම් ගෙවීම පැහැර හරිනු ලබන්නේ නම් 9 (3) වැනි උප වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමෙන් එකී මුදල හා එකී මුදලින් 50% ක අතිරේක දඩයක් අය කර ගැනීමට සිදු කරන බවද වැඩිදුරටත් දන්වමි.*

*මීට අමතරව රීතිවල 3 (1) යටතේ සඳහන් වන 1 වන උපලේඛනයේ දැක්වෙන ආකෘතිය වන 'මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ පරිශ්‍ර කාඩ්පත' හි පළවන පිටුවේ 'මහජන සෞඛ්‍ය නිලධාරී කොට්ඨාශය' ලෙස සඳහන් වී ඇත. එය 'සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය' ලෙස නිවැරදි විය යුතුය.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යටත්ව අපි එතුමාට අවසර දෙමු. ඒකට කමක් නැහැ නේ? ඒ පිළිබඳව සභාවේ සම්මතය. එකඟතාවය. ගරු අමාත්‍යතුමා ප්‍රකාශ කළ පරිදි යම් යම් සංශෝධන සහ රීති වෙනස්කම් එතුමාට අපි ඒ අවසරය දෙමු. ඒ සංශෝධනයන් සුදුසු පරිදි එතුමාට සකස් කිරීමට. ඒ අනුව ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව -

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

සංශෝධනය කරලා, සංශෝධනයෙන් පසුව සභාව පොඩ්ඩක් දැනුවත් කළා නම් හොඳයි. අද ඉදිරිපත් කරනවාද?

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

හොඳයි. ගරු සභාපතිතුමනි, මෙම රීති මාලාවේ 8 (1) වගන්තිය -

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අපි දැක්ක විධියට මේකේ තිබෙන්නේ, මහජනතාවට යම් යම් රීති පැනවීමක්. හැබැයි, සමහර අදාළ ආයතන තිබෙනවා. මේ ආයතනවලට නීති රීති පැනවීම් වෙලා නැහැ. විශේෂයෙන්ම මේවා මර්දනය කිරීමේ වගකීම තිබෙන්නේ, පළාත් පාලන ආයතනවලට. එතකොට මේ සියල්ල මහජනතාව පිට පැටවෙනවා ඇරෙන්න, ඒ වගකීම් දැරිය යුතු අදාළ ආයතන සම්බන්ධයෙන් නිසි ක්‍රියා මාර්ගයක් මෙහි වෙලා නැහැ ගරු සභාපතිතුමනි. ඒ නිසා ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලන්න කැමැතියි. මේ ආයතන සම්බන්ධයෙනුත් යම්කිසි විධිමත් ක්‍රියාමාර්ග ගැනීම - ඒ කියන්නේ ඒකේ වගකීම තිබෙන ආයතන පැහැර හැරලා. වගකීම සියල්ලම මිනිස්සු පිට පැටවිලා තිබෙන්නේ. මේ පිළිබඳව ගරු ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු කරන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අදහස සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, ගරු විපක්ෂ නායකතුමාගේ අදහසට මම ගරු කරනවා. මන්ද, අපි මේ රීති සම්පාදනය කළේ, දැනට අපි ළඟ තිබෙන ප්‍රඥප්තියට අනුකූලව. දැන් එතකොට ආයතන මට්ටමෙන් - එතුමා අදහස් කරන්නේ සමහර පෞද්ගලික ආයතන සහ රාජ්‍ය ආයතනවල, ආයතන පරිශ්‍රයන් තුළ මෙවැනි තත්ත්වයන් ඇති වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීම සම්බන්ධව රීතින් මේ රීති මාලාවට ඇතුළත් විය යුතුයි කියන කාරණාව.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

පළාත් පාලන ආයතන.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතන හරහා සිද්ධ වෙන්නේ, අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාම තමයි පළාත් පාලන ආයතනයේ නිසි බලධාරියා හැටියට පත් වෙන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නයක් තිබෙනවා. මහ නගර සභා ආඥා පනතේ තිබෙනවා, *"නිවාස කසළ සහ වීදි කසළ මහ නගර සභාවේ දේපළක් වන්නේය."*

එතකොට අපි මේවාට නීති රීති හදාගෙන කුණු දාන මිනිස්සුන්ට දඩ ගහනවා. දඬුවම් දෙනවා. උසාවි අරගෙන යනවා. මේ ඔක්කෝම කරනවා. නමුත් කුණුවල අයිතිකාරයා පළාත් පාලන ආයතනය. ආඥා පනත යටතේ. අපේ ගරු විපක්ෂ නායකතුමා පැහැදිලි කරන්නේ, ඒ ඇත්ත අයිතිකාරයා, ආඥා පනතේ පැහැදිලිව තිබෙනවා. සියලු කුණු, නිවාස කසළ සහ වීදි කසළ මහ නගර සභාවේ දේපළක් වන්නේය. එහෙමනම් ඒ දේපළවලට නඩු දාන්නේ මිනිස්සුන්ට. අන්න එතැන පොඩි දෙයක් තිබෙනවා. අපේ රටේ මේ සඳහා මිනිස්සු නැඟිටලා ආවේ නැති වුණාට ඉන්දියාව වාගේ රටවල මිනිස්සු පළාත් පාලන ආයතනවලට විරුද්ධව නැඟී ඉඳලා තිබෙනවා. නමුත් අපිත් නීති හදන්නේ මහජනයට. අදාළ ආයතනවලට නොවෙයි.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

අපේ රීති මාලාවට ඇතුළත් කරගන්න පුළුවන්. අපට අවශ්‍ය ආකාරයට -

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම හිතන්නේ ගරු සභාපතිතුමනි, මේ රීති මාලාවට අනිවාර්යයෙන්ම මේ කාරණය සම්බන්ධයෙන් ඇතුළත් විය යුතුයි කියලා අපි කල්පනා කරනවා. ගරු ඇමැතිතුමා ඒකට එකඟයි. මේ සංශෝධනය කරද්දී අනිවාර්යයෙන්ම ඒක කරන්න. දැන් රාජ්‍ය ආයතන වුණත් එහෙමයි. එහා පැත්තේ විදේශ සේවා කාර්යාංශයේ හත් දෙනෙක් රෝහල් ගත වුණා. දෙන්නෙක් මළා. මේ රාජ්‍ය ආයතනයක්. මේ රාජ්‍ය ආයතනයේ තිබුණු අඩු සැලකිල්ල තමයි, මේ ඩෙංගු මදුරු මර්දනය කරන්නට නොහැකි තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. බෝ වෙන තැන. ඒක නිසා පළාත් පාලන ආයතනය මේකෙන් නිදහස් කරන්න බැහැ. කසළ ඉවත් කිරීමේ පූර්ණ වගකීම තිබෙන්නේ පනතේ හැටියට අදාළ පළාත් පාලන ආයතනවලට.

**ගරු අජිත් මාන්නප්පෙරුම**

Hon. Ajith Mannaperuma

ඉවත් කිරීම නොවෙයි -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ පළාත් පාලන ආයතන හරියට ක්‍රියාත්මක වෙනවා නම් - පළාත් පාලන ආයතනවල නීති රීති ඇතියි මේ කසළ ඉවත් කරලා මේ තත්ත්වය ඇති කරන්න. නමුත් ඒක නොවෙන නිසා තමයි තවත් නීති හඳුන්වා දෙන්න අපට සිද්ධ වෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමා මාර්ගයෙන් අදාළ ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි. මේ සම්බන්ධ එකී විධිවිධාන මේ සංශෝධනයේදී මේකට ඇතුළත් කරන්න කියලා.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමන්ලා මේ පිළිබඳව යම් අධ්‍යයනයක යෙදී තිබෙනවා නම්, මේ අවස්ථාවේදී ඒ ඇතුළත් කළ යුතු සංශෝධන ඉදිරිපත් වෙනවා නම් -

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

පැහැදිලිව අපි සඳහන් කරන්නේ, පළාත් පාලන ආයතනවල පොදු දේපළ තිබෙනවා. ඒ තැන්වල මදුරුවන් රැඳෙනවා. පළාත් පාලන ආයතනවල කාණු පද්ධති තිබෙනවා. පළාත් පාලන ආයතනවල වෙන පොදු භූමි තිබෙනවා. මේවා එකක්වත් ශුද්ධ පවිත්‍ර කරන්නේ නැහැ. ඒ වාගේ අපේ බල ප්‍රදේශයට අහුවෙන්නේ මේ RDA එකේ කාණු තිබෙනවා. ශුද්ධ කරන්නේ නැහැ. කුණු එකතු කිරීම නැහැ. නගරසාන්න තිබෙන කාණු ශුද්ධ කරන්නේ නැහැ. ප්‍රශ්න දෙකක් මතු කරලා තිබෙනවා. එකක් කියනවා. බල ප්‍රදේශයේ නගර සභාව කියනවා, අපට අයිති නැහැ. මේක RDA එකට අයිතියි කියලා. මාළු බොකුද, ජරාව ඔක්කෝම දාලා පිරිලා. ඒ නිසා මේ ආයතනවල වගකීමක්. ඔබතුමා මේ රීති යටතේ පවරන්න ඕනැ. කාඩ් එක නැති වුණාම මහජනයාට රුපියල් 50/- ක් දඩ ගහනවා. මහජනයාට කියනවා. පොදු දේපළ, රාජ්‍ය ආයතන ගරා වැටිලා තිබෙනවා. බිත්ති පුපුරලා තිබෙනවා. ගස් වැල් මේවා වෙලා තිබෙනවා. රජයේ ටොයිලට් එකට යන්න විධියක් නැහැ. පොදු තැනට ගියාම ඒ තත්ත්වය තිබෙනවා. මාර්කට් එක ළඟට ගියාම මාළු ගඳේ ඉන්න බැහැ. වතුර රැඳිලා තිබෙනවා. මේ නිසා විශේෂයෙන්ම රාජ්‍ය හා පොදු ආයතන සියලු දේම සම්බන්ධ වෙන්න වෙනවා. නැත්නම් බේකරියක් Check කරලා දඩ ගහනවා වාගේ. නැත්නම් ගෙවල්වලට ගිහිල්ලා මිනිසුන්ට දඩ ගැහිල නොවෙයි වෙන්න ඕනැ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, නිලධාරීන්ගේ වගකීමෙන් බැඳුණු ඒවා තිබෙනවා. දැන් මේ ශබ්ද පාලනය අද පොලිසිය පාලනය යටතේ තිබෙනවා. ඒ වාගේම පරිසරයට හැකියාව තිබෙනවා. ඒ වාගේම නගර සභා පනතේ පැහැදිලිව තිබෙනවා, යම් යම් අවස්ථාවල් ගැන. ගවයින් මහ පාරේ හරියට ගැවසෙනවා. එහෙමනම් මේ ගවයින් ගැවසීම සම්බන්ධව පොලිසියට වගකීමක් තිබෙනවා, උසාවියට අරගෙන ගිහිල්ලා රුපියල් 5000/- දක්වා දඩ නියම කරන්න. මේ ඔක්කෝම පළාත් සභාවක් හැටියට අපි පවරාගෙන අපි ඇයි මේ බර අදින්න හදන්නේ? මහ පාරේ හරක් ඇවිදිනවා නම්, සත්තු ඇවිදිනවා නම් ඒ පිළිබඳව පොලිසියට වගකීම තිබෙනවා. ප්‍රාදේශීය සභාවට වගකීම තිබෙනවා. ඒවා කරන්නේ නැතිව අපි මේ නීති රීති දැම්මාට වැඩක් වෙන්නේ නැහැ. ක්‍රියාත්මක කරන්න ගියාම. විශේෂයෙන්ම මේ ආයතනවල වගකීම පැහැර හැරීමක් වන්නේ නම්, ඒකත් මේ ප්‍රඥප්තියට ඇතුළත් වෙලා, මේ රීතිවලට ඇතුළත් වෙන්න ඕනැය කියන එක තමයි අපි විපක්ෂයක් හැටියට පොදු මතයක් තිබෙන්නේ. මේක දැන් ජනතාවටම දඩ ගහලා හරි යන්නේ නැහැ නේ? අපේ පළාතේ සමහර තැන්වල මම දකිනවා, සමහර ප්‍රභූවරුන්ගේ ගෙවල්වලට ඇවිල්ලා දුම් ගහලා යනවා. මහජනයාට ඒ අවස්ථාව නැහැ. වරිපනම් බදු එකතු කරනවා. නොයෙක් විධියෙන් ගන්නවා නම් - ඒ නිසා පොදු වැඩ පිළිවෙළක් ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කොට මේ අනුව කටයුතු කරමුයි කියන එකයි අපේ අදහස. මේ පනතට අපි විරුද්ධ නැහැ. වැඩේ හොඳයි. විය යුතුයි. කිසි දෙයක් නැහැ. වගකීම් පැහැර හරින උදවිය සම්බන්ධව ඔක්කෝම නිදහස් වෙලයි තිබෙන්නේ.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, දැන් මම හිතන්නේ ඔබතුමා අංක වශයෙන් කිව්වා නම් අපට මේ සංශෝධනවලට යන්න පුළුවන්. මේකේ විශේෂයෙන් ගරු විපක්ෂ නායකතුමාගේ සහ ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමාගේ අවධානය ලක් කරනවා, 9(2) වගන්තිය. නව වන උපලේඛනයේ දෙවැනි වගන්තිය පිළිබඳව. මෙහි සඳහන් වෙන්නේ,

යම් පරිශ්‍රයක ඉටු කළ යුතු පියවර හෝ කාර්යය පවරනු ලබන පුද්ගලයෙකුට, ආයතනයකට හෝ සමාගමකට එකී මහජන සෞඛ්‍ය පීඩාව ඉවත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු කියන ආකාරයෙන් තමයි සඳහන් වන්නේ. ඒ කියන්නේ ආයතන හෝ සමාගම් කියන දෙකම මේකට ඇතුළත් වෙලා තිබෙනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

පළාත් පාලන ආයතනත් මේකට ඇතුළත් වෙන්න ඕනැ.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

ඒක තමයි මම කියන්නේ. පළාත් පාලන ආයතන. ආයතන ගණයට -

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ආයතන කිව්වාම අර්ථ නිරූපණයක් වෙන්නේ නැහැ.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

ඒක තමයි මම කියන්නේ, පොඩ්ඩක් ඔබතුමන්ලා -

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

පළාත් පාලන කියලා.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

පළාත් පාලන කියලා ආදේශ කරන්න ඕනෑ නම් අපි එතැනට ආදේශ කරමු.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

පළාත් පාලන සහ නීතිමය වශයෙන් ක්‍රියාත්මක කළ යුතු ආයතන.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

ඒක සංශෝධනයක් හැටියට ඔබතුමා ඉදිරිපත් කරන්න.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ඒ ආයතනද මේකට ඇතුළත් වෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සංශෝධනයත් එක්ක පැහැදිලිව ඉදිරිපත් කරන්න.

යම් පරිශ්‍රයක ඉටු කළ යුතු පියවර හෝ කාර්යය පවරනු ලබන පුද්ගලයෙකුට, ආයතනයකට හෝ සමාගමකට අන්න එතැන පොඩි සංශෝධනයක් එනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ආයතන සහ රාජ්‍ය හා පළාත් පාලන, පෞද්ගලික ආයතන

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

මම හිතන්නේ ඔබතුමන්ලා මේක පරිශීලනය කළා නම් යම් යම් ස්ථානවල මේ පිළිබඳව හැඳින්වීම් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමා එහෙමනම් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කරන්න.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

14 වන වගන්තිය යටතේ පළාත් පාලන විෂයයත් ඇතුළත් වෙනවා මේකට.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ඔව්.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, අංක වශයෙන් ගියා නම් අඩුපාඩු ටික අපට සම්පාදනය කරගන්න පුළුවන් වෙයි.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

විශේෂ අඩුපාඩුකම් තිබුණේ ඒ ටික විතරයි. ජනතාව විතරයි පැහැදිලි වෙන්නේ. නිලධාරීන්ගේ පැත්තෙන් වගකීම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, 4 වැනි ජේදය.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

8 (1) මෙතැන සඳහන් වෙන්නේ "*හැකිය*" කියලා. ගරු සභාපතිතුමනි, එතැන "*යුතුය*" කියන යෙදෙන්න ඕනෑ. එකින් එක යනවාද? නැත්නම් මේකේ අඩුපාඩු ටික -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මොකක්ද ඔබතුමන්ලාගේ අදහස? ගරු ඇමැතිතුමා එතුමාගේ සංශෝධන සභාවට ඉදිරිපත් කළා. ප්‍රඥප්ති කාරක සභාවෙහි නිර්දේශ ඉදිරිපත් කර තිබෙනවා. ඒ සංශෝධනයන්ද ඇතුළත් කරලා සභාවේ එකඟතාව ලබා දෙන්න.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

අපි පොදු ටික කිව්වා. ගැටලුවක් නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, මෙතැන තව ප්‍රශ්නයක් තිබෙන්නේ මේ නීති බොහෝ දේවල් රටේ දැනට පවතින නීති. මේ නීති බොහෝ දේවල්

රටේ පවතිනවා. නමුත් වෙලා තිබෙන්නේ නිලධාරීන්ට ප්‍රමාණවත් පහසුකම් සලසා නැහැ, මේවා ක්‍රියාත්මක කරන්න. ඒ කියන්නේ PHI කෙනෙකුට බයිසිකලයක් නැහැ. තිබෙන වාහනයට ඩීසල් නැහැ. නැත්නම් –

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, අපට මේ රීති ටික සම්පාදනය කර ගැනීම සහ ක්‍රියාත්මක කිරීම කොටස් දෙකක්. දැන් අපට ඕනෑ දැනට නීති සම්පාදනය කර ගැනීමයි. ඒකට මෝටර් සයිකලයෙන් යවනවාද? පුට් සයිකලයෙන් යවනවාද? ඒකට ඉන්ධන ප්‍රමාණය කොච්චර නිකුත් කරනවාද කියන කාරණාව අපි දෙවනුව සාකච්ඡා කරමු. මම කියන්නේ මේ රීතිවල අඩුපාඩුකම් තිබෙනවා නම් –

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, අපේ මේ නීති පවතින නීති. රටේ පවතින නීති.

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

නැහැ, නැහැ. මේකයි ප්‍රශ්නය තිබෙන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

නමුත් වෙලා තිබෙන්නේ අපි කොපමණ නීති දැම්මත් මේවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මොකද, ක්‍රියාත්මක වීමේ පහසුකම් නැති නිසා. තවත් නීති අපට දමන්න පුළුවන්.

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, ලංකාවේ පළමුවැනි වතාවට තමයි පළාත් සභාවක් මේ රීති පද්ධතිය සම්මත කර ගන්නේ. ලංකාවේ කිසිම පළාත් සභාවක් මේ රීති සම්මත කරගෙන නැහැ. අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් අපි යටතේ සිටියාට ඒ අයට කවදාවක්වත් අපේ බලය සම්පාදනය කරලා දෙන්නේ – ප්‍රඥප්තිය මඟින් මේ දේ ක්‍රියාත්මක කරන්න. ඔවුන් එක්කෝ පොලිස් ස්ථානයට ගිහිල්ලා පොලිසියේ බලතල පාවිච්චි කරනවා. එහෙම නැත්නම් පළාත් පාලන ආයතනයට ගිහිල්ලා පළාත් පාලන ආයතනයේ බලතල පාවිච්චි කරලා තමයි අධිකරණයේ ඉස්සරහාට ගියේ. පළාත් සභාව මෙතෙක් රීතියක් සම්පාදනය කරලා තිබුණේ නැහැ. ඉතින් ඒක තමයි දැන් අපි මේ කරන්නේ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු ගෙන්වනවාද? අපට මේක ක්‍රියාත්මක කරන්න.

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු අපේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ යටතේ ඉන්නේ. නමුත් නීති රීති තිබුණේ වෙනත් ආයතන යටතේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඔව්. නීති රීති තිබ්බා.

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

තිබුණේ අපි යටතේ නොවෙයි.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඔව්. ඒක හරි. නමුත් –

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

අපට නීති රීති මොකුත් නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

නමුත් මේවා ක්‍රියාත්මක වෙන්නේ නැති එක තමයි ප්‍රශ්නය තිබෙන්නේ.

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

වෙන තැන්වලින් ක්‍රියාත්මක වෙනවා. අපි පළමුවැනි වතාවට තමයි මේ රීති සම්පාදනය කරන්නේ. නීති සහ රීති. ප්‍රඥප්තිය සම්මත කළා. ප්‍රඥප්තිය සම්මත කරන්න රීති ටික ගැසට් කරලා තිබෙනවා. ඒ ගැසට් රීතිවල පොඩි පොඩි සංශෝධන කරනවාද නැද්ද කියන එක තමයි අපි අද තීන්දු කරන්න ඕනෑ. මා දුටු සංශෝධන, විය යුතු යැයි හැඟෙන ස්ථාන පිළිබඳව මම සභාවට ප්‍රකාශ කරන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු අමාත්‍යතුමා, ඔබතුමා සිදු විය යුතු සංශෝධන විතරක් ප්‍රකාශ කළොත් විතරක් ඇති. කළ යුතු සංශෝධන විතරක් ඔබතුමා සභාගත කරන්න. ඒක පහසුයි.

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, මා සභාවේ අවධානයට ලක් කරනවා, 8 වැනි වගන්තිය සංශෝධනය කිරීම සම්බන්ධයෙන්. 8 වැනි වගන්තියේ සඳහන් වෙන්නේ,

*"මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් වරදකරු කර අධිකරණයක් විසින් එම වරද සම්බන්ධයෙන් නියම කරනු ලබන යම් දඩයකට අදාළව අය කරනු ලබන දඩ මුදලෙන් 25% ක් නොඉක්මවන මුදල් ප්‍රමාණයක් එම වරදකරු කිරීමට උත්සුක වූ බලයලත් නිලධාරියාට ප්‍රදානය කළ හැකිය."*

කියලා. ඒක ගරු සභාපතිතුමනි, මම යුතුය ලෙස සංශෝධනය විය යුතු යැයි යෝජනා කරනවා.

8 (2) ත් ඒ ආකාරයෙන්ම "*හැකිය*" යනුවෙන් සඳහන් කොටස "*යුතුය*" යනුවෙන් සංශෝධනය විය යුතු යැයි මා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ 25%, 10% කරලා තිබෙනවා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

සමාවෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ 25% දඩය 10% ක් කරන්න යෝජනා කරලා තිබෙනවා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ මෙම සංශෝධනය තිබෙනවා මම දැක්කා. ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සභාපතිතුමා මේ අවස්ථාවේදී මෙතැන නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කවුරුවත්ම නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, එතකොට මේ නීතිය මෙහෙම වෙන කොට නිලධාරියා උත්සාහ කරන්නේ, වරදකාරයා කරන්නද? එහෙම නැත්නම් වරද නිවැරදි කරවන්නද? වරදකාරයා කළොත් එයාට සල්ලි හම්බ වෙනවා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

මේක මේ පළමුවැනි වතාවට සිද්ධ වෙන කාරණාවක් නොවෙයි. මේක කස්ටම් එකේත් වෙනවා. හැම තැනම වෙනවා. මේ ප්‍රසාද දීමනා ගෙවනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

අනික් අය කරනවා කියලා එහෙම කරලා හරි යන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් සමාවෙන්න. මම හිතන්නේ ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉන්නවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම හරියටම තේරුම් ගත්තේ නැහැ, මොකක්ද කිව්වේ කියලා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

මේ සඳහන් කරන්නේ අර මහජන පීඩා ප්‍රඥප්තිය යටතේ දඩ මුදල් නියම කිරීමෙන් අනතුරුව ඒ සඳහා ක්‍රියාත්මක වුණු නිලධාරියාට ප්‍රසාද දීමනා ගෙවීම සම්බන්ධව. ප්‍රඥප්තියේ සම්මත කරලා තිබෙන්නේ 25% ක් කියලා. ප්‍රඥප්ති හා නීති කාරක සභාව ඒක 10% දක්වා අඩු කර තිබෙනවා. ඒ පිළිබඳව තමයි කථා කළේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

කාරක සභාවේදී ඒක කළාද කියලා අහන්නේ?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම හිතන්නේ ඔය රැස්වීමට මම සහභාගි වුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එදා ඔබතුමා ඇවිල්ලා නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ යෝජනා කරලා තිබෙන ප්‍රමාණය හොඳයි කියලා විශ්වාස කරනවා. අද රටේ තිබෙන තත්ත්වය තමයි දඩ මුදල් මිනිස්සුන්ට ගහන්න ගහන්න රජයේ ආදායමට බැර වෙනවාට වැඩිය සාක්කුවට යන එක තමයි වෙන්නේ. දඩය වැඩියෙන් ගහන්න ඉඩ දෙනවාට වැඩිය ප්‍රසාද දීමනාව මේ විධියට - මේ තිබෙන යෝජනාව පිළිබඳව අපි එකඟතාවයක් තිබෙනවා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

අපි මේක භාගයක් කරමු. දොළහයි දශම පහයි කියලා දාමු. කමක් නැහැ නේ?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ප්‍රඥප්ති හා නීති කාරක සභාව දීලා තිබෙනවා නේ. එතැනින් තියමු. දඩ මුදල වැඩි වෙන්න, වැඩි වෙන්න සිද්ධ වෙන්නේ වෙනත් අරමුණු ඉෂ්ට වෙනවා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

දඩ මුදල් අධිකරණයෙන් නේ තීන්දු කරන්නේ. ඒක අපට තීන්දු කරන්න බැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

දහය හොඳයි.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

දහයෙන් වෙන්නේ අඩු කළාම වැඩියෙන් පරික්‍ෂා කිරීමටත් පෙළඹෙනවා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

සියයට දහයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙමනම් 10% හරි නේ?

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Amended, Question put and agreed to*

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ඊළඟට 06 වැනි උපලේඛනයේ සංශෝධනය කිරීමක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මෙහි සඳහන් වෙලා තියෙනවා, නිසි බලධාරියා හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වරයා යනුවෙන් සඳහන් වෙන්න ඕනෑ කියලා. සඳහන් වෙලා තියෙන්නේ, ප්‍රඥප්තියේ ප්‍රාදේශීය ලේකම්වරයා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිසි බලධරයා හෝ බලයලත් නිලධාරියෙක්

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

උපලේඛනයේ සංශෝධනය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමතිතුමා, කීයද අංක 06 ද ?

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

උපලේඛනයේ. මේකේ තියෙන්නේ "2012 අංක 03 දරණ මහජන සෞඛ්‍ය පිඩා වැළැක්වීමේ ප්‍රඥප්තියේ 09 වැනි උප වගන්තිය යටතේ නිසි බලධාරියා හෝ බලයලත් නිලධාරියා විසින් ඉටු කර ගන්නා ලද කාර්යයන් සඳහා නිකුත් කරනු ලබන වියදම් සහතිකය." එහි සඳහන් වෙලා තියෙන්නේ ප්‍රාදේශීය ලේකම්වරයා යනුවෙන්. ඒක ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා යනුවෙන් සංශෝධනය වෙනවා. ගැසට් පත්‍රයේ තියෙන්නේ ප්‍රාදේශීය ලේකම් කියලා. ඒ කියන්නේ ඒ මුදල් ගෙවන්න ඕනෑ ප්‍රාදේශීය ලේකම්වරයාට කියලා තියෙන්නේ. ඒක සංශෝධනය වෙන්න ඕනෑ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා කියලා.

**ගරු ඒ.එම්. යූසුප්**
Hon. A M Yoosuf

මම හිතන්නේ එතැන නීතිමය ගැටළුවක් මතු වෙනවා. මම හිතන්නේ ගැසට් නිවේදනය මගින් ප්‍රාදේශීය ලේකම්වරයාට බලය පවරලා ඇත්තේ. එහෙම නම් ඒක ගැසට් එකෙන්ම අදාළ විෂය භාර ඇමතිවරයා විසින් අවලංගු කරන්න වෙනවා නේ? අපට බැහැ නේ ඒක කරන්න? එහෙම නේ? සෞඛ්‍ය නිලධාරියෙක් හැටියට ප්‍රාදේශීය ලේකම්ට බලය පවරලා තියෙනවා. ඒ බලය නැවත වරක් අපි ගන්න වෙනවා. නැත්නම් අපට එතැන්දී නීතිමය ගැටළුවක් මතු වෙනවා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගැසට් මගින් නිවේදනය නිකුත් කර තිබෙන නිසා මෙම සංශෝධනවලට අපට යන්න වෙනවා.

**ගරු ඒ.එම්. යූසුප්**
Hon. A M Yoosuf

නමුත් දැන් බලධාරියා කරලා තියෙන්නේ ඇමතිතුමා. මුදල් ලබා ගන්න බලය පවරලා තියෙනවා ගැසට් එකෙන්. එහෙනම් ඒක අවලංගු කරන්න වෙනවා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ඒක අපි නැවත සංශෝධනයක් හැටියට-

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

සංශෝධනය කරන්න අවලංගු කරන්න වෙනවා. ඒක රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරලාද දන්නේ නැහැ. පළාත් සභා ක්‍රමයට පෙර ඉඳලා බලය පවරපු එකක් වෙන්න ඇති එන්නේ දැන්.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

කලින් දඩ මුදලක් අය කිරීමක් සිද්ධ වුණේ නැහැ නේ?

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

බලය අහෝසි කරන්න වෙනවා. යම්කිසි නීතිමය තත්ත්වයකට ගියා නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතන්නේ, මේ බලය පැවරීම සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා ප්‍රශ්නයක් තියෙනවා. මොකද, එතුමාට මධ්‍යම රජයේ අමාත්‍යාංශ ලේකම් බලය පවරලා තියෙන්නේ. ප්‍රාදේශිය ලේකම්ට බලතල දීලා තියෙන්නේ. මධ්‍යම රජයෙන් බලය දීලා තියෙන්නේ ප්‍රාදේශීය ලේකම්ට.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

කුමන විෂයයන් සඳහා ද දන්නේ නැහැ?

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ඔහු සෞඛ්‍ය බලධාරියෙක් හැටියට ගැසට් කරලා ගැසට් නිවේදනය අනුව තමයි ඔහුට බලය පවරන්නේ. මුදල් ලබා ගැනීම සඳහා. ඒවා රජයේ ආදායමට බැර වෙන්නේ. ඒවා අපේ පළාත් සභාවට ලබා ගන්නවා නම්, නීතිමය සංශෝධනයක් අවශ්‍ය වෙනවා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

අපිම තමයි මේක ගැසට් කරලා තියෙන්නේ. අපි ගැසට් කරලා තියෙනවා පහුගිය ප්‍රඥප්තිය යටතේ. මුදල් ගෙවිය යුත්තේ ප්‍රාදේශීය ලේකම්ට කියලා. ඒක තමයි නැවත සංශෝධනය වෙන්න ඕනැ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ඊට පෙර ඉඳලා තිබුණාද දන්නේ නැහැ.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

එහෙම දඩ මුදල් අයකර ගැනීමක් තිබුණේ නැහැ නේ? මේ ප්‍රඥප්තියෙන් නේ බලය පැවරෙන්නේ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

කලින් තියෙන්න ඇති නේ?

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

සාමාන්‍යයෙන් උසාවි දඩ මුදල් එන්නේ ඇමතිතුමා පළාත් පාලන ආයතනයට නේ?

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

උසාවි දඩ මුදල් නොවෙයි.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

උසාවි දඩ මුදල් යන්නේ පළාත් පාලන ආයතනයට.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

අපි විසින් බලය පවරලා තිබුණා නම් ඇමතිතුමා හැටියට, ඔබතුමාට අහෝසි කරන්න බලයක් තියෙනවා. ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය ඇමතිවරයා විසින් ප්‍රාදේශීය ලේකම්වරයාට ඒ බලය පවරලා තිබුණා නම්, ඒ බලය අහෝසි කිරීමේ බලය ගරු ඇමතිතුමාට තියෙනවා. මම අහන්නේ, මීට පෙර රේඛීය අමාත්‍යාංශයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන්ට - අපි සමුපකාර කොමසාරිස් කරනවා. සමාජ සේවා සහකාර නිලධාරීන් කරනවා. මධ්‍යම ආණ්ඩුවෙන් ඒ වාගේම කරලා තිබුණා නම්, ඔබතුමා ඒ ගැන සොයා බැලීමක් කරන්න වෙනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

දැන් බලය තියෙන එක්කෙනාට පුළුවන් ඉල්ලීමක් කරන්න.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ඒක තමයි කියන්නේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඒ බලය කලින් නැති වුණාට ප්‍රශ්නයක් නැහැ. ඇමතිතුමාට නම් බලය තිබුණේ -

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ඒක තමයි කිව්වේ. ඇමතිවරයාට බලය දීලා තිබුණා නම් ඒක අහෝසි කරන්න බලයක් තියෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

කැබිනට් එකට යන්න ඕනෑ නැද්ද?

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

කැබිනට් එකෙන් රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් හෝ අමාත්‍යවරයා විසින් ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඒ බලය පැවරීමක් ගැසට් නිවේදනයෙන් දීලා තිබුණා නම්, ඒක ගැසට් නිවේදනයකින්ම අහෝසි වෙන්න ඕනෑ. නීතිමය තත්ත්වය ඒකයි. ඔබතුමා බලය පවරලා තිබුණා නම්, ඔබතුමාට පුළුවන් ඒ ගැසට් නිවේදනයෙන් අහෝසි කරන්න. ඒ එක්කම ඒ මුදල් රජයේ ආදායම් ගිණුමට තමයි මෙතෙක් කල් යනවා නම් ගියේ. එහෙම නම් පළාත් සභාවට හරවා ගැනීමේදී ඒ පිළිබඳවත් අපට -

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

පළාත් අරමුදලට -

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

පළාත් අරමුදලට හෝ ඒකේ නීතිමය ගැටළුවක් තියෙනවා. අවශ්‍ය නීති උපදෙස් ලබා ගෙන සංශෝධනය කරනවා නම් හොඳයි කියන එකයි මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් යෝජනා කරන්නේ.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, දැන් මේ ප්‍රඥප්තිය තුළින් අපි බලය පවරලා තියෙන්නේ ප්‍රාදේශීය ලේකම්ට. ප්‍රඥප්තියේ සඳහන්ව තියෙනවා ප්‍රාදේශීය ලේකම් කියන වචනය. එතකොට මේ රීති සකස් කර ගැනීමේදී සකස් කරන ආකෘතියේ 6 වන උප ලේඛනය තුළ සඳහන් වෙලා තිබුණේත්, ඒ ආකාරයෙන් ප්‍රාදේශීය ලේකම් කියන වචනය. ඒ ප්‍රාදේශීය ලේකම් කියන වචනය සංශෝධනය විය යුතුයි, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කියන වචනයට. ඒ නිසා අපි මේ මුදල් බැර කළ යුත්තේ ප්‍රාදේශීය ලේකම්ගේ ගිණුමට කියන එක ප්‍රඥප්තිය තුළින් අපිම තමයි සම්පාදනය කළේ. මේ සභාව ඒක සම්මත කළේ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ප්‍රාදේශීය ලේකම්ට අපි කියලා නැහැ නේ ඒ මුදල් අපේ පළාත් සභා අරමුදලට බැර කරලා එවන්නය කියලා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ඒ ප්‍රඥප්තිය සංශෝධනය වෙන්න ඕනෑ. ප්‍රඥප්තියේ ඒ පැහැදිලි කිරීම් තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ප්‍රඥප්තිය හැදුවේ මෙතුමා නේ? එතුමාට ඒ බලතල තියෙනවා මම හිතන්නේ අවශ්‍ය විධියට ඒක -

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

මම කියන්නේ අපි ප්‍රඥප්තියට ඇතුළත් කළේ සමහර විට රේඛීය අමාත්‍යාංශයෙන් ප්‍රාදේශීය ලේකම්ට මේ බලය පවරලා තිබුණ එක අපි පළාත් සභාවක් හැටියට නාමිකව සංශෝධනය කර ගත්තා වුණත් බලය පිළිබඳ මට හරියට කියන්න බැහැ ඒ නීතිමය තත්ත්වය පිළිබඳව අමාත්‍යාංශ ලේකම් මාර්ගයෙන් හරි පැහැදිලි කිරීමක් කර ගෙන කටයුතු කරනවා නම් සුදුසුයි. නැත්නම් ඉදිරියේදී නඩුවකට ගියා නම් ගැටළුවක් මතු වෙන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, මේ ප්‍රඥප්තිය සම්මත කරන්න ඉස්සෙල්ලා මුදල් අය කිරීම සම්බන්ධයෙන් මීට පෙර බලය තිබුණේ කාටද? මීට පෙර බලය තිබුණේ අපේ පළාත් පාලන ආයතනයටද? සෞඛ්‍ය අමාත්‍යාංශයටද?

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

පළාත් පාලන ආයතනයට. ඒ අය දඩ මුදල් නියම කළේ, පළාත් පාලන ආයතනය යටතේ සම්මත වුණු පළාත් පාලන ව්‍යවස්ථාව අනුව. අපට බලය තිබුණේ නැහැ. අපි මේ ප්‍රඥප්තියෙන් තමයි බලය ලබා ගත්තේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, ඉස්සෙල්ලා හිටියා නාගරික මහේස්ත්‍රාත් කියල එක්කෙනෙක්. එයාට තියෙන නඩුවල ඔක්කෝම සල්ලි දෙන්නේ නගර සභාවට.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

දැන් උසාවි දඩ මුදල් ගෙවලා අපි ඒ මුදල් අරගෙන නැවත අපි පළාත් පාලන ආයතනයට දෙනවා, ඒ මුදල. උසාවි දඩ මුදල්

කියලා පළාත් සභාවෙන් ඒ මුදල් එකතු කරලා නැවත පළාත් පාලන ආයතනවලට දෙනවා ගරු සභාපතිතුමනි. දැන් මෙහිදී අපි පළාත් පාලන ආයතනවල තිබුණු නීති රීති යටතේ තමයි අපේ නිලධාරීනුත් ගිහිල්ලා අධිකරණයට මේ චූදිතයන් රැගෙන ගියේ. එතකොට එයින් ලැබෙන දඩ මුදල් සියල්ලම ගියේ නැවත පළාත් පාලන ආයතනවලට.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

නගර සභාවලින් එකතු කරන්න කට්ටිය දානවා. ඒක ආදි කාලේ නීතියකින් ඒක තිබුණේ.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

මොකද, අපි මේ ප්‍රඥප්තිය -

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ප්‍රඥප්තිය එන්න ඉස්සර.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ඉස්සර අපට තිබුණේ නැහැ නේ බලයක්? අපේ නීතියක් තිබුණේ නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, ඒක පළාත් සභාව සතු කර ගන්න බැහැ. රටේ නීතිය අනුව.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

මොකක්ද?

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

දැන් උසාවි දඩ මුදල පළාත් සභාව සතු කර ගන්න බැහැ. පළාත් සභාවට ආවාට ඒක ආපසු දිය යුතුයි. දැන් නගර සභාවකට නඩු කියන්න පුළුවන්. අපට අපේ සල්ලි දෙන්නේ නැහැ. අපටයි අයිතිය කියලා. ඒ නිසා මෙතුමා අහන්නේ-

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

මහජන පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තිය මේ පළාත් සභාව සම්මත කළාට පස්සේ ඇමතිවරයාට තියෙන බලතල අනුවයි මේ ප්‍රඥප්තිය ඉදිරිපත් කරන්නේ. පළාත් සභා ගිණුමට බැර කරන්න.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

බැහැ. පළාත් පාලන ආයතනවල බලය-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අදාළ අමාත්‍යවරයාගේ කැමැත්ත ගන්න ඕනෑ එහෙම නම්. ඔබතුමාට අදාළ ආයතනවලින්.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, මේ ප්‍රඥප්තිය මේ පළාත් සභාව සම්මත කළා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ප්‍රඥප්තිය සම්මත කළත්, දැනට ඒ වාගේ සාමාන්‍යයෙන් ගැටළුවක් මතු වෙලා තියෙනවා. අපේ ලේකම්තුමාත් දන්නවා. විගණනයේදී පළාත් පාලන ආයතනවල ගිණුම් පරීක්ෂා කිරීමේදී අපට දැන් ගැටලුවක් මතු වෙලා තියෙනවා. පළාත් පාලන ආයතනවල කටයුතු අපට කරන්න බැහැයි කියලා. පළාත් සභාවට ලබා දෙන මුදල් පවා අපට විගණනය කරගන්න අපහසුතාවයක් තියෙනවා. ඔවුන්ගේ ආදායමට මේ මුදල් ගිණුම්ගත කරපු නිසා. ඔවුන්ගේ ආදායමක් හැටියටයි යන්නේ. මෙහි නිතිමය ගැටළුවක් තියෙනවා. මේ ගැටළුව පිළිබඳව හරියට නීති උපදෙස් ලබා ගෙන කටයුතු කළොත් හොඳයි.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු සභාපතිතුමනි, විනාඩියක අවධානය යොමු කරන්න කැමතියි. මේ මහජන පීඩාව පනත ක්‍රියාත්මක කිරීමේදී අපේ යූසුෆ් ගරු මන්ත්‍රීතුමාගේත් අවධානය යොමු කරන්න කැමතියි. බේරුවල ආසනය තුළ බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක කරන වැඩ සටහන්වලදී නීතිය තුළ ක්‍රියාත්මක කිරීමට බැරි තත්ත්වයක් උදා වෙලා තියෙනවා. නීත්‍යානුකූලව බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් සිදු කරන මේ ව්‍යාපෘතිවලදී මේ ප්‍රඥප්තිය බේරුවල ආසනයේ ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයක් උදා වෙනවා. ඒකට හේතුව, ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනය හරහා තමයි එය ක්‍රියාත්මක වෙන්නේ. මම මේ සම්බන්ධව හැමදාම මේ සභාවේ කථා කරනවා. ඒ නිසා මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේදී බේරුවල ආසනයේ ක්‍රියාත්මක කරන්න පුළුවන් ආකාරයට මේ ප්‍රඥප්තිය සංශෝධනය කරන්න කියලා අපේ දුවිඩ ජනතාව වෙනුවෙන් මම ඉල්ලා සිටිනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මෙතැන මට පේනවා පුංචි හිරවීමක් වෙලා තියෙනවා. මට යූසුෆ් ගරු මන්ත්‍රීතුමාගේ තර්කය පොඩ්ඩක් පැහැදිලි මදී. කරුණාකරලා මම සමාව ඉල්ලා සිටිනවා ඔබතුමා නැවත පොඩ්ඩක් පැහැදිලි කරන්න කියලා.

**ගරු ඒ.එම්. යුසුප්**
Hon. A M Yoosuf

මට සමාව අවශ්‍ය නැහැ. අපි මේ නීතිමය තත්ත්වය පිළිබඳව කථා කරමින් තමා කරන්නේ. පළාත් සභාවක් හැටියට අපි කාගේත් වගකීමක් තියෙනවා මේක නිවැරදි කරන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල – අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

සෞඛ්‍ය කාර්යාලයට ගන්න බැහැයි කියලා ඔබතුමා කියන එකේ පදනම මොකක්ද?

**ගරු ඒ.එම්. යුසුප්**
Hon. A M Yoosuf

පළාත් පාලන ආඥා පනත හැටියට බස්නාහිර පළාත් සභාවලට පළාත් පාලන ආයතනවල බලය ලබා ගන්න බැහැ. සංශෝධනය කරන්න බැහැ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල – අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

මොකක්ද පළාත් පාලන ආයතනයක බලය?

**ගරු ඒ.එම්. යුසුප්**
Hon. A M Yoosuf

පළාත් පාලන ආයතන විශේෂ පනතක් තියෙනවා නේ?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල – අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, අපේ ජනාධිපති නීතිඥ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත් ඉන්නවා. පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ව්‍යුහය සහ මැතිවරණ ක්‍රියා පටිපාටිය යන සීමිත කාරණා තුනක් හැරුනු විට පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් සියලුම බලතල තියෙන්නේ, පළාත් සභාවට. අපේ ප්‍රඥප්තිවලින් ඒ පළාත් පාලන ආඥා පනතේ තියෙන ඕනෑම දෙයක් වෙනස් කරන්න පුළුවන්. ව්‍යවස්ථාවේ සඳහන් කරලා තියෙන කාරණා තුනක්. ව්‍යුහය එකක්. තව දෙකක් තිබුණා. මම බලලා කියන්නම්. ඒ ඇරුණු කොට. ඒ නිසා තමයි මධ්‍යම ආණ්ඩුවට ඕනෑ වුණාම පළාත් පාලන මැතිවරණ පනතයි, පළාත් පාලන ආඥා පනතයි සංශෝධනය කරන්න, අපේ අදහස් විමසන්න මෙහේට එවනවා. ඒක අපේ බලය. එතකොට අපේ පළාත් සභාවලට සම්පූර්ණ බලය තියෙනවා, දැන් තියෙන මහා නගර සභා ආඥා පනත, නගර සභා පනත, ප්‍රාදේශීය සභා පනත ඕනෑම ආකාරයකට සංශෝධනය කරන්න. පළාත් නවය අතර එකිනෙකට වෙනස් රීති තිබුණාම ඇති වන අර්බුදත් එක්ක අපි ජාතික මට්ටමෙන් පළාත් සභාවල එකහතාවය ඉල්ලලා පාර්ලිමේන්තුවෙන් කරනවා. නමුත් පළාත් සභාවට සම්පූර්ණ බලය තියෙනවා, ඒකට පටහැනි වෙන දෙයක් කරන්න. ඒකට කිසිම නීතිමය බාධාවක් නැහැ. පළාත් පාලන ආයතන කියන්නේ පළාත් සභා විෂයයක්. ඒ නිසා එය අපේ ප්‍රඥප්තිය හරහා වෙනස් කරන්න පුළුවන්. වෙනස් කරන්න බැරි කාරණා තුනයි. මම ඒ කාරණා තුන බලලා කියන්නම් මොකක්ද කියලා. ඒකට මෙය අයිති වෙන්නේ නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල – විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, පළාත් පාලන ආයතන පනත වෙනමම රාමුවකින් හැදුනු පනතක්. ඒකේ තියෙන බලය භාවිත කරන්න බැහැ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල – අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඔබතුමා කියන්න මොකක්ද පදනම?

**ගරු මංජු ශ්‍රී අරංගල – විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

පළාත් පාලන පනත අනුව.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල – අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු මන්ත්‍රීතුමා, පළාත් පාලනය පිළිබඳව අපේ ජනාධිපති නීතිඥතුමාගෙන් අහන්න පොඩ්ඩක්. ඒ කියන්නේ මෙය පළාත් සභා විෂයයක් නම්, 9 වැනි උප ලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ නම් තියෙන්නේ, පළාත් සභාවට මධ්‍යම ආණ්ඩුවෙන් වෙන කාගෙන්වත් අහන්නේ නැතුව පළාත් සභාවේ සාමාන්‍ය බහුතරයෙන් සම්මත වෙන ප්‍රඥප්තියකින් ඒ බලය ඕනෑ දෙයක් වෙනස් කරන්න පුළුවන්.

**ගරු මංජු ශ්‍රී අරංගල – විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ නැහැ. පාර්ලිමේන්තුවෙන් විතරයි ඒ බලය වෙනස් කරන්න පුළුවන්. පළාත් පාලන පනතේ තියෙන බලයක් සම්බන්ධව.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල – අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේත් ඉතා පැහැදිලිව කියනවා. ඇයි බැරි කියලා ඔබතුමා වගන්තිය උපුටා දක්වන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල – විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මා ගාව මෙතැන නැහැ පළාත් පාලන පනත. මම ඒක අරගෙන ඇවිල්ලා –

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල – අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. ව්‍යවස්ථාව හැටියට-

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ. නැහැ. ව්‍යවස්ථාව වෙනයි. පනත වෙනයි.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, ඒකයි මම පැහැදිලිව කිව්වේ. දැනටමත් පළාත් සභාවලට නීතිපතිවරයා විසින් නියෝග නිකුත් කරලා තියෙනවා. පැහැදිලි තීන්දුවක් දීලා තියෙනවා. පළාත් පාලන ආයතනවල විගණනය සම්බන්ධව -

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මට මේ කාරණය හම්බ වුණා. මට මේක පැහැදිලි කර දෙන්න පුළුවන්. එතකොට මේ විවාදය ඉවර කරන්න පුළුවන්. 9 වන උප ලේඛනයේ පළමුවැනි ලැයිස්තුවේ තියෙන පළාත් සභා ලැයිස්තුවේ හතරවන විෂය පළාත් පාලනය. ඒක විස්තර කරන්නේ, පළාත් පාලන ආයතනවල සංයුතිය, ස්වරූපය හා ව්‍යුහය. නීතියෙන් නියම කළ යුතුය යන ව්‍යතිරේඛයට යටත්ව පළාත් පාලන සහ ග්‍රාම පරිපාලන කාර්ය සඳහා මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වැනි පළාත් පාලන ආයතන. අර කාරණා තුන කරන්න පුළුවන් පාර්ලිමේන්තුවට. මේක පළාත් සභා විෂයයක් කියන්නේ, පළාත් සභාවේ සම්මත කරන ප්‍රඥප්තියකින් අනෙක් ඕනෑම දෙයක් වෙනස් කරන්න පුළුවන්. මම හිතන්නේ, ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා වැඩිදුර අදහස් දක්වයි. අපේ මේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ තියෙනවා ගරු සභාපතිතුමනි, පළාත් සභා පිහිටුවන්න කලින් ඒ කියන්නේ, 1988 නොවැම්බර් 04 වැනිදාට කලින්, 13 වැනි සංශෝධනය ගේන්න කලින් ගෙනාපු පළාත් සභා විෂයට අයිති පනතක්, ආඥා පනතක් තියෙනවා නම්, ඒක අපේ ප්‍රඥප්තියකින් සංශෝධනය වෙනවා නම්, පටහැනි වෙනවා නම් ඒ තාක් දුරට මධ්‍යම ආණ්ඩුවෙන් සම්මත කරපු ආඥා පනත හරි පනත හරි බල රහිත වෙනවා. ඒ පළාත තුළට පමණක් මධ්‍යම ආණ්ඩුවේ නීතිය බල රහිත වෙනවා කියන එක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉතා පැහැදිලිව සඳහන් කරලා තියෙනවා. මම හිතන්නේ අපේ ජනාධිපති නීතිඥතුමා මේකට එකඟ වෙනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, මම නීතිමය තර්කය නොවෙයි ඉදිරිපත් කරන්නේ. ගරු සභාපතිතුමනි මේ කාරණාව මතු කළේ, නීතිමය වශයෙන් ඉදිරියේදී යම් කිසි විධියකින් අපට බලපාන - මෙතුමා ඉදිරිපත් කළා ගොවිජන සේවා අධිකාරි පනතක්. අපට එතැන්දි නිහඬව ඉන්න සිද්ධ වුණා. 13 වැනි සංශෝධනයේ තියෙනවා. ඒ වාගේ තමයි දැනට නීතිපති දෙපාර්තමේන්තුව විසින් දීලා තියෙනවා, අපේ නීති නිලධාරි පාලිත මහත්මයාත් එහා පැත්තේ ඉන්නවා. දැනට අපි සාකච්ඡා කර ගෙන යනවා, ඒක සංශෝධනය කරන්න. අද සංශෝධනය කරන්න බැරි තත්ත්වයට හිර වෙලා තියෙනවා. ඒ නිසා මූල්‍යමය තත්ත්වයේදී විශේෂයෙන්ම පළාත් පාලන ආයතනයේ බලයක් අපට කොහෙත්ම පවරා ගන්න බැහැ. ඒ නිසා මූල්‍යමය තත්ත්වය නීතිපතිවරයා දැනටමත් සභාවට දැනුම් දීම් කරලා තියෙනවා. විගණනය විසින් කරන්නා වූ ඡේදයන් පිළිබඳව අපට වාද විවාද කරලා ඔවුන්ට නියෝගයන් නිකුත් කරන්න බැහැ. පරිපාලනමය වශයෙන් යම් යම් දේවල් - මෙතැන්දි මම ඉල්ලීමක් කරනවා. අපි විරුද්ධ නැහැ. සම්පූර්ණයෙන් අපි සහයෝගය දෙනවා. ගැටලුවක් නැතුව නීතිමය උපදෙස් ලබා ගෙන මේ කටයුත්ත කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ කාරණයේදී මම දන්නේ නැහැ. නීතිය පිළිබඳ සිද්ධාන්ත ඇතුළත් කාරණා කියන්න මට තාර්කීය දැනුමක් නැහැ. මගේ අවබෝධය විධියට මම දන්නා විධියට විශේෂයෙන්ම පළාත් පාලනය පිළිබඳව අපි හදාරලා තියෙන දැනුමේ අවබෝධය හැටියට පළාත් පාලන ආයතනයකට අයිති විෂයයක් යම්කිසි විධියකින් කිසිම ආයනයකට පවරා ගන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. මොකද, නීතිමය බැඳීමක් තියෙන ස්වාධීන ආයතනයක් විධියට තමයි ස්ථාපනය වෙලා තියෙන්නේ. ගරු ඇමතිතුමා කියන එක ඇත්ත. එහි ව්‍යුහය, මහජන සංයුතිය පිළිබඳව පාර්ලිමේන්තුවෙන් වෙන් වෙන්න පුළුවන්. උදාහරණයක් විධියට දිවිනැගුම පනත ක්‍රියාත්මක වෙන වෙලාවේදී මේකේ තියෙනවා ග්‍රාමීය පොළවල්. ආරම්භ කිරීම, සංවර්ධනය කිරීම හා පවත්වා ගෙන යාම. ඒක පළාත් සභාවෙන් අහන්න කිව්වේ, ඒ පළාත් පාලන ආයතනවල තියෙන විෂයයක් තමයි මධ්‍යම ආණ්ඩුව ගන්න හදන්නේ. ඒ නිසා මම හිතන්නේ පළාත් පාලන ආයතන පනත අනුව, මගේ දැනුමේ විධියට පළාත් පාලන ආයතනයේ තියෙන බලයක් ගැනීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනයක් නීතිමය පැත්තෙන් නඩුවකට ගියොත් මම හිතන්නේ ඒ බලය ගන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. අපි පරාදයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, මම හිතන්නේ, ඒ සම්බන්ධව දිගින් දිගටම මෙය විවාදයට ලක් වුණා. මේ ප්‍රඥප්තිය දැන් සම්මත වෙලා තියෙන්නේ. සම්මත වුණු කාරණාවක් වෙනස් කරන්න බැහැ.

**ගරු ජගත් අංගගේ -** අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, මේ ප්‍රඥප්තිය සම්මත වෙලා තියෙනවා. අපට සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ දැනගැනීමට කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් ප්‍රඥප්තිය සංශෝධනය කරන්න ගරු ඇමතිතුමා. මෙතැන කරන්නේ රීති නේ ගරු ඇමතිතුමා. එහෙම නම් අපි වෙනම යමු.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 21 පිට 4 (3)

*"පවත්නා නීතිය යටතේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති බලතල ඒ ආයතනවලට තිබෙන්නේය. මහ නගර සභා ආඥා පනත සහ නගර සභා ආඥා පනත යටතේ මහ නගර සභා සහ නගර සභාවලට පැවරී ඇති බලතල ඒ ආයතනවලට තිබෙන්නේය. පවත්නා නීතිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රාදේශිය සභාවලට තිබෙන්නේය. පළාත් සභාවක් විසින් පළාත් පාලන ආයතන වෙත අතිරේක බලතල පවරා දීම කළ හැක්කේය. එහෙත් එකී සභාවල බලතල අහිමි කිරීමට පළාත් සභාවට කළ නොහැක්කේය."*

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

අහිමි කිරීමක් කරන්නේ නැහැ නේ? මොකක්ද අහිමි කරන බලය.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම කියන්නේ, ගරු සභාපතිතුමනි-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතැන තියෙන්නේ ගරු ඇමතිතුමා, පළාත් පාලන නොවෙයි. මෙතැන තියෙන්නේ ප්‍රාදේශිය ලේකම්. පළාත් පාලන ආයතන සම්බන්ධ වන්නේ නැහැ මෙතැන්ට.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේකේ කියන්නේ, දැන් යුසුෆ් ගරු මන්ත්‍රීතුමා කිව්වේ දිගින් දිගටම ප්‍රාදේශිය ලේකම්වරයාට මේකේ වගකීම යන පැත්තක් ගැන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වෙනස් කරන්න බැහැ දැන් අපට.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මට පේන්නේ ලොකු පැටලිල්ලක ඉන්නේ. පළමුවැනියෙන්ම බලන්න ඕනෑ, පළාත් පාලන ආයතනයක යම් බලයක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමතිතුමා, ඔබතුමා කියන කාරණය මෙතැන්ට අදාළ වෙන්නේ නැහැ. මෙතැන්ට අදාළ වන්නේ නැහැ. අපි මේ අනවශ්‍ය ප්‍රශ්නයකට යන්නේ. ඔබතුමාගේ ප්‍රඥප්තිය සසඳන්න බැහැ එක පාරට අපට දැන්. ප්‍රාදේශිය ලේකම් කියන එක දැන් අපට වෙනස් කරන්න බැහැ. ඒකට වෙනම සංශෝධන ගේන්න ඕනෑ.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

මම මේ සඳහන් කරන්නේ, මේ උප ලේඛනයේ සඳහන් වන වචනය සම්බන්ධයෙන්. ඒක ප්‍රඥප්තියේ තියෙන්නේ. මම පිළිගන්නවා. සම්මත වෙලා තියෙන ප්‍රඥප්තියේ තියෙන වචනයක්. මම ඒක සංශෝධනයට යටත් කිරීම සඳහා යෝජනා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යෝජනා කරන්නේ ගරු ඇමතිතුමා -

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

සභාවේ එකඟතාවය තියෙනවා නම් ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කරලා සංශෝධනයක් හැටියට මෙය ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියලා මම අහන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද සාකච්ඡාවට බඳුන් වුණේ ඇමතිතුමා රීති සම්බන්ධව. ප්‍රඥප්තිය නොවෙයි නේ ඇමතිතුමා?

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ප්‍රඥප්තිය සංශෝධනය කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි දැන් සාකච්ඡා කළේ රීති සම්බන්ධව ඇමතිතුමා. ප්‍රඥප්තිය සම්බන්ධව නොවෙයි. අපි වෙන දවසක් යොදා ගෙන එදාට එතැන්ට ගේන්න ඕනෑ.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, මේ රීති ටික අපි ගැසට් කරලා තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව් ඒක අපි පිළිගන්නවා.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

ඒ ගැසට් කරපු රීතියේ මෙතැන ප්‍රාදේශිය ලේකම් කියන වචනය සඳහන් වෙලා තියෙනවා. මේ කියන කථාව මම පිළිගන්නවා. මේක ප්‍රඥප්තියෙන් සම්මත වෙලා තියෙනවයි කියන කාරණාව. මේ තියෙන බාධාව කිසිසේත්ම ඇති වන්නේ නැහැ. මම මේ පැහැදිලිව කියන්නේ ඒකයි. මේ පළාත් සභාව සෞඛ්‍ය පීඩාව පිළිබඳව කලින් මෙවැනි වූ නීති රීති සකස් කරලා තිබුණේ නැහැ. පළාත් පාලන ආයතනවලටත් මේ පිළිබඳව යම් කොටසක බලයක් තියෙනවා. පොලීසියටත් තියෙනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමා, සභාපතිතුමාට පැහැදිලි කරන්න ඕනෑ කාරණයට ඔබතුමා උත්තර දෙන්න. එතුමා අහන්නේ, ඔබතුමාගෙන් ප්‍රාදේශීය ලේකම්තුමාට ප්‍රඥප්තියෙන් දුන්න බලයක් රීතිවලින් ඉවත් කරන්න යනවාද? නැද්ද? අන්න ඒක පැහැදිලිව කියන්න ඔබතුමා.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

ප්‍රඥප්තියේ ප්‍රාදේශීය ලේකම් කියා සඳහන් වෙලා තියෙද්දි - ඇමතිතුමා මතු කළ එක හරි.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

ඒක මම පිළිගන්නවා. ප්‍රඥප්තියේ පැහැදිලිව සඳහන් වෙලා තියෙනවා -

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

ප්‍රඥප්තිය අපි සංශෝධනය කරමු. එච්චරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක කරන්න ඕනෑ ගරු ඇමතිතුමා.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, දැන් මේ සම්මත කරන රීති බේරුවල නගර සභා සීමාවට අදාළ වන්නේ නැහැ. මෙතුමාට බාධාවක් නැහැ ප්‍රඥප්තියේ ඒ වගන්තිය සංශෝධනය කරලා මෙතැනදි රීතිය සංශෝධනය කරන්න. ගැටළුවක් වෙන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මම මේක සම්පූර්ණයෙන් අධ්‍යයනයක් කරලා නැති නිසා සමා වෙන්න මම මතයක් ප්‍රකාශ කරන්න යනවා, අවසානයේ කරපු කාරණය සම්බන්ධව. මම හිතන්නේ, මම එකඟ වෙනවා මෙන්න මේ කාරණයත් එක්ක. ප්‍රඥප්තිය රීති මගින් වෙනස් කරන්න බැහැ. අපි නීතිගත කරන රීති සියල්ලම අපි ක්‍රියාත්මක කළ ප්‍රඥප්තියේ සීමාවන් ඇතුළත වෙන්න ඕනෑ. ඒ නිසා මම දකින හැටියට ප්‍රඥප්තිය සංශෝධනය විය නොහැකියි රීති මගින්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක පැහැදිලියි නේ ඇමතිතුමා?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

සියයට සියයක්ම ඔබතුමාත් එක්ක ඉන්නේ. ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් අහන්නේ ප්‍රඥප්තියේ කොතැනද ඕක තියෙන්නේ?

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

ඇමතිතුමා තමයි කිව්වේ, ප්‍රඥප්තියේ ප්‍රාදේශීය ලේකම් කියලා තියෙනවයි කියලා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

එහෙම එකක් පේන්න නැහැ. මෙතුමා කියනවා දැන් තමයි පටන් ගන්නේ කියලා. එහෙනම් ප්‍රාදේශීය ලේකම් කියලා තියෙන්න බැහැ නේ? දඬ මුදලක් මීට කලින් තිබුණේ නැහැ. දැන් තමයි හඳුන්වා දෙන්නේ. මේ උපකල්පනයක ඉඳන් අපි කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේකේ බොහොම සරල කාරණාවක් තියෙන්නේ. පුංචි පැහැදිලි කිරීමක් තියෙන්නේ. ලොකු දෙයක් නොවෙයි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අපි මේ අහන්නේ අදාළ ඇමතිතුමා කියන කාරණය. ගම්මන්පිල ඇමතිතුමා කියන කාරණාව නොවෙයි අපි අහගෙන ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් එච්චර දුර යන ප්‍රශ්නයක් නොවෙයි මේක. ගරු ඇමතිතුමා, ඔබතුමා පැහැදිලිව කියන්න. මේ ප්‍රඥප්තියේ සංශෝධනයක් කරන්න එකපාරටම ඔබතුමාට බලය නැහැ නේ දැන් ? රීතිවල නැහැ නේ?

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

සමාවෙන්න. ප්‍රඥප්තියේ මේ උපලේඛන සඳහන් කරලා නැහැ. ප්‍රඥප්තියේ ව්‍යුහාත්මක නීති රීති සම්පාදනය කරලා තියෙනවා. ඊට පස්සේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ අනෙකුත් නිලධාරීන් ප්‍රජාව සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී තමයි මේ දඩ මුදල් අය කිරීම් සහ ඒ කටයුතු කෙරෙන්නේ. එතකොට අපි ගැසට් කරපු රීතිවලයි මෙය සඳහන් වන්නේ. මේ රීතිවල සඳහන් වෙලා තියෙනවා. මම ඔබතුමාලාට රීති ඉදිරිපත් කරන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමතිතුමා, රීති ගැසට් කරලා තිබුණාට ප්‍රඥප්තියේ ඒක සංශෝධනය කරන්න බැහැ නේ? රීති නැහැ නේ ඒවාට.

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

රීති ගැසට් කරලා තියෙනවා.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

රීති පනවන්නේත් ප්‍රඥප්තිය අනුව නේ?

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

හරි. ප්‍රඥප්තියේ ඒක ප්‍රාදේශීය ලේකම් –

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

මේක කල් තියලා අලුත් ප්‍රඥප්තියත් බලල ඉවර වෙලා කරමු. අපි විරුද්ධතාවයක් නැහැ නේ? කල් දාලා ශුද්ධ කර ගෙන වැඩේ කරන්න. එතකොට වැඩේ ඉවරයි නේ? ඔබතුමාගෙන් පස්සේ වෙනත් ඇමතිවරයෙක් ආවත් කවදා හරි ඔය ප්‍රශ්නෙ –

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** – අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

කරණය පැහැදිලියි. ප්‍රඥප්තියේ රීති සංශෝධනය කරන්න බැහැ.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

ඒකයි අපි කියන්නේත්. අපි ලබන වාරයට කල් තියමු.

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

කල් තියන්න එපා. මේක ලොකු ප්‍රශ්නයක්. දෙවන වතාවට මේක කල් දාන්නේ. කල් දාන එකෙන් රටේ මිනිස්සු මැරෙනවා. මම වගකීමෙන් ප්‍රකාශ කරනවා. ප්‍රඥප්තියේ නොවෙයි. ගැසට් කරපු රීතිවලයි තියෙන්නේ. මේක ලේකම්තුමා පරිශීලනය කළාද දන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, මෙහෙම කරමුද අපි?

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ප්‍රඥප්තියේ නැහැ. එහෙනම් ප්‍රඥප්තියේ නැත්නම් රීතිවල තියෙනවා. මේ සභාවේ අපට රීති සංශෝධනය කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රඥප්තියේ කොහේද තියෙන්නේ ඇමතිතුමා.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

නැහැයි කියල තහවුරුවක් දෙනවා නම් අපි එකඟ වෙන්නම්. (බාධා කිරීම්)

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** – අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

මනුස්ස ජීවිතයට වඩා රීතිය ලොකුයි.

**ගරු මංජු ශ්‍රී අරංගල** – විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

තමුන්නාන්සේලා විතර රීති අල්ලා ගෙන – දැන් මොකක් හරි වුණාම කියනවා ඒකේ අනෙක් පැත්ත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු අමාත්‍යතුමා, අපි දැන් මෙහෙම කරමු. මටත් තේරෙනවා ඔබතුමාට අතිශය වැදගත් මේ රීති සම්මත කරන එක. ඔබතුමාට යම් පැටලීමක් වුණා.

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ඒක නිවැරදි කර ගන්න. මම කියන්නේ ඒකයි. මට පැටලීමක් වුණේ. මේක ප්‍රඥප්තියට අදාළයි කියන එක. ප්‍රඥප්තිය නොවෙයි අපට අත්‍යවශ්‍ය. ගැසට් කර තියෙන රීති.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රඥප්තියෙත් තියෙනවා නම් ගැටළුවක් නැහැ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, ප්‍රඥප්තියේ තියෙනවා. ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ 2 උප වගන්තියේ කියනවා "6.1 හි සඳහන් ස්ථානයේ දඩ මුදල බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලදුපතක් ලබා ගත යුතු අතර, එම ලදුපත දින 10 ක් ඇතුළත එම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ කිරීම අතපසු කරන්නේ නම් ඔහුට විරුද්ධව මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ චෝදනා ගොනු කර නඩු පැවරීම නීත්‍යානුකූල වන්නේය." මෙය තියෙන්නේ ප්‍රඥප්තියේ. ප්‍රඥප්තියේ එහෙම තියෙනවා නම් රීතිවලින් ඒක වෙනස් කරන්න බැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේ ඇමතිතුමා ප්‍රඥප්තියේ තියෙන කාරණාව තමයි මතු කළේ. එතුමාටම මතක නැති වුණා අවසානයේ මෙය ප්‍රඥප්තියේ තියෙන කාරණයක්ද? රීතිවල තියෙන කාරණයක්ද කියලා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ප්‍රඥප්තියේම තියෙනවා. ඒක සංශෝධනය කරන්න බැහැ රීතිවලින්. එහෙනම් ප්‍රඥප්ති සංශෝධනයක්ම ගේන්න ඕනෑ. නමුත් දැන් වැදගත් වන්නේ ලෙඩ්ඩු මැරෙන එක නම්, දඩ මුදල ගෙවන්නේ ප්‍රාදේශීය ලේකම්ට - ඇත්ත වශයෙන්ම ප්‍රාදේශීය ලේකම් වෙනුවට සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයට ගෙව්වාම අපට හොඳයි. මධ්‍යම ආණ්ඩුවට නොවෙයි. පළාත් සභාවට ආදායම එනවා. නමුත් දැන් ආදායම එන තැන ප්‍රශ්න කර ගන්නේ නැතුව ලෙඩ්ඩු මැරෙන එක නතර කර ගන්න දඩය ගහගන්න නම් ඕනෑ. අපි දැන් තියෙන නීතියට දඩය ගහමු. පසුව රීතිය වෙනස් කර ගනිමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමතිතුමා, ගැටළුවකුත් නැහැ නේ? ඔය යන ක්‍රමයට යමු. ප්‍රාදේශීය ලේකම්ට මුදල් ටික ගෙවනවා. පසුව M.O.H ට යනවා දඩ මුදල් ටික. අපි මෙහෙම යමු ඇමතිතුමා. නැත්නම් මේක තවත් කාලයක් යනවා.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

අපි එහෙම කරලා. ඊළඟ මාසේ සංශෝධනයක් ඉදිරිපත් කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි සංශෝධනයට යටත්ව ඔබතුමා ඉදිරිපත් කරන්න. ගරු ඇමතිතුමා ඔබතුමා ඉදිරිපත් කරන්න ඒක.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

6 වැනි උපලේඛනය සංශෝධනය කරන්නේ නැතුව දැනට තියෙන විධියට යමු.

නමුත් දැන් ප්‍රශ්න කර ගන්නේ නැතුව ලෙඩ්ඩු මැරෙන එක නතර කර ගන්න දඩය ගහ ගන්න නම් ඕනෑ අපි දැන් තියෙන නීතියට දඩය ගහමු. පසුව රීතිය වෙනස් කර ගනිමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමතිතුමා, මේ ප්‍රශ්නයේ ගැටළුවකුත් නැහැ නේ? අපි යන ක්‍රමයට යමු. ප්‍රාදේශීය කාර්යාලයට මුදල් ටික ගෙවනවා. පසුව අදාළ මුදල් ටික M.O.H එකට යවනවා. අපි මෙහෙම යමු. නැත්නම් තවත් කාලයක් යනවා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, හතර A කොටසේ මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී යනුවෙන් සඳහන් වෙලා තියෙන කොටස මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශය යනුවෙන් සංශෝධනය වෙන්න ඕනෑ. මහජන සෞඛ්‍ය පීඩා කියන කොටස යටතේ. 4 A . 11, 12, 13 - 10, 13 මහජන සෞඛ්‍ය පීඩා යටතේ. එතැන තියෙනවා, අයිතිකරු, පදිංචිකරු, භාරකරුගේ නම, ගෘහ මූලික අංකය, ලිපිනය, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය. ඊළඟට මහජන සෞඛ්‍ය නිලධාරී කොට්ඨාශය කියල තියෙන්නේ. ඒක සෞඛ්‍ය වෛද්‍ය කොට්ඨාශය. ඊට යටින් මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශය යනුවෙන් සංශෝධනය වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමතිතුමා, පොඩ්ඩක් අපැහැදිලියි ඒ කාරණාව. අපි හොයා ගන්නම්.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

10 ප්‍රඥප්තියේ, 9 (2) උප වගන්තිය යටතේ ගෙවීමට නියම කළ මුදල් පිළිබඳ විස්තර 9 (3) උප වගන්තිය යටතේ අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා නිසි බලධාරියා විසින් සකස් කරන

සහතිකයක් ආකෘති 7 උපලේඛනයේ සඳහන් ආකෘතිය යනුවෙන් විය යුතුයි කියලා. ඒකේ 1, 2, 3, 4 වශයෙන් සඳහන් කරලා තියෙනවා.

**ගරු ඒ.එම්. යූසුප්**
Hon. A M Yoosuf

රාජ්‍ය ආයතන, පළාත් පාලන ආයතන ඒකත් මෙතැනට එකතු වෙන්න ඕනෑ.

***අනතුරුව, ප්‍රශ්නය සංශෝධිකාරයෙන් විමසන ලදින් සභා සම්මත විය.***
*Subsequently, having raised the question in the amended form, it was adopted.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2012 අංක .......... දරණ මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ රීතීන් සඳහා බස්නාහිර පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීම පිළිබඳ සාකච්ඡාව මෙයින් අවසන් වෙනවා. මේ අවස්ථාවේදී ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සංශෝධනත් ඉදිරිපත් කරලා තිබුණා. ඒ සංශෝධනත්, මේ අවස්ථාවේදී ඉදිරිපත් වූ සභාව එකඟ වූ සංශෝධනත් ඇතුළත් කරලා ඒ රීතීන් සභා සම්මත වූ බවට මම මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

න්‍යාය පත්‍රය අනුව තවත් යෝජනා තියෙනවා. නමුත් කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. එම යෝජනාවට පැයක් වෙන් කරලා තිබෙනවා. නමුත් දැන් වේලාව පස්වරු 01.00 යි. ඒ නිසා එම යෝජනාව ඊළඟ සභාවට කල් තබනවා. ඒ අනුව අද දිනට නියමිත න්‍යාය පත්‍රයේ වැඩ කටයුතු මෙයින් අවසන් වෙනවා. දැන් මෙම සභාව කල් තබන යෝජනාව කරන්න කියලා මම ගරු අමාත්‍යතුමාට යෝජනා කර සිටිනවා.

## කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, *"මෙම සභාව කල් තැබිය යුතු යැයි "* මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.00 ට, 2013 පෙබරවාරි මස 19 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 01.00 p..m till 09.30 a.m, on 19.02.2013.*